ඉරිදා දිවයින පුවත්පතේ පළවූ ආන්දෝලනාත්මක භාවනා ලිපි පෙළ

## භාවනාව සහ මාර්ගඵල

පිළිබඳ නිවැරදි විස්තර ඇතුළත් අත්පොත

# සම්මා සමාධි

නීතිඥ නිලන්ත හෙට්ටිගේ

Scanned with CamScanner

2

ඉරිදා දිවයින පුවත්පතේ පළ වූ ආන්දෝලනාත්මක භාවනා ලිපිපෙළ

# සම්මා සමාධි

භාවනාව හා මාර්ගඵල පිළිබඳ නිවැරදි විස්තර ඇතුළත් අත්පොත

CS Scanned with CamScanner

## කර්තෘගේ වෙනත් කෘතීන්

### බෞද්ධ ග්‍රන්ථ

01. භාවනාව සහ ආධ්‍යාත්මික දියුණුවේ රහස්
02. උසස් භාවනාව සහ අධිමානසික බලය
03. සමාධිය සහ ප්‍රඥාව වඩන ආනාපාන සති භාවනාව
04. භාවනාව මිනිස් සිත සහ නිවන
05. භාවනාව කුණ්ඩලිනී බලය සහ අධිමානසික විද්‍යාවේ රහස්
06. භාවනා රහස්
07. ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ භාවනාව
08. භාවනා උපදෙස් සහ සත්‍යාවබෝධයට නොවරදින මග
09. භාවනාව සහ චිත්ත ශක්තිය
10. භාවනාව යෝග සහ චිත්ත ශක්තිය
11. සතිපට්ඨාන භාවනාව සහ නිවන් මග
12. භාවනා උපදේශ සංග්‍රහය
13. භාවනා අභ්‍යාස සහ සත්‍යාවබෝධය
14. අධිමානසික විද්‍යාවේ හාස්කම්
15. බෞද්ධ භාවනා සහ මාර්ගඵල
16. විදර්ශනා භාවනාව සහ ධර්මාවබෝධය
17. අභිධර්ම ප්‍රවේශය
18. සදහම් සයුර
19. විදර්ශනා මාර්ගය
20. සෝවාන් මාර්ගය සහ සෝවාන් ඵලය
21. නුවණ වඩන බණකතා
22. භාවනාවේ හාස්කම්
23. ජීවිතය මරණය සහ පුනරුත්පත්තිය
24. භාවනා පුහුණුව
25. භාවනාව ධ්‍යාන සහ මාර්ගඵල විනිශ්චය
26. භාවනාවේ ආශ්චර්යය
27. සතරමග සතරපල
28. ප්‍රායෝගික විදර්ශනා භාවනාව
29. භාවනා මාර්ගය
30. භාවනාවේ විස්මිත රහස්
31. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සහ අක්ෂෝභ්‍ය තන්ත්‍රය
32. භාවනාවේ දිව්‍යමය රහස්
33. ධර්ම විනිශ්චය
34. කසිණ භාවනා රහස්
35. භාවනාවේ අනුහස්
36. සදහම් කැටපත
37. භාවනා අත්පොත
38. විපස්සනා භාවනාව
39. සදහම් සරණ
40. යෝග විද්‍යාවේ රහස්
41. බුද්ධානුස්සති භාවනාව
42. වජ්‍රසත්ව සූත්‍ර නිර්දේශය
43. භාවනාවේ ස්වර්ණමය රහස්
44. සසර ගමන සහ සෝවාන්ඵලය
45. බෞද්ධයාගේ භාවනා අත්පොත
46. භාවනාව සහ කුණ්ඩලිනී බලය
47. භාවනාව සහ අධිමානසික හැකියාව
48. සතිපට්ඨාන භාවනාව
49. යෝග විද්‍යා අත්පොත
50. මරණින් මතු ජීවිතය
51. භාවනාවේ ප්‍රවීණයකු වන මග
52. විමුක්ති මාර්ගය
53. විසුද්ධි මාර්ගය
54. සම්මා විමුක්ති
55. අසිරිමත් ටිබෙට් බුදුදහම
56. මහායෝගීන්ගේ භාවනා රහස්
57. මහා යෝගී පද්මසම්භව
58. සුවය සහ බලය ගෙනදෙන යෝග හා භාවනා ක්‍රම
59. ආනාපානසති භාවනාව
60. කසිණ භාවනා අත්පොත
61. ටිබෙට් භාවනා අත්පොත
62. භාවනාව සහ සුව කිරීමේ බලය
63. භාවනාවේ විස්මිත රහස්
64. භාවනාව සහ විස්මිත සුවකිරීම්
65. භාවනාව මුල සිට සරලව

### මනෝවිද්‍යාව සහ දාර්ශනික මතවාද

66. ජීවිතයේ දියුණුවට දාර්ශනික රහස්
67. දියුණුව සහ ජයග්‍රහණය ගෙන දෙන ස්වර්ණමය රහස්
68. ධනය බලය සහ දියුණුව පිළිබඳ මනෝවිද්‍යාත්මක රහස්
69. සුපිරි මනස සහ සුපිරි බලය
70. එදිනෙදා ජීවිතයට අධිමානසික විද්‍යාව
71. ජීවිතයේ සාර්ථකත්වය සඳහා විස්මිත රහස්
72. ධනවත් වීමේ රහස්

### භාෂා අධ්‍යයනය

73. ඉංග්‍රීසියෙන් ලිපි ලේඛන සැකසීම
74. ප්‍රායෝගික ඉංග්‍රීසි කථනය
75. ඉංග්‍රීසි යෙදුම් අත්පොත

CS Scanned with CamScanner

76. ඉංග්‍රීසි ව්‍යාකරණ අත්පොත
77. ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණයකු වන මග

## නීතිය

75. අපරාධ නීතිය
79. පොදුජන නීති අත්පොත
80. ඉඩම් නීතිය
81. විවාහය සහ නීතිය
82. ජීවිතය සහ නීතිය
83. ඔබට බලපාන නීතිය
84. නීතිය යුක්තිය සහ අධිකරණය
85. නීතිය සහ නීතියේ ක්‍රියාකාරිත්වය
86. ශ්‍රී ලංකාවේ නීතිය සහ අධිකරණ ක්‍රමය
87. සාක්ෂි නීතිය සහ නඩු ඇසීමේ ක්‍රියාවලිය
88. එදිනෙදා ජීවිතයේ නීති ගැටලු
89. සිවිල් නීතිය සහ නඩු කාර්ය පටිපාටිය
90. සාක්ෂි නීතිය
91. කම්කරු නීතිය
92. අපරාධ නීතියේ මූලධර්ම
93. අපරාධ නඩු විධාන නීතිය
94. අපරාධ නීතිය සහ සාපරාධී වගකීම
95. පොදු ජන නීති අත්පොත නව සංස්කරණය
96. අපරාධ නීතිය සහ දණ්ඩ නීති සංග්‍රහය
97. පරිපාලන නීතිය සහ සේවක අයිතිවාසිකම්
98. ප්‍රායෝගික ඉඩම් නීතිය
99. ඉඩම් නීතියේ සංකල්ප සහ භාවිතය
100. නීති ප්‍රවේශය
101. මෝටර් රථ ප්‍රවාහන නීතිය
102. ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය
103. පොදු ජනතාවගේ තොරතුරු අත්පොත
104. ඉඩම් ආරවුල් සහ හැටහය වන වගන්තියේ නඩු
105. ශ්‍රී ලංකාවේ ඉඩම් නීතිය
106. රිය පැදවීමේ නීති අත්පොත
107. පොදු ජනතා පොදු ගැටලුවලට නීති විසඳුම්
108. බෙදුම් නඩු නීතිය
109. ශ්‍රී ලංකාවේ කම්කරු නීතිය
110. අධිකරණ ක්‍රමය සහ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය
111. විවාහ නීති අත්පොත
112. අපරාධ නීති අත්පොත
113. සිවිල් නඩු විධාන නීතිය
114. ඔප්පු ලිවීමේ නීතිය
115. ඉඩම් නීති අත්පොත
116. එදිනෙදා ජීවිතයට නීති උපදෙස්
117. නීතිය සැමට
118. අභියාචනා නීතිය
119. ජන දිවියට නීතිය
120. තහනම් නියෝග පිළිබඳ නීතිය
121. මූලික අයිතිවාසිකම් පිළිබඳ නීතිය
122. කම්කරු නීතිය සහ කම්කරු උසාවිය
123. ඉඩම් නීතිය මුල සිට සරලව
124. අපරාධ නීතියේ මූලිකාංග
125. විවාහය දික්කසාදය සහ නඩත්තු පිළිබඳ නීති
126. නීතිය සහ උසාවි ක්‍රමය
127. මාර්ග නීති අත්පොත
128. නඩු කටයුතු පිළිබඳ අත්පොත
129. නීතිය සහ අධිකරණ බලය
130. පොලීසිය සහ නීතිය
131. මානව හිමිකම් පිළිබඳ නීතිය
132. වංචා වැළැක්වීමේ නීතිය
133. බෙදුම් නඩු කාර්ය පටිපාටිය
134. අභියාචනය සහ ප්‍රතිශෝධනය

## වෙනත් කෘතීන්

135. සටන් කලාව
136. ගුප්ත විද්‍යාව සහ අමනුස්ස ලෝකය
137. ජීවිතය සහ මරණය පිළිබඳ විස්මිත රහස්
138. අන්තරාභවය සහ මළවුන්ගේ ලෝකය
139. මළවුන්ගේ ලෝකයේ අභිරහස්
140. විශ්ව ශක්තිය සහ සුවකිරීමේ බලය
141. විශ්වයේ විස්මිත අභිරහස්
142. ගුප්ත විද්‍යාව සහ අධිමානසික හැකියාව
143. ගුප්ත විද්‍යාවේ රහස්
144. ඩිජිටල් ඡායාරූපකරණය
145. පිටසක්වළ ජීවීන්ගේ විස්මිත රහස්
146. අමනුස්ස ලෝකයේ අභිරහස්
147. නවීන විද්‍යාවේ හාස්කම්
148. ලොව හෙල්ලූ විස්මිත අභිරහස්
149. නවීන විද්‍යාවේ හාස්කම්
150. සටන් කලා අත්පොත
151. මළවුන්ගේ ලෝකයේ විස්මිත රහස්
152. ලොව හෙල්ලූ විස්මිත අනාවැකි
153. සිව් හෙළයට අධිපති රාවණා
154. මහා යෝගියෙකු සමඟ දොළොස් වසරක්
155. පොදු ජනතාවගේ තොරතුරු අත්පොත

Scanned with CamScanner

Scanned with CamScanner

ඉරිදා දිවයින පුවත්පතේ පළ වූ ආන්දෝලනාත්මක භාවනා ලිපිපෙළ

# සම්මා සමාධි

භාවනාව හා මාර්ගඵල පිළිබඳ නිවැරදි විස්තර ඇතුළත් අත්පොත

**නීතිඥ නිලන්ත හෙට්ටිගේ**

සුසර ප්‍රකාශකයෝ
නො. 180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
දු.ක. - 0112 430721 ෆැක්ස් - 0112 334597

CS Scanned with CamScanner

මෙම පොතෙහි අඩංගු කරුණු හා තොරතුරු කර්තෘගේ අදහස් මිස
ප්‍රකාශකයාගේ අදහස් නොවන බව කරුණාවෙන් සලකන්න.

**සම්මා සමාධි**
© නීතිඥ - නිලන්ත හෙට්ටිගේ

ප්‍රථම මුද්‍රණය - 2018 පෙබරවාරි

**ISBN 978-955-33-0821-4**

Agreement No: 1793

**පරිගණක පිටු සැලසුම**
ඩිලන්ත මුතුගල

**මුද්‍රණය**
සුසර මුද්‍රණාලය
නො: 338/*A*, ගෝනහේන, කඩවත.

**ප්‍රකාශනය හා බෙදාහැරීම**
සුසර ප්‍රකාශකයෝ
නො. 180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
දු.ක. - 0112 430721 ෆැක්ස් - 0112 334597
*E-mail: susarapub@gmail.com*
*Web: www.susarapublication.lk*
*Facebook: www.facebook.com/susarapublications*

Scanned with CamScanner

# පෙරවදන

දෙදහස් දහහත වර්ෂයේ මුල් කාර්තුවේදී ඉරිදා දිවයින පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ මනෝජ් අබේධීර මැතිතුමාගේ ආරාධනය පරිදි මවිසින් භාවනා ලිපි පෙළක් ආරම්භ කරන්නට යෙදුණි. ඒ භාවනා ලිපි පෙළ අතිශය ආන්දෝලනාත්මක එකක් වූ අතර බොහෝ දෙනෙක් ඒ ලිපි කියවා ධර්ම මාර්ගයට අවතීර්ණ වූහ.

සහෘද පාඨකයන්ගේ ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව ඒ ලිපි පෙළ කොටස් වශයෙන් මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කළෙමි. මෙය ඒ පොත් පෙළෙහි සිව් වැන්නයි. එහි මුල් කොටස් තුන වන පිටසක්වළ බෞද්ධ නායකයෝ, බුදුවරු හා බෝසත්වරු හා ගුප්ත බුදුසමය යන කෘතීන් මීට පෙර මුද්‍රණද්වාරයෙන් පිටවිය.

මුල්බුදුසමයෙහි හා ථෙරවාදයෙහි එන සෝවාන් මාර්ග ප්‍රතිපදාව මේ කෘතියේ ඉතා දීර්ඝ ලෙස විස්තර කර ඇත. මෙඅත්බැව්හි මාර්ගඵල ලබාගැනීමට කැමති පිරිස් හට මේ කෘතිය අත්පොතක් ලෙස භාවිත කළ හැකිය.

**නීතිඥ නිලන්ත හෙට්ටිගේ**

Scanned with CamScanner

Scanned with CamScanner

# 01

# සෝතාපන්න ඵලය කැමති කෙනෙකුට සමාදන් විය හැකිය

මේ දිනවල මාගේ දුරකථනයට කිසිදු නිදහසක් නැති තරම්ය. පිටසක්වළ බුදුවරුන් ගැන ලියැවුණු ලිපි කියවූ විශාල පිරිසක් අනේකවිධ ප්‍රශ්න මා වෙත යොමු කරති. ඒ එක් එක් ප්‍රශ්නයක් ගැන පුද්ගලිකව අවධානය යොමු කිරීම දුෂ්කරය. මන්දයත් කාලය ඊට හරස් වන බැවිනි. කෙසේ නමුත් පිටසක්වළ බුදුවරුන් පිළිබඳ ලිපිපෙළ කියවූ පිරිස් විසින් මා වෙත නිතර නිතර යොමු කරන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම කාලෝචිත වේ යයි සිතමි.

අද වන විට පිටසක්වළ බුදුවරුන් වැඩවාසය කරන්නේද යන පැනය බොහෝ දුරට ලිහී අවසන්ය. උගත් ස්වාමීන්වහන්සේලා කිහිප නමක් විසින් පිටසක්වළ බුදුවරුන් වැඩ වෙසෙන්නේය යන්න සනාථ කරවන කරුණු මාධ්‍යයන් හරහා ඉදිරිපත් කර ඇත. එබැවින් ඒ ප්‍රශ්නය තවදුරටත් වැදගත් නොවේ යයි සලකමි. පිටසක්වළ බෞද්ධයන් ගැන වැඩි විස්තර දැන ගනු කැමති අය සූත්‍ර පිටකයේ එන ත්‍රෛලෝකවිජය සක්විතිරජුගේ කතාව හා අභිභූ මහරහතන්වහන්සේගේ කතාව කියවා බැලීම සුදුසුය.

මේ ළඟකදී සිට හිටිහැටියේම ථෙරවාදයට පහර පිට පහර එල්ල කරන්නට පටන් ගත්තේ ඇයිදැයි බොහෝ දෙනෙක් මාගෙන් විමසති. මා විසින් ඊට ධර්මානුකූල



CS Scanned with CamScanner

පිළිතුරක් ලබා දීම සුදුසුය. සද්ධර්මය අතුරුදන් වනුයේ අන්‍යාගමික බලපෑමකින් නොව, සද්ධර්මයේ නාමයෙන් එළිදකින අසද්ධර්මය නිසා බව සද්ධර්ම ප්‍රතිරූපක සූත්‍රයේ සඳහන්ය. එබැවින් සද්ධර්ම ප්‍රතිරූපක මවන්නන් මතවාදීව පරාජය කිරීමකින් තොරව මුල් බුදුසමය නැවත පිහිටුවිය නොහැකිය.

මුල් බුදුසමය නැවත පිහිටුවීමකින් තොරව මාර්ගඵල ලාභීන්යේ යුගය නැවත උදා කළ නොහැකිය. මාර්ගඵල ලාභීන්ගේ යුගය උදාකරවීමකින් තොරව පර්යාප්ති-ප්‍රතිපත්ති-ප්‍රතිවේද යන අංග තුනෙන් සමන්විත ත්‍රිවිධ ශාසනය නැවත පිහිටුවිය නොහැකිය. ත්‍රිවිධ ශාසනය පිහිටුවීමකින් තොරව ශාසනාරක්ෂක දෙවිවරුන්ගේ සහය ලබා ගත නොහැකිය. ශාසනාරක්ෂක දෙවිවරුන්ගේ සහයකින් තොරව බෞද්ධ පාලන තන්ත්‍රයක් උදාකරගත නොහැකිය. බෞද්ධ පාලන තන්ත්‍රයක් බිහිවීමකින් තොරව බුදුසසුන තව ස්වල්ප කාලයකට වඩා ආරක්ෂා කරගත නොහැකිය. සෑම කල්හිම රාජ්‍ය අනුග්‍රහය ලැබෙන තෙක් බුදුසසුන රැකුණි. රාජ්‍ය අනුග්‍රහය අවසන් වීමත් සමඟ බුද්ධ ශාසනය අතුරුදන්වීම නිශ්චිතවම සිදුවන දෙයකි.

ඉන්දියාව, බංග්ලාදේශය (වංගදේශය), පාකිස්ථානය (ඔඩ්ඩියානය), ඇෆ්ගනිස්ථානය, වියට්නාමය, චීනය, උතුරු කොරියාව, දකුණු කොරියාව, මැලේසියාව, ඉන්දුනීසියාව, යෝනක පුරය (අරාබි අර්ධද්වීපය) ආදී රටවල් පෙර කල බෞද්ධ රාජ්‍යයන් විය. බෞද්ධ රජවරුන්ගෙන් රාජ්‍ය බලය ගිලිහී යාමත් සමඟ ඒ සියලු රටවලින් බුදුදහම අතුගෑවී ගියේය. ඉන්දියාවේ අශෝක රජු විසින් ඇති කළ බෞද්ධ පුනරුදය නැති කිරීමට පුෂ්‍යමිත්‍රශුංගයන්ට ගතවූයේ ඉතා කෙටි කලකි. වඩා මෑත කාලයෙහි වංගදේශයේ බෞද්ධයන් සමූලඝාතනය කළේ එරට රජයේ අනුග්‍රහයද ඇතිවය. බංග්ලාදේශයේ හින්දූන් හා බෞද්ධයන් සමූලඝාතනය කිරීමේ හමුදා මෙහෙයුම ඔපරේෂන් සර්ච්ලයිට් නම් වේ. 1971 මාර්තු



Scanned with CamScanner

මාසයේ සිදු කෙරුණු ඒ හමුදා මෙහෙයුමෙන් අහිංසක සිවිල් වැසියන් තිස්ලක්ෂයක් පමණ ඝාතනය කෙරුණු බව නිල නොවන සංඛ්‍යා ලේඛනයන්හි සඳහන් වෙයි.

මා දේශපාලනය ගැන ලියනුයේ තදබල නොකැමැත්තකිනි. එනමුත් දැන් ඒ ගැන නොලියා බැරි තැනට පත්ව ඇත. මෙරට බෞද්ධයන් එක්කෝ සියලු වාදභේද දුරලා ඒකරාශි විය යුතුය. එසේ නොමැති නම් මේ ගතවන්නේ බුද්ධ ශාසනයේ අවසාන අවුරුදු කිහිපය බව සිහි නුවණින් යුතුව වටහා ගත යුතුය. තම දේශපාලන නායකයන් අතින් සිය දහස් වරක් පාවා දෙනු ලැබූ මෙවන් ජාතියක ඉරණම ගැන අමුතුවෙන් හිතා බැලීම අවශ්‍ය නොවනු ඇත. මෙහි පහත දැක්වෙන කතන්දරය අපේ ජාතිය මුහුණ පා සිටින අන්තරාය කුමක්ද යන්න ඔබට පැහැදිලි කර දෙනු ඇත.

පෙරකල දුරුරටක කුය්වාණිජ නම් යාත්‍රිකයෙක් වාසය කළේය. හේ සිය සොහොයුරන් තිදෙනෙකුද සමඟ දුරු රටක වෙළඳාමක ගොස් ආපසු නැව් නැගී ගම්රට බලා පිටත්විය. අභාග්‍යයකි. මහා සුළිසුළඟක් පැමිණ නෞකාව දියබත් විය. කුය්වාණිජ සිය සහෝදරයන්ද සමඟ බිඳුණු නැවේ ලෑල්ලක් අල්ලාගෙන මුහුදෙහි අතරමං වූයේය. ඔහුගේ සහෝදරයෝ මහත් සේ බියට පත්ව හඬන්නට වූහ. ඒ හා සමඟ කුය්වාණිජ තෙමේ දෙවියන් යදින්නට විය. " සමුද්‍රයට අධිපති පොසේදෝන් දේවතාවියනි, අප සිව්දෙනා ගොඩබිමට ඇරලුවහොත් නුඹවහන්සේ වෙනුවෙන් සියක් රියන් උස් දේවාලයක් කරමි. තවද සයරියන් උස දඹරන් පිළිමයක් නුඹවහන්සේ නමට අඹවා ඒ දෙවොලේ තබමි."

කුය්වාණිජයාගේ කන්නලව්ව ඇසූ සයුරට අධිපති පොසේදෝන් දේවතාවිය මහත් බලාපොරොත්තු ඇතිකරගෙන ගොඩබිම දෙසට සුළඟක් මැවීය. නොබෝ වේලාවකින් කුය්වාණිජයා ඇතුළු පිරිස ගොඩබිමට පැමිණියහ.



Scanned with CamScanner

"අය්යණ්ඩිය, අප දේව අනුහසින් ගොඩට ආ බව සැබෑය. එනමුත් අප විසින් ඇතිකරගන්නා ලද සම්මුතිය කෙසේ නම් ඉටු කරන්නේද?"

"එම්බා අඥානයෙනි, සයුරෙහිදී දුන් පොරොන්දු වනාහි ගොඩබිමට එනතුරු පමණක් වලංගු වන්නේය. විපතෙහිදී දුන් පොරොන්දු සැපතට පැමිණි පසු අහෝසි වන්නේය. තොප ඒ දෙය තවම නොදන්නේද?" යනුවෙන් කී කුඨවාණිජ සිය සහෝදරයන් අස්වැසීය.

අද මෙරට දේශපාලකයන්ගේ පොරොන්දු සියල්ල පෙර කල්හි කුඨවාණිජ නම් වෙළෙන්දා දුන් පොරොන්දු හා සම වෙයි. දේශපාලකයන් දුන් සියලු පොරොන්දු ඡන්දයෙන් එගොඩ වන තුරු වලංගු වෙයි. එගොඩ වූ තැන් පටන් ඒ පොරොන්දු අවලංගු වෙයි. පොරොන්දු දේශපාලනයට සමුදී ප්‍රතිපත්තිවලට මුල්තැන දෙන පාලන තන්ත්‍රයකට මාරු වන තෙක් මේ රටට දියුණුවක් ඇතිවන්නේම නැත.

බෝසත්වරුන් මා වෙත නිවේදනය කර ඇති පරිදි බුදුසසුනෙහි ඉදිරි පැවැත්ම සඳහා ශාසන ශෝධනයක් අත්‍යවශ්‍ය වෙයි. ඒ ශාසන ශෝධනයෙහි පියවර කිහිපයකි. ඉන් පළමු පියවර මෙකල්හි මඟ පල ලැබිය හැකි බව මිනිසුන්ට දන්වා ඔවුන් දිරිමත් කිරීමයි. දෙවන පියවර වනුයේ හේතු සම්පත් ඇත්තවුන්ට මාර්ගඵල සංඛ්‍යාත නිවන ලබනු පිණිස වැසී ඇති ධර්ම මාර්ගය විවෘත කිරීමයි. එලෙස ධර්ම මාර්ගය විවෘත වූ පසු සැලකිය යුතු පිරිසක් මාර්ගඵල ලැබීමට නියමිතය. එලෙස මාර්ගඵලලාභීන් විවෘත ලෙස සමාජයේ ජීවත් වීම තුළින් තවතවත් පිරිස් ධර්ම මාර්ගයට එක්වෙති. දැනට අභිරහස් ජීවිත ගත කරන රහතන් වහන්සේලා එකල්හි සමාජගත වෙති. උන්වහන්සේලා සමාජගත වනුයේ අර්හත්ඵලය ලද්දවුන්ගේ පරම යුතුකමක් වන ලෝකාර්ථචර්යාවෙහි යෙදෙනු පිණිසය.



CS Scanned with CamScanner

මෙලෙස ත්‍රිවිධ ශාසනය නැවත හටගත් පසු තවත් ආශ්චර්යයන් ගණනාවක්ම සිදුවීමට නියමිතය. දැනට බුදුදහම ථෙරවාද මහායාන හා වජ්‍රයාන යන ශාඛා තුනකින්ද අනුශාඛා සිය දහස් ගණනකින්ද සමන්විතය. අනාගත කාලයේදී ඒ ශාඛා සියල්ල එක්වී තනි බුදුදහමක් සෑදෙන බව බෝසත්වරු කියති. තවද මෙයාකාරයෙන් බෞද්ධයන් එක්සත් වූ පසු බෞද්ධ පාලන තන්ත්‍රයක් ඇති වීමටද නියමිතය. නමුත් ඒ ඉදිරි ගමන බරපතළ කොන්දේසියකට යටත් වෙයි. බෞද්ධයන් සියලු වාද භේද දුරලා එක්සත් වන තුරු මේ කියන හොඳ ප්‍රතිඵල එකක් හෝ ඇති නොවේ.

ඉහතින් දක්වන ලද ශාසන ශෝධන කාර්යය අතිශය බැරෑරුම් හා අවදානම් එකක් බව අමුතුවෙන් කීමට අවශ්‍ය නොවේ. බුදුසසුනෙහි අභිවෘද්ධියට එරෙහිව අද මතුපිටින් පෙනෙනන්නට ඇති ලොකුම බාධකය අන්‍යාගමික මූලධර්මවාදීන්ය. ශ්‍රී ලංකාව අබෞද්ධ රටක් බවට පත් කිරීමට ඔවුන් ගෙන යන වැඩසටහනෙහි තව ඉතිරිව ඇත්තේ අවසන් පියවර කිහිපය පමණි. එහි මුල් පියවර කිහිපය සාර්ථක වීම නිසා මෙරට බෞද්ධ ජනතාව එකෙකුට එකෙක් නැතිවන තරමට බෙදී වෙන්ව ගොස් ඇත. රට අනාගාමික තත්වයට පැමිණ ඇත. තමන් අන්‍යාගමික මූලධර්මවාදීන්ගේ කුමන්ත්‍රණයන්ට නතුව සිටින බව බෞද්ධයන්ට තවම නොවැටහෙයි. අද වන විට මෙරට ඉඩම් භුක්තියද ආර්ථික මර්මස්ථානයන්ද පාලන තන්ත්‍රයේ ඉහළ හා මැද තනතුරුද බෞද්ධයන් අතින් ගිලිහී ගොස් අවසන්ය. බුදුදහම සුරකින්නට එළිපිට කතා කරන දේශපාලකයන්ට පහර පිට පහර එල්ල වෙයි.

බුදුදහමට එරෙහිව ඇති දෙවන ප්‍රබලතම මාරකය නම් නූතන ථෙරවාදයයි. නූතන ථෙරවාදය යන නමින් මා හඳුන්වනුයේ අද දකින ජනප්‍රිය බුදුදහමයි. මුල් බුදුදහම අදේවවාදයක් විය. ජනප්‍රිය බුදුදහම දේවවාදයකි. එය ගස් ගල් අදහන ගෝත්‍රික ආගම් වල ආභාෂය ලැබූවකි.



Scanned with CamScanner

ජනප්‍රිය බුදුදහමේ දේව මණ්ඩලයේ ප්‍රමුඛයා 'ගෞතම බුදුන්වහන්සේ' ය. හින්දු දේවකථාවල එන ස්කන්ධ කුමාර, විෂ්ණු, කාළි, පත්තිනි වැනි චරිත රැසක් ජනප්‍රිය බුදුදහමේ දේව මණ්ඩලයේ යාවජීව සාමාජිකයෝ වෙති.

ජනප්‍රිය බුදුදහමෙහි නිවනට ඇත්තේ අඩු ලංසුවකි. නිවන් සැප ලැබිය යුත්තේ දෙව් මිනිස් සැප ලබා කෙළවර වූ පසුය යන්න ජනප්‍රිය බුදුදහම තුළ නිතර නිතර අවධාරණය කෙරෙයි. ජනප්‍රිය බුදුදහම තුළ ගෞතම බුදුන්වහන්සේ සිටිනුයේ මෛත්‍රී බුදුන්ට වඩා හත්ගව්වක් පිටිපස්සෙනි. ජනප්‍රිය බුද්ධාගමේ ලාබතම ප්‍රයෝගය වන්නේ මෛත්‍රී බුදුන් දැක නිවන් දකින ලෙස දන්වා ශාසන ප්‍රතිපදාවෙන් මිනිසුන් ආපසු හරවා යැවීමයි. ජනප්‍රිය බුදුදහමේ දෙවන ප්‍රයෝගය වනුයේ ගිහියන්ට මතු දිව්‍ය සම්පත් පෙන්වා පැවිද්දන් රිසි පරිදි කම් සැප ලැබීමයි.

ජනප්‍රිය බුදුදහම හෙවත් නූතන ථෙරවාදය තුළ ඇති දොස් පිට දැමීම මා විසින් අකැමැත්තෙන් හෝ කළ යුතුය. සැරවා පිරුණු විෂප්පුවක් විවර කර අප්‍රසන්න දේ එළියට ඇද දමන තුරු සුවයක් නම් අත් නොවේමය. මා ඒ කටයුත්ත තවම අවසන් කළේ නැත. ආරම්භ කළා පමණි. මට ජනප්‍රිය ථෙරවාදයේ දෝෂසහගත තැන් ගැන පිටු දහසක පමණ පොතක් ලිවිය හැකිය. මම ඒ පොත ලිවීම පසෙක තබා වැදගත් තැන් කිහිපයක් ගැන යළි අවධානය යොමු කරමි.

අපේ රටේ බෞද්ධයන් බුදුදහමෙහි මූලික සංකල්පවත් හඳුනා නොගත් ගෝත්‍රික මතවාදීන්ය යන ප්‍රකාශය මට ඕනෑම වියත් සභාවක් ඉදිරියේ නොබියව කිව හැකිය. අද මෙරට බෞද්ධයන්ගේ ඇවතුම් පැවතුම් හරි අමුතුය. ලාංකේය බෞද්ධයන් තරම් උත්සව කටයුතුවලට වියදම් කරන පිරිස් තුන් ලෝකයේම වෙත්ද යන්න පවා සැක සහිතය. රුපියල් ලක්ෂ දහයක්වත් නොමැතිව ඇඟට දැනෙන්නට මඟුලක් තුලාවක් මළගෙයක් අවසන් කිරීමට අපේ ඇත්තන්ට නොහැකිය. මළගෙවල් මඟුල් ගෙවල් අවසන් වූ වහාම



Scanned with CamScanner

එළඹෙනුයේ සෙනසුරුගේ ඒරාෂ්ඨක අපල කාලයයි. මනාල යුවළ තම දෙමාපියන්ගේ අවමඟුල දක්වාම මඟුලට ගත් ණය ගෙවීමට වෙහෙසෙති.

සෙනසුරු ඒරාෂ්ඨක අපල කාලය එයින් අවසන් නොවේ. අපේ රටේ ඇත්තන් තරම් ගෙවල් දොරවල් සෑදීමට වෙහෙසෙන ජාතියක් ගැන මා අසා නැත. මෙරට සාමාන්‍ය මධ්‍යම පාන්තිකයකුගේ නිවාසයක් පෙර කල පැවැති රජමැඳුරකට වඩා විශාලය. එනමුත් ඒ මන්දිරවල වෙසෙන්නන් දිවා රෑ වෙහෙසෙන්නේ නිවාස ණය ගෙවීම වෙනුවෙනි.

අවම වශයෙන් සෝවාන් මාර්ගයවත් ලබාගත් කෙනෙක් මෙයාකාර විසූක දස්සනයන්ට යොමු නොවනු ඇති බව සහතිකය. සෝවාන් මාර්ගයෙහි ගමන් කරන තැනැත්තා සිය එලයට පැමිණීමේදී කරුණු තුනක් නිසැකව දැනගනී. හේ සියලු සංස්කාර අනිත්‍ය බව දනියි. සියලු සංස්කාර දුකට මුල්වන බව දනියි. හේ සියලු සංස්කාර අනාත්ම වන බව දනියි. තවද ආර්ය මාර්ගයේ වැදගත් සන්ධිස්ථානයක සිටින ඔහු තවත් වැදගත් කරුණු පහක් දැන ගනියි.

01. සියලු ආකාර රූපයන් පෙණ පිඬුවක් මෙන් (අභ්‍යන්තරයෙන්) හිස්වූ බව ඔහු දනියි.

02. සියලු ආකාර වේදනාවන් පෙන බුබුළක් සේ අනිත්‍ය බව ඔහු දනියි.

03. සියලු ආකාර සංඥාවන් මිරිඟුවක් මෙන්ම යථාර්ථ වශයෙන් නොපවතින බව ඔහු දනියි. (හැඳිනීම් හා හඳුන්වාදීම් කාර්යය සංඥාවට අයත්ය. ඇසෙන් කෙරෙන හැඳිනීම රූප සංඥාවයි ආදී ලෙස සලකන්න)

04. සියලු ආකාර සංස්කාරයන්හි හරයක් නොමැති කෙසෙල් ගසක මෙන් සැබෑ වටිනාකමක් නොපවතින බව ඔහු දකියි.



CS Scanned with CamScanner

05. සියලු ආකාර විඤ්ඤාණය (විජාන හෙවත් ඉන්ද්‍රිය ගෝචර දැන්වීම් කාර්යය විඤ්ඤාණයට අයත්ය) මායාකරුවකුගේ ඉන්ද්‍රජාලයන් හා සම කළ හැකි බව ඔහු දනියි.

දැන් අපි මාර්ගඵල පිළිබඳ ඉගැන්වීම් සැබෑ ජීවිතයේ අවස්ථා සමඟ සසඳා බලමු. සියලු සංස්කාරයන් හරසුන් බව දන්නා කෙනෙකු අතින් පෙර කී වැරදි සිදුවීමට ඉඩක් නැත. පෘථග්ජනයාගේ සම්පූර්ණ ජීවිතය ණයට මුදල් ගෙන ජයට මඟුල් කෑමක් වැනිය. පෘථග්ජනයා සියලු දෙය යථාර්ථ වශයෙන් පවතින්නේ යයි සලකයි. හේ හැමදා ජීවත් වන්නකු සේ සලකා ජීවිතයේ හැරුම් ලක්ෂ්‍යයන් 'සෙලිබ්‍රේට්' කරයි. සෝවාන් ඵලලාභියාට 'සෙලිබ්‍රේට්' කිරීමට තරම් වටිනා කඩඉමක් ජීවිතය තුළින් හඳුනාගත නොහැකිය. ඔහු සංසාරයට බිය වී තැතිගත් කෙනෙකි. සංසාරයෙන් ඉවතට දිවයන කෙනෙකි. මරණය නැවතුම් ලක්ෂ්‍යයක් නොවන බව ඔහු දනියි. අනන්ත වාර සංඛ්‍යාවක් පෙර සසරෙහි මරණයට මුහුණ දුන් බව හොඳාකාර දන්නා ඔහු ජීවිතය හා මරණය පිළිබඳ සියලු පෘථග්ජන සංකල්ප අභිබවා නැඟී සිටියි.

සාමාන්‍ය ජීවිතයෙහිදී පෘථග්ජන සංකල්පවල නොගෑවෙමින් ජීවත් වන මාර්ගඵල ලාභියකු වනයේ තනිව සැරිසරන කඟවේනෙකුට උපමා කර දක්වනු ලැබෙයි. කෙනෙකුට බාගෙවිට ඔහුව පිස්සකු ලෙස පෙනිය හැකිය. ඔහුව රැඩිකල් මතධාරියකු ලෙස පෙනිය හැකිය. එසේම පෘථග්ජනයන්ගේ උමතු ක්‍රියා දකිමින් සාමාන්‍ය සමාජයේ වාසය කිරීම මාර්ගඵල ලාභියකුට වධයක් මෙන්ම හිංසාවක්ද විය හැකිය. අද කාලයේ බිහිවන මාර්ගඵල ලාභීන්ට මුහුණපාන්නට සිදුවන ප්‍රධානතම ප්‍රශ්නය මෙයයි.

මූලික සූත්‍රයන්හි දැක්වෙන සෝවාන් මාර්ගය මා විසින් මීට පෙර අවස්ථාවන්හි විස්තර කර ඇති ආකාරයටම සරල හා පහසුවෙන් වැඩිය හැකි එකකි. සෝවාන්



Scanned with CamScanner

මාර්ගයට අනවශ්‍ය ලෙස දීර්ඝ කර පෙන්වූයේ ථෙරවාදීන් විසිනි. මූලික බුදුදහමේ එන සරල හා පැහැදිලි සෝවාන් මාර්ගයට ථෙරවාදීන් කිසිදු තැනක් දී නැත. අවම වශයෙන් ඒ ගැන සඳහනක් හෝ නොකිරීමට ථෙරවාදීන් ප්‍රවේසම් වන බව පෙනෙන්නට ඇත. ථෙරවාදීන්ට අනුව සෝවාන් මාර්ගය භාවනාවක් ලෙස ඉතා දිගු කාලයක් වැඩිය යුතු එකකි. ථෙරවාදී ක්‍රමයට අයත් මුල්ම විදර්ශනා ඥානය වන සම්මර්ශන ඥානයේ සිට සෝවාන් ඵලය දක්වා මාවත අතිශය ගාම්භීර එකකි.

අපි දැන් මුල් බුදුසමය වෙත හැරෙමු. බුද්ධ කාලයේ සිටි සෝතාපන්නයන්ගෙන් වැඩි දෙනෙක් එතැනට පැමිණියේ බණ ඇසීමෙනි. එහෙත්, භාවනාවෙන් සෝවාන් වූවන් ගැන විස්තර කෙරෙන තැන් නැත්තේම නොවේ. විදර්ශනා භාවනා වැඩීමෙන් මාර්ගඵල සතරම ලබා ගත හැකි බව අනිත්‍ය සංඥා සූත්‍රයේ දැක්වෙයි.

භාවනාව මාර්ගඵල ලැබීමට ඒකායන මාවත බවට නිර්දේශ කරන ලද්දේද ථෙරවාදීන් විසිනි. මූලික බුදුදහම අනුව භාවනාව මාර්ගඵල ලැබීමට අනිවාර්ය අවශ්‍යතාවක්ද නොවේ. භාවනාවෙන් සිත එකඟ කිරීමකින් තොරව සක්කාය දිට්ඨි, විචිකිච්ඡා යන ත්‍රිවිධ සංයෝජන ධර්ම නැසිය හැකිය යන්න පහසුවෙන් ඔප්පු කර පෙන්විය හැකිය. මන්දයත් ඒ සංයෝජන තුනටම අදාළ වනුයේ කිසියම් විශ්වාසයක්, සැකයක් හෝ බලාපොරොත්තුවක් වන බැවිනි. ආත්මවාදී විශ්වාසයන්, භෞතිකවාදී විශ්වාසයන් හා නාස්තිකවාදී විශ්වාසයන් සක්කාය දෘෂ්ඨිය ගණයෙහි ලා සැලකෙන බව සංයුක්ත නිකායේ දිට්ඨි සංයුක්තයේ සෝතාපත්ති වර්ගයට අයත් සූත්‍ර සන්සන්දනාත්මකව බැලීමෙන් වටහා ගත හැකිය. මා පෙර සඳහන් කළ පරිදි විචිකිච්ඡාව යනු ජීවිතය හා ධර්ම මාර්ගය පිළිබඳ සැකයන් සමූහයකි. සීලබ්බත පරාමාසයේ ආකාර දෙකක් ඇති බව ඉහතින් පෙන්වා දෙන ලදී. ඒ ආකාර දෙකම විවිධාකාර බලාපොරොත්තු ගණයට අයත් වෙයි.



CS Scanned with CamScanner

විශ්වාසයක්, සැකයක් හෝ බලාපොරොත්තුවක් අත්හැර දැමීමට භාවනා කළ යුතුමය යනුවෙන් යමෙකු තර්ක කරන්නේ නම් එම තර්කයට පදනමක්ද නැත. එනමුත් ජීවිතය සමඟ වඩා ගැඹුරෙන් බද්ධ වී ඇති සංයෝජන ධර්ම නැසීමට භාවනා කළ යුතුය යන තර්කය තරමක් හෝ සාධාරණය. මේ තර්කය ඥානප්‍රස්ථාන නම් සාර්වස්ථිකවාදී අභිධර්ම ග්‍රන්ථයේ මෙයාකාරයෙන් සඳහන් වෙයි. "කාමාවචර සිතකින් කාමාවචර සිතක දොස් දැකිය නොහැකිය. එනමුත් රූපාවචර සිතකින් කාමාවචර සිතක දොස් දැකීමට හැකිය. මේ හේතුවෙන් සියලු කෙළෙසුන් නසා අර්හත්ඵලය ලැබීමට නම් රූපාවචර ධ්‍යානයක් ලද යුතුය." ඥාන ප්‍රස්ථාන අභිධර්ම ග්‍රන්ථය කලක් අතුරුදහන්ව තිබී තරමක් මෑත කාලයේදී චීනයෙන් සොයාගනු ලැබූවකි.

ඥාන ප්‍රස්ථානයේ එන පෙරකී මතය දෝෂදර්ශනයට ලක් කළ හැකිය. මන්දයත් රූපාවචර ධ්‍යානයක සිට විදර්ශනා කිරීම ප්‍රායෝගික නොවන බැවිනි. රූපාවචර ධ්‍යානයකදී ඒකාග්‍ර වූ ධ්‍යාන සිත් පෙළක් හටගන්නා බැවින් ධ්‍යාන වීථියක සිට විදර්ශනාව කළ නොහැකි බව තර්ක කළ හැකිය. එතෙක් ඒකාග්‍රව තිබූ සිත විදර්ශනාව අරඹන අවස්ථාවේදී නානා ආරම්මණයන් කරා යන බැවින් යෝගියා ධ්‍යානවේගයෙන් මිදෙයි. එකල්හි කාමාවචර සිත් හටගනියි. එබැවින් ධ්‍යානයක සිය විදර්ශනා කළ නොහැකිය. සමථයානිකයා ධ්‍යානයකින් නැඟී සිට විදර්ශනා කරන්නේය යන යෙදුම වඩාත් සාධාරණය.

දැන් අපි සෝතාපන්න ඵලය දෙස හැරෙමු. මා මුලදී කියූ පරිද්දෙන්ම ථෙරවාදීන් සෝතාපන්න ඵලය විස්තර කරනුයේ මහා ගාම්භීර යෙදුම් රැසක්ද සමඟිනි. අපි ඒ ගාම්භීර යෙදුම් ගැන කතා කිරීම පසුවට තබමු. දැන් අපි මුල් බුදුදහමේ කියවෙන සෝතාපන්න ඵලය දෙස නැවත යොමු වෙමු.



CS Scanned with CamScanner

සෝවාන් මාර්ගය වැඩී අවසානයේ සෝවාන් මාර්ග චිත්තය උපදියි. සෑම මාර්ගඵලයකටම පෙර මාර්ග චිත්තයක් උපදින්නේය යන්න කීම සාධාරණ වුවත් සෝවාන් මාර්ග චිත්තය ගැන කතා නොකර කෙළින්ම සෝවාන් ඵලය ගැන කතා කරන ආකාරයක් මූලික සූත්‍රවලින් ප්‍රකට වෙයි. බාගෙවිට සෝවාන් ඵලය ඉතා සරලව විස්තර කිරීමේ අවශ්‍යතාව මත මාර්ග චිත්තය අමතක කළා විය හැකිය. නමුත් අර්හත්ඵලය ගැන කතා කරන තැන්වල මාර්ග චිත්තය යන යෙදුම නිතර නිතර හමුවෙයි.

මූලික බුදුදහම අනුව සක්කාය දිට්ඨි, විචිකිච්ඡා හා සීලබ්බත පරාමාස යන සංයෝජන ධර්ම තුන නැසී ගිය වහාම සෝතාපන්න ඵලය ලැබෙයි. සංයෝජන ධර්ම නැසීයාමත් ඵලයෙහි පිහිටීමත් අතර කාල පරතරය ගැන සෝතාපන්න ඵලය සම්බන්ධ සූත්‍රයන්හි විස්තර කර නැත. ඒ කාල පරතරය නොගිණිය හැකි තරම් කුඩා නිසා අත්හැර දමා ඇති බව පෙනෙන්නට ඇත.

මුල්ම සංසාර බැමි තුන උපුටා දමන ලද තැනැත්තා සෝතාපන්න යන නම ලැබීමට සුදුස්සෙකි. සංසාර බැමි තුනක් උපුටා දමන ලද සැනින් ඔහුගේ චිත්ත සන්තානයේ හා චර්යාවේ තවත් සුවිශේෂි වෙනස්කම් හතරක් ඇතිවෙයි. මේ වෙනස්කම් හතර 'සෝතාපන්න අංග' නම් වෙයි. සෑම සෝතාපන්නයෙක්ම ඒ සෝතාපන්න අංග හතරෙහි සාඩම්බර හිමිකරුවෙකි. එකී සෝතාපන්න අංග සතර මෙසේය:

01. බුදුන්වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාව
02. ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාව
03. ආර්ය සංඝරත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාව
04. මුලින් මැදින් අගින් නොකැඩුණු ආර්ය කාන්තවූ පංචශීලය

මෙම විස්තරය අවබෝධ කරගන්නා අතර අපට තවත් ගැටලුවක් පහසුවෙන්ම නිරාකරණය කරගත හැකිය. සෝවාන් මාර්ගයේ සිටින්නන් දෙදෙනකු ගැන පෙර



CS Scanned with CamScanner

අවස්ථාවකදී දක්වන ලදී. ඉන් එක් අයෙක් සද්ධානුසාරියාය. අනෙකා ධම්මානුසාරියාය. සද්ධානුසාරියා ශ්‍රද්ධාව වැඩි කරගන්නා මාවත දිගේ ගොස් සංසාර බැමි තුනක් ලිහා දමයි. හේ සද්ධාවිමුක්ත නම් සෝතාපන්නයකු බවට පත්වෙයි. ධම්මානුසාරියා ධර්මය ඉගෙන සැක දුරු කරගැනීමේ මාවතෙහි ගොස් ගොස් සංසාර බැමි තුනක් ලිහා දමයි. හේ දිට්ඨිපත්ත නම් සෝතාපන්නයකු බවට පත් වෙයි. මා මෙහි සඳහන් කරන්නේ මූලික සූත්‍රවලට අදාළ සෝතාපන්න ඵලය බව නැවත සිහිපත් කරනු කැමැත්තෙමි.

දැන් අපි සද්ධානුසාරියා කවුද ධම්මානුසාරියා කවුද යන කරුණ සැක හැර දැන ගනිමු. යම් පුද්ගලයකු "සංයෝජන සිඳ දැමීමේ මාවත" තෝරාගත්තොත් ඔහු ධම්මානුසාරියකු වන බව පැහැදිලිය. මන්ද යත් සක්කාය දිට්ඨිය විචිකිච්ඡාව හා සීලබ්බත පරාමාසය සිඳලීමට ධර්මය දැනගෙන නුවණින් විමසීමේ ක්‍රියාවලියෙහි ඔහු සැහෙන දුරක් ගමන් කළ යුතු බැවිනි. සැක දුරුවන තුරුම ධර්මය විමර්ශනය කිරීමට ධම්මානුසාරියාට සිදුවෙනු ඇත.

සද්ධානුසාරියා එවැන්නකු නොවේ. හේ ශ්‍රද්ධාව වැඩි කරගන්නා මාවතේ ගමන් කරයි. හේ බුදුන්වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇති කර ගනියි. ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාව වැඩි කර ගනියි. ආර්ය සංඝරත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇති කර ගනියි. ශ්‍රද්ධාව හේතුවෙන්ම ශික්ෂාකාමියකු වෙයි. එම මාර්ගයෙහි ගමන් කිරීමෙන් ඔහු ලබන ප්‍රතිඵලය සද්ධාවිමුක්ත නම් සෝතාපන්න ඵලයයි.

සද්ධාවිමුක්තයා හා දිට්ඨිපත්තයා අතර වෙනසක් ධර්මයෙහි සඳහන් කර නැත. ඔවුන් ආ මාවත පමණක් වෙනස් වෙයි. සද්ධානුසාරියා සෝතාපන්න අංග හතර වෙත ක්‍රමයෙන් සමීප වී අවසානයේ සද්ධාවිමුක්තයකු බවට පත්වෙයි. ධම්මානුසාරියා සංයෝජන ධර්ම සිඳින මාවතේ ගොස් දිට්ඨිපත්තයකු බවට පත්වෙයි. මේ අනුව සක්කාය දිට්ඨිය ප්‍රමුඛ මුල් ත්‍රිවිධ සංයෝජන නසන පුද්ගලයා



Scanned with CamScanner

'ඔහුටත් නොදැනීම' සෝතාපන්න අංග හතරෙහි පිහිටයි. සෝතාපන්න අංග හතරෙහි පිහිටන පුද්ගලයා 'ඔහුටත් නොදැනීම' මුල් ත්‍රිවිධ සංයෝජන නසයි.

සෝතාපන්නඵලය සම්බන්ධ වඩාත්ම සිත්ගන්නාසුලු ඉගැන්වීම මේ හා සම්බන්ධය. "යමෙකු සිල් සමාදන් වන්නාක් මෙන් සෝතාපන්න ඵල හතර සමාදන් වුවහොත් ඔහු සෝතපන්න ඵලයේ පිහිටන්නේය" යන්න එම සිත්ගන්නාසුලු ඉගැන්වීමයි. මෙම කරුණ සඳහන් වන්නේ අනාථ පිණ්ඩික සිටුතුමා අරභයා කරන ලද ඉතා කෙටි සූත්‍ර දේශනාවක් තුළය. ඔබට සෝවාන් වීමට අවශ්‍ය නම් දිවි හිමියෙන් බුදුන් සරණ යන්න. දිවි හිමියෙන් දහම් සරණ යන්න. දිවි හිමියෙන් ආර්ය සංඝයා සරණ යන්න. පංචශීල ප්‍රතිපදාවට පිවිසෙන්න. එකල්හි ඔබ සෝතාපන්න ඵලයේ පිහිටනු ඇත.

මෙය මුල් බුදුදහමෙහි ඇති ථෙරවාදීන් සිහිනෙන්වත් නොපිළිගන්නා ඉගැන්වීමකි. මේ ඉගැන්වීම ගැන කතා කරන්නට ගොස් මා ථෙරවාදීන්ගෙන් බැණුම් ඇසූ වාර අනන්තය. සෝතාපන්න අංගයන් සමාදන්වීමේ ක්‍රියාව ගැන සූත්‍ර පිටකයේ දෙපළකම සඳහන් වෙයි. ථෙරවාදීහු ඒ කරුණු තරයේම ප්‍රතික්ෂේප කරති. බුද්ධ දේශනය ප්‍රතික්ෂේප කරමින් ථෙරවාදීන් කරන විප්‍රකාරවලින් සිදුවනුයේ සද්ධර්ම අන්තර්ධානයට වැඩ සැලසීමයි. ථෙරවාදයට අභියෝග කිරීම ඔළුව ගලේ ගසා ගැනීමක් වැනියයි යමෙකුට හැඟී යාමට හැකිය. නැත. එය එසේ නොවේ. ථෙරවාදීන්ට මේ කියන ධර්ම කරුණුවලට අභියෝග කරනු තබා ඒවා තේරුම් ගැනීමට වත් නොහැකිය. ඔවුන් තවමත් සුපැහැදිලි නිවන් මඟ ගැන සැක කරනුයේ එබැවිනි.

ජනප්‍රිය බුදුදහම නම් වූ මඩ ගොහොරුව වියළවා දමා මුල් බුදුසමය නැවත ඇති කිරීමට තනි බලවේගයක් ලෙස එකමුතු වීමට සියලු බෞද්ධයන්ට මම ආරාධනා කරමි.



CS Scanned with CamScanner

# 02

# සෝතාපත්ති ඵල සමාපත්තිය ලොවට හෙළි කළ අබිසරුලිය

ක්‍රිකට් තරගවලින් අපේ කණ්ඩායම දිගින් දිගටම පැරදීම ගැන බොහෝ දෙනෙක් කනස්සල්ලෙන් සිටිති. සුද්දන් අපට හඳුන්වා දුන් ඒ ආගන්තුක ක්‍රීඩාව අගයන අතළොස්සක් රටවල් අතරට අපිද අයිතිව සිටිමු. අපි කලක් සුද්දන්ට වහල්ව සිටියෙමු. කායිකව ඔවුන්ගෙන් නිදහස් වුවද මානසිකව නිදහස් වීමට තරම් ශක්තියක් අපේ ඇත්තන්ට තවම ලැබී නැත. සුද්දන් විසින් බලෙන් ඈගේ ගසන ලද දේවල් ගැන කනගාටු වෙමින් කාලය කා දැමීමට තරම් පොදුජන විඥානය බොළඳ වීම පුදුමසහගතය. අපි ක්‍රිකට් ගැන කතාව අමතක කර මේ දිනවල ඇසෙන 'හොට්ම හොට්' නිවුස් එකක් ගැන අවධානය යොමු කරමු. ඊට පෙර කරදරකාරී අනාගමික මිත්‍රයකු ගැන පාඨකයන් දැනුවත් කිරීම සුදුසුය.

කිසිදු ආගමක් නොඅදහන, දෙවියන් තඹ දොයිතුවකට හෝ ගණන් නොගන්නා මිත්‍රයෙක් මට සිටියි. ඔහු උග්‍ර භෞතිකවාදියෙකි. ඔහු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අලුකුත්තේරුවෙකි.

දේව සංකල්පය යනු මිනිසුන්ගේ පොකැට්ටුව කැමති පරිදි හිස්කර දැමිය හැකි යාන්ත්‍රණයක් බව ඔහුගේ මතයයි. ඔහු කියන පරිදි අනුව දෙවියන් ලෝකය නිර්මාණය කළාය යන



Scanned with CamScanner

සංකල්පය මිනිස් ඉතිහාසය තුළ පතුරුවා හරින ලද වඩාත්ම අවාසනාවන්ත පණිවුඩයයි. ඔය කියන ලෝක නිර්මාපක දෙවියන් ගැන කතා නොකරන්නට, නොපෙනෙන දෙවියන් ගැන කතා නොකරන්නට ලෝකය සාමකාමී තැනක් වනු ඇති බව ඔහුගේ නිගමනයයි. දේව නිර්මාණවාදය පැලපදියම් කරනු පිණිස ඝාතනය කරන ලද අහිංසකයන්ගේ සංඛ්‍යාව පෘථිවියේ ජනගහණයට වඩා වැඩි බව ඔහු මට පසුගිය දිනක පෙන්වා දුන්නේය. මම ආගමික සංහිඳියාව අගයන බැවින් මිතුරාට බැණ වැදී එළවා දැමූයෙමි.

ඔය කියන මිත්‍රයා තරමක විහිළුකාරයෙකි. හේ පෙරේදා උදෑසන මා හමුවට පැමිණියේය.

"තවමත් ඔය මිථ්‍යාදෘෂ්ඨික අදහස් අතහැරගත්තෙ නැද්ද?" මම නිකං ඉන්න බැරිකමට ඔහුගෙන් ඇසීමි.

"අපොයි නෑ. මම හෙට කතරගම යනවා. දෙවියන්ට පූජාවක් තියන්න."

"මොකද එකපාරටම අංශක එකසිය අසූවකින් ආපස්සට හැරුණෙ?"

"මම දැන් දෙවියන් ඉන්න බව පිළිගන්නවා. අපට නැති දුරදක්නා නුවණක් දෙවියන්ට තියෙන බව මට දැන් හොඳටම විස්වාසයි. දෙවියන් විශ්වාසවන්තයන්ට උපදෙස් දෙන බවත් මට දැන් හොඳටම පැහැදිලියි."

"ඔහෙ පලයං. කවද ඉඳගෙනද දෙවියන් විශ්වාස කරන්න පටන් ගත්තෙ?"

"අද පාන්දර ඉඳගෙන."

"ඇයි අමුතු ප්‍රාතිහාර්යයක්වත් දැක්කද?"

"අද පාන්දර ප්‍රවෘත්ති බැලුවෙ නැද්ද? කතරගම දේවාලෙ ඇතුළෙ මහ ගෝරියක්. කවුදෝ කට්ටියක් යතුරක් හොයා ගන්න බැරිව ගහමරා ගන්නවා. අපි කවුරුත් වැඩ නවත්තල ඒ සිද්ධිය තමයි බලාන උන්නෙ."



Scanned with CamScanner

"ඉතින්, ඔය කලකෝලාහල දැකල කොහොමද දෙවියන් ගැන විශ්වාසයක් ඇතිවුණේ?"

"ඇයි ප්‍රවෘත්තියෙ හොඳ කොටහ ඇහුවෙ නැද්ද? යතුර ගන්න බැරුව කපුමහත්තුරු පොලීසි ගියා කියල කිව්වෙ."

මම අන්දුන්කුන්දුන් වී ගියෙමි. මිත්‍රයා කියන අප්‍රභංශය මට නොතේරේ. මම තවදුරටත් ඔහුට සවන් දෙමින් සිටිමි.

"මෙන්න මේකනෙ. කපුමහත්තුරු ඔය සිද්ධියෙදි ක්ෂණිකව නිවැරදි තීරණයට එළඹිලා පොලීසියට ගියානෙ. කපුමහත්තුරුන් දෙවියන්ගේ උපදෙස් ලබපු බව එයින්ම ඔප්පු වෙනවා. නැතිනම් ඔය වගේ සිද්ධියකදි දේවාල ගානෙ යන්නෙ නැතිව නුවණක්කාර තීරණයක් ගන්න පුළුවන් තව කී දෙනෙක් මේ රටේ ඉන්නවද?"

මිතුරා කොක්හඬලා සිනාසෙන්නට විය. ඔහු කී හරුපයේ අරුත මට තේරුනේ එවිටය. දේව කන්නලව් කිරීමට කතරගම යාමට බලාපොරොත්තු වන බැතිමතුන්ට සුබදායී ආරංචියක් සතිඅන්ත පුවත්පත්වල පළකර ඇති අයුරු දුටුවෙමි. ඒ අනුව කතරගම දේව අඩවියට පොලිස් ආරක්ෂාව ලැබෙනු ඇත. බැතිමතුන්ට දෙවිපිහිටත් දෙවියන්ට පොලීසියේ පිහිටත් ලැබේවා යනුවෙන් ප්‍රාර්ථනා කර අපි සාධුකාර දෙමු.

දැන් කතන්දර වාරය අවසන්ය. අපි යළි සුපුරුදු මාතෘකාවන්ට පිවිසෙමු. පිටසක්වළ බෝසත්වරුන් ගැන ලිවීම හදිසියේ නවතා දැමූයේ මන්දැයි සමහරු දිගින් දිගට මගෙන් විමසති. එය නැවතුමක් නොව කෙටි විරාමයකි. පිටසක්වළ බෝසත්වරුන්ගේ ආගිය කතා මේ වන විට ලියා අවසන්ය.

අපි සිරිපා ගමන වැනි හරි අපූරු ධර්ම මාර්ගයකට අවතීර්ණ වී සිටිමු. බෝධිසත්ව කතා පෙළ ගමනාරම්භය සටහන් කරන මකර තොරණක් වැනිය. අපි මකර තොරණ



Scanned with CamScanner

පසුකර සෝවාන් මාර්ගය නම් වූ ශීතගඟුලෙන් දිය නා ගතිමු. මාර්ගඵල නම් මාතෘකාව ඔස්සේ අපට තව බොහෝ දුරක් යාමට ඉතිරිව ඇත. එනමුත් මෙතැන් සිට ඉදිරියට ඇති මාතෘකාවන් මහගිරිදඹය හා සමකළ හැකිය.

බෝසත්වරුන් මා හට එළිකළ ධර්ම කරුණු අතිශය ගාම්භීරය. ඒවා ආර්ය මාර්ගය හා ඍජුවම සම්බන්ධ වෙයි. ආර්ය මාර්ගය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් තොරව ඒ කරුණු කිසිවකු විසින් වටහාගත නොහැකිවනු ඇත. බෝධිචර්යාව, අපායේ නොවැටී සසර තරණය කිරීම, කාලතරණ යෝගය, සම්බුද්ධ ශාසනයේ හටගැනීම හා අභාවය, භව්‍ය හා අභව්‍ය මරණීය හේතු, දියසේනයන්ගේ ශාසනික සේවාව, අන්තරාභවය පිළිබඳ රත්නසම්භවයන්ගේ ඉගැන්වීම්, සුබාවතී වැසියන්ගේ යුධෝපක්‍රම, අක්ෂෝභ්‍යගේ පාලන තන්ත්‍රය, මනුෂ්‍යයන්ගේ ආයුෂ වර්ධනය පිළිබඳ රහස් යන මාතෘකා රැසක් ඔස්සේ තවත් පිටු දහස් ගණනක් ලිවීමට ඉතිරිව ඇත.

මේ ලැයිස්තුවට අයත් සමහර ඉගැන්වීම් ප්‍රසිද්ධ කිරීමට කාලය තවම පැමිණ නැත. නිසි කල්හි ඒ සියලු දෙය නොවළහා හෙළි කරමි. බෝසතුන් විසින් මෙතරම් විශාල ධර්ම කරුණු රැසක් මා වෙත ලබා දී ඇත්තේ නුදුරු කල්හි එළඹීමට ඉඩ ඇති ශාසන අන්තර්දානය වළකනු පිණිසය. බෝසත්වරුන් ශාසන අන්තර්දානය වළකනු පිණිස ගිහියකු වෙත පැමිණ මෙවැනි දේශනාවන් කරන ලද්දේ මන්ද යන ප්‍රශ්නයට පිළිතුරු දීම හිතාමතාම කල් තැබීමි. දැන් ඊට පිළිතුරු සැපයීමට කල් එළඹ ඇත.

යම් කෙනෙකු බුද්ධ ශාසනය දෙකඩ කරන්නට උත්සාහ කිරීම බලගතු පාපයකි. ඒ උත්සාහයේ ප්‍රතිඵලය ලෙස ශාසනය දෙකඩ වුවහොත් සංඝ භේදයද සුළු පිරිසක් වෙන් වුවොත් සංඝ සෝධියද සිදු වෙයි. සංඝ භේදයේ ප්‍රතිඵලය අතිභයානකය. සංඝ භේදයෙන් බුද්ධ ශාසනය අන්තර්දානයට



CS Scanned with CamScanner

වැඩ සැලසෙයි. සංඝ භේදය කරන තැනැත්තා ආනන්තරිය පාපකර්මයක් සිදුකරගෙන මරණින් මතු අවීචි මහා නිරයේ උපදියි.

යම් භික්ෂූන්වහන්සේ නමක් බුදුසසුනෙහි චිරස්ථිතිය කැමතිව භේද වූ ශාසනය එක් කිරීම ඇරඹුවහොත් "නුඹලාගේ ප්‍රතිපත්තීන් වැරදිය. මෙයයි නියම ශාසන සම්ප්‍රදාය" යනුවෙන් දුස්සීලයන්ට දොස් කීමට සිදුවෙයි. එකල්හි දුස්සීලයෝ වෙන්ව යති. වෙන්ව ගොස් වෙනම විනය කර්ම කරති. එයින් ශාසන භේදයක් සිදුවෙයි. බුද්ධ ශාසනය මෙතරම් අවුල් වී ගියේ දෙවැනි ධර්ම සංගායනාවේදී ඇතිවූ එයාකාර භේදයක් නිසාය.

භේදයක් ඇති නොකර ශාසන ප්‍රතිශෝධනයක් ඇති කළ හැකි වනුයේ ගිහියකු විසින්ම පමණි. ඔහුට පිල් බෙදීමකින් තොරව හෙමි හෙමිහිට සිය මතය සමාජගත කර භික්ෂූන්වහන්සේලා තනි බලවේගයක් වනතුරු ඉවසිලිවන්තව ක්‍රියා කළ හැකිය. මා විසින් දැනට කරගෙන යනුයේ ඒ අපූර්ව ක්‍රියාදාමයයි.

තනි බුදුසසුනක් බිහිකිරීමේ ක්‍රියාදාමය මාගේ ජීවිත කාලය තුළ අවසන් වීමට හෝ නොවීමට ඉඩ ඇත. එය මට ගැටලුවක් නොවේ. කවුරුන් හෝ ඉදිරියට පැමිණ මා නැවැත්වූ තැනින් ඒ සත්කාර්යය ආරම්භ කරනු ඇත. බාගෙවිට මාගේ උත්සාහය අසාර්ථක වනු ඇත. එයද මට පෞද්ගලික ගැටලුවක් නොවේ. මන්දයත් ඒ ක්‍රියාදාමය ඇරඹීම තුළින් කිසිදු පෞද්ගලික ප්‍රතිලාභයක් මා අපේක්ෂා නොකරන බැවිනි.

ධර්ම මාර්ගය, මාර්ගඵල, ධ්‍යාන හා සමාපත්ති වෙත පැමිණීමට කැමති සත්පුරුෂයන් වේ නම් කල් නොයවා සිය උත්සාහය අරඹන මෙන් කාරුණිකව ඇරයුම් කරමි. මා බෝසත්වරුන්ගෙන් දැනගත් පරිදි මෙකල්හි ඇතිවන ශාසන ප්‍රබෝධයෙන් පසු එළඹෙනුයේ අභාග්‍යසම්පන්න



Scanned with CamScanner

කාලසීමාවකි. මතු මෛත්‍රී බෝසතුන් බුද්ධත්වයට පත්වන තෙක්ම අලුතින් මාර්ගෝපදේශකයකු නොඑන බව බෝසත්වරු කියති.

දැනට ක්ෂීරපථ මන්දාකිණිය තුළ වැඩ වාසය කරන බුදුවරුන් වහන්සේලා තුන් නමක් ගැන බෝසත්වරුන්ගෙන් දැනුවත් වීමි. අමිතාභය බුදුන්වහන්සේ, පාරම්භ බුදුන්වහන්සේ හා තෛලෝකරාජේශ්වර බුදුන්වහන්සේ යනුවෙන් උන්වහන්සේලා අමතනු ලැබෙති. මේ කාලසීමාවෙහිදී සමථ විදර්ශනා භාවනා කරන අයට උන්වහන්සේලාගේ නොමසුරු පිහිට ආධාර ලබා ගත හැකිය.

අතිශය පෞද්ගලික හා ලෞකික ප්‍රශ්නවලදී පවා මැදිහත්ව උපකාර කිරීමට සූදානමින් සිටින බෝසත්වරු කිහිප දෙනෙක් විශ්වයේ සිටිති. විමලා ලෝකයේ වැඩවසන වජ්‍රසත්වතුමාද සාගලෝකයේ සුරූපී වජ්‍රයෝගිනියද කම්මැලියකු වූ අක්ෂෝභ්‍ය කුමාරයාද භාවනා බලයෙන් පහසුවෙන් සම්බන්ධ කරගත හැකිය. රත්නසම්භව හා අමෝඝසිද්ධි යන බෝසත්වරු දෙපළද සමන්තභද්‍ර මුනිවරයාද ඈත විශ්වයේ සිට අප ගැන විමසිල්ලෙන් සිටිති.

උන්වහන්සේලා මහායාන බෝසත්වරුන් නොවේ. මහායානය බුද්ධ ශාසනයේ කොටසක්ද නොවේ. මහායානයත් ථෙරවාදයත් යන දෙකම ශාසනයේ විනාශය පිණිස හටගත් සද්ධර්ම ප්‍රතිරූපකයන් දෙකකි. නිවැරදි බුදුදහම වනුයේ පුරාණ ත්‍රිපිටක ධර්මයන්හි ඇති ඉගැන්වීම් සමුදායයි.

ධර්මය දැන අවබෝධ කරගැනීමේ සාමාර්ථ්‍යය අනුව පුද්ගල කොට්ඨාස හතරක් වෙති. උද්ඝටිතඥ, විපටිතඥ, ඥෙය්‍ය හා පදපරම යනු ඒ පුද්ගල කොට්ඨාස හතරයි. උද්ඝටිතඥ පුද්ගලයා බණ පදයක් දෙකක් ඇසූ කල්හි එය සිය දහස් වාරයක් ගැඹුරෙන් තේරුම්ගෙන වහා ධර්මාවබෝධය ලබයි. විපටිතඥ පුද්ගලයා දේශනාවසානයේ මාර්ගඵලාවබෝධය ලබයි. ඥෙය්‍ය පුද්ගලයා බොහෝ කලක්



Scanned with CamScanner

උත්සාහ කර එතැනට පත්වෙයි. පදරම පුද්ගලයා කෙතෙක් ධර්මය ඇසුවද මාර්ගඵල නොලබයි.

පදපරම පුද්ගලයාට ධර්ම මාර්ගයේ වටිනාකම නොතේරෙයි. සද්ධර්මය ඇසීමේ දුර්ලභකම නොතේරෙයි. මේ ආත්මභාවයේම උත්සාහ කර මාර්ගඵල ලබා ගැනීමේ වැදගත්කමක් ඔහු නොදකියි. ඔහු ආර්යයන් නොහඳුනයි. ඔහු ආර්ය මාර්ගය දේශනා කරන අයට නොයෙකුත් අභූත චෝදනා එල්ල කරයි. ඔහු පංචකාම සම්පත්වල ගුණ දකියි. ඔහු සසර පිළිබඳ වර්ණනාවන් කැමැත්තෙන් අසයි. නිවන පිළිබඳ වර්ණනාවන් ඔහුට අප්‍රියය.

අද සමාජයේ වෙසෙන බෞද්ධයන්ගෙන් අති බහුතරයක් පදපරම ගණයට වැටෙන බව අමුතුවෙන් කිව යුතු නොවේ. රසකර කියන කාලීන බණ ඇසීමට වැඩි දෙනෙක් කැමති වෙති. නිර්වාණගාමී මාර්ගය කියන විට බණ නොතේරෙන බව කියා ඉවත යති. හුරතල් කරමින් කියන බණ ඇසීමට කැමති වෙති. ගාම්භීර ධර්ම කරුණු අදට නොගැළපෙන බව කියති. එවැනි පදපරම පුද්ගලයන්ගෙන් බුදුසසුනට එල්ලවන හානිය සුළුපටු නොවේ.

මාර්ගඵල ලැබීමේ ප්‍රතිපදාව ගැන මුලින්ම හෙළිකරද්දී සමහරු මාගේ ජීවිතයට තර්ජන එල්ල කරමින් ක්‍රියා කළහ. ඔවුහු තමන් කරන ඒ පාප කර්මයේ විපාක නොදැනම ධර්ම මාර්ගය එළිකිරීමට විද්‍යුත්මාධ්‍ය මගින් මා හට ජීවිත තර්ජන එල්ල කළාය. අදවන විට ඒ පාප කර්ම විපාක දීම ඇරඹී ඇතැයි කිව හැකිය. අද ඔවුහු දඟගෙට යති. නැවත එළියට එති. යළිත් ඇතුළට යති. එළියට එති. තමන් ආර්යෝපවාද පාපර්මයට හසුව ඇති බව ඒ අවාසනාවන්තයෝ නොදනිති.

මා ගැඹුරු භාවනා අභ්‍යාස කරන කාලවකවානුවලදී දෙවියන්ගේ උදව් නිතරම ලැබුණි. අද මට ඒ ඉස්පාසුව නැත. එනමුත් දැනට වසර පහකට පමණ පෙරදී මා ලද ඒ අත්දැකීම් ලියා තැබීම ප්‍රයෝජනවත් විය හැකිය.



Scanned with CamScanner

දිනය හා වර්ෂය මට අමතකය. එක්තරා දෙවියෙක් මා ඉදිරිපිට සිටියි. ඒ දෙවියා මා සමඟ ධර්ම සාකච්ඡාවට පැමිණියෙකි. මම බොහෝ ප්‍රසිද්ධ ස්වාමීන්වහන්සේ කෙනෙකුගේ ගුණ කීමි. දෙවියා ඒ ගුණ කතාවට වැඩි යමක් එක් කළේය.

"හපොයි උන්වහන්සෙට වෙන දේ."

"ඇයි උන්වහන්සේට මොකක්ද වෙන්නෙ?"

"උන්වහන්සෙ මරණින් මතු අවීචි මහා නිරයේ උපදිනවා."

"ඇයි ඒවගේ හොඳ කෙනෙක් මරණින් මතු අපාගත වෙන්නෙ."

"සංඝයා වහන්සේලා අතර බෙදීමක් ඇති කළ නිසා. උන්වහන්සේ සංඝභේද ආනන්තරිය පාප කර්මයට අහුවෙලයි ඉන්නෙ."

"තව ඒ වගේ අවස්ථා කීයක් පෙන්නුම් කරනවද?"

දෙවියා නම් ලැයිස්තුවක් කියාගෙන ගියේය. එක්තරා උගත් ස්වාමීන්වහන්සේ නමක් අයථා මුදල් පරිහරණයෙන් අපාගත වන බව දෙවියා කීය. තවත් ස්වාමීන්වහන්සේ නමක් අපාගත වනුයේ ආර්යෝපවාද පාපකර්මයේ ප්‍රතිඵලයක් හැටියටය. උන්වහන්සේ මරණින් මතු උපදිනුයේ පෘථිවියෙන් ඈත පිහිටි ශීතල නිරයකය. එහි ආයු කාලය කල්ප දහසයකි. මම මේ සිද්ධීන්ට අදාළ භික්ෂූන්වහන්සේලාගේ නම් ගම් ප්‍රසිද්ධියේ හෙළි නොකරමි. එබැවින් ඒ කරුණු පිළිබඳ විමසීමෙන් වළකින මෙන් සහෘද පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමි.

බුද්ධ ධර්මය ගැන කතා කිරීමේදී අප වඩාත් ප්‍රවේසම් විය යුතුය. ධර්ම මාර්ගය වඩන්නවුන් මාර්ගඵල ලැබ තිබීමට වැඩි ඉඩක් ඇත. මාර්ගඵල නොලද අය ආර්යෝපවාද



Scanned with CamScanner

පාපකර්මය කළොත් මතු නිරයේ උපදිති. වැරදීමකින් හෝ මරණින් මතු නිරයට ගියොත් යළි මෙලොවට ඒම සිහිනයක් පමණි. එසේම පෘථග්ජනයෝ අතිබහුතරයක් මරණින් මතු සතර අපායෙහිම උපදිති. මාර්ගඵල ලාභීන්ට අපහාස කරන අය නිරයට යාමට බලපත්‍ර ලබති. ඔවුන් වෙන පවක් නොකළත් නිරයට යාමට ඒ පව හොඳටම ප්‍රමාණවත්ය.

මා මෙතෙක් සෝවාන් මාර්ගය විස්තර කළේ බුද්ධ දේශනයට අනුකූලවය. සෝවාන් මාර්ගය ගැන ශාස්ත්‍රීය පටලැවිලි බොහොමයක් ඇති බව කලින් කල මතක් කළෙමි. ඒ පටලැවිලි සියල්ල පෘථග්ජන ආචාර්යවරුන් විසින් මාර්ගඵල පැහැදිලි කිරීමේදී ඇතිවන දෝෂයන් බව සැලකිල්ලට ගත යුතුය.

බුදුන්වහන්සේගේ ඉගැන්වීමෙහි පරිදි මාර්ගඵල ලාභියකු හැර අන් කිසිවකු අභිධර්ම වේදල්ල යන ධර්ම කොට්ඨාස ඉගැන්වීමට නොයා යුතුය. වේදල්ල යනු මාර්ගඵල සමාපත්ති ආදී ශාසන ඵලයන් පිළිබඳ විස්තර කෙරෙන කොටසයි. පෘථග්ජනයන් අභිධර්ම වේදල්ල ධර්ම කොට්ඨාස ගැන කතා කරන කාලයේදී ඒ ධර්ම කොට්ඨාස දෙකම අතුරුදන් වන බව බුද්ධ දේශනයේ දැක්වෙයි.

අභිධර්ම වේදල්ල යන ධර්ම කොට්ඨාස දෙකෙන් ආරම්භ වන ශාසන අන්තර්ධානය ජාතක කතාවලින් හා දානයේ ගුණකතාවලින් සම්පූර්ණ වනු ඇතැයි දේශනා කර ඇත. ශාසන අන්තර්දානයට ළංවූ කල්හි ජාතක කතා හා දානයේ ආනිසංස ගැන කියන කතා බහුල වන්නේය යන කරුණ හොඳින් සිත්හි තබා ගැනීම වැදගත්ය.

දැන් අපි ථෙරවාදීන් ආර්ය මාර්ගය පටලවාගත් අයුරු දැන ඉගෙන ගනිමු. මෙය තරමක් සංකීර්ණ මාතෘකාවකි. එබැවින් මෙතැන් පටන් ඇති දේ වඩාත් ඉවසිලිමත්ව කියවන මෙන් කාරුණිකව ඉල්ලමි.



Scanned with CamScanner

ථෙරවාදීන්ට අනුව සෝවාන් මාර්ගයෙහි සිටින්නකු නැත. ථෙරවාදී විශ්වාසය අනුව සෝවාන් මාර්ගය යනු සෝවාන් මාර්ග චිත්තය නම් වූ 'චිත්තක්ෂණයක් තරම්' කුඩා කාල පරාසයකි. එනමුත් සූත්‍ර පිටකය අනුව සෝවාන් මාර්ගයේ ගමන් ගන්නා දෙදෙනෙක් වෙති. ඒ සද්ධානුසාරී සහ ධම්මානුසාරී පුද්ගලයන් දෙදෙනාය.

ථෙරවාදී ක්‍රමය අනුව සෝවාන් වීමට විදර්ශනා ඥාන නවයක් ලැබිය යුතුය. මූලික සූත්‍ර අනුව සෝවාන් වීමේදී උදයව්‍යයඥානය පමණක් ප්‍රකටව සලකා බලනු ලැබෙයි.

ථෙරවාදී ක්‍රමය අනුව සෝවාන් වීම සඳහා විදර්ශනා භාවනාව කළ යුතුය. මූලික සූත්‍ර අනුව ධර්ම දේශනය, ධර්ම ශ්‍රවණය, ධර්ම සාකච්ඡාව, ධර්ම කරුණු විමසා බැලීම හා විදර්ශනා වැඩීම යන කවර හෝ ක්‍රියාවක් තුලින් මාර්ගඵල හතරටම පැමිණිය හැකිය.

ථෙරවාදී ක්‍රමය අනුව මාර්ගඵල ලැබීම පිළිබඳ කාලභේදයක් ඇත. එබඳු කාලභේදයක් පැනවීම මූලික බුදුදහමට එකඟ නැත. යම් කලෙක සද්ධර්මය විද්‍යමානද එකල්හි මාර්ගය වඩනු කැමති පිරිස් වේද එකල්හි උත්සාහ කරන්නවුන් මාර්ගඵල වෙත පැමිණීම අනිවාර්යයෙන්ම සිදු වන්නේය.

ථෙරවාදී ක්‍රමය අනුව සෝවාන් වීමටත් දස පාරමිතා බලය තිබිය යුතුය. මූලික බුදුදහම අනුව සෝවාන් වීමට පෙර පින් තිබිය යුතු නමුත් දස පාරමීදම් පුරා තිබිය යුතු බවට යෝජනා නොකෙරෙයි. පාරමිතා කතාවත් පසුකාලීන ඉගැන්වීම් වේ.

ථෙරවාදී ක්‍රමය අනුව මාර්ගඵල ලැබීමට ගුරු ඇසුර අනිවාර්යයය. මාර්ගඵල ලද්දා ඒ බව හෙළි කළ යුත්තේ තම කර්මස්ථානාචාරීන්වහන්සේ වෙතය. නමුත් මූලික බුදුදහම අනුව ධර්මය ගුරුතැන්හි තබා ඇත. ගුරු ඇසුර නොමැතිව මාර්ගඵල ලද අවස්ථා ගැන විස්තර ගණනාවක්ම සූත්‍ර



Scanned with CamScanner

පිටකයේ දැක්වෙයි. සාල්හ නම් භික්ෂුව තනිව විදසුන් වඩා රහත්ව පිරිනිවන් පෑම එවැනි සිද්ධියකි. මගියකුගෙන් බණ අසා තනිව භාවනා කර සෝවාන් වූ කෙල්ලක ගැන බුද්ධක නිකායේ සඳහන් වෙයි.

ථෙරවාදී ක්‍රමය අනුව සෝවාන් ඵලයට පැමිණි තැනැත්තාට ඒ ඵලය ඔප්පු කර පෙන්වනු පිණිස ප්‍රත්‍යවේක්ෂා නම් වූ ඥාන පහළ වෙයි. මූලික බුදුදහම තුළ සෝතාපන්න ඵල ප්‍රත්‍යවේක්ෂාවක් නොමැත. ඒ වෙනුවට ධම්මාදාස නම් ස්වයංපරීක්ෂණ ක්‍රමයක් යෝජනා කර ඇත.

ථෙරවාදී සෝවාන් මාර්ගයෙහි සෝතාපන්න අංග වෙත පැමිණීමක් ගැන සඳහන් නොවේ. ථෙරවාදී ආචාර්යවරුන් සෝතාපන්න අංගයන් ගැන මුනිවත රකින බව පෙනෙයි. මුල් බුදුසමයෙහි සෝතාපන්න අංග සමාදන් වී සෝවාන් විය හැකි බව කියැවෙයි. මේ කරුණ සූත්‍ර පිටකයේ දෙපළකම ඇති බැවින් අත්වැරදීමකින් තල්පත්වල ලියැවුණු දෙයක් විය නොහැකිය.

ථෙරවාදී ක්‍රමය අනුව සෝතාපන්නයන් සියලු දෙනාම ඵලසමාපත්ති ලාභීහු වෙති. මූලික බුදුදහමෙහි සෝතාපන්න ඵල සමාපත්තිය ගැන ඇත්තේ දෙපළක පමණි. සෝතාපන්න ඵලසමාපත්තියට සමවැදීමට හැකි අයකු ගැන දක්වා ඇත්තේ එකම උදාහරණයක් පමණි. ඒ තැනැත්තිය නම් සිරිමා නම් ගණිකාවයි. සිරිමා ගණිකාව සෝතාපත්ති ඵල සමාපත්තිය ගැන කළ හෙළිකිරීම නොවන්නට ඒ ධර්ම කරුණු යටපත්ව යාමට බොහෝ ඉඩ තිබුණි. කෙසේ නමුත් මූලික අභිධර්මය අනුව කුප්පසත්ත නම් මාර්ගඵල ලාභීන්ට සිත සමාධිගත කළ නොහැකිය. එබැවින් සෑම මාර්ගඵල ලාභියකුම ඵල සමාපත්ති සුවය භුක්ති විඳින්නේය යන කියමන බෙහෙවින්ම අසාධාරණය.

සෝතාපන්නයන්ට විවිධ ප්‍රාතිහාර්ය පෑ හැකි බවට අට්ඨකථාවන්හි මතවාද ඉදිරිපත් කර ඇත. රහතන්වහන්සේලා



CS Scanned with CamScanner

අතර පවා ප්‍රාතිහාර්ය පෑමට නොහැකි පුද්ගලයින් සිටි බව සුසීම සූත්‍රය හා පවාරණ සූත්‍රය අනුව පැහැදිලි වෙයි.

ථෙරවාදය අනුව මාර්ගඵල ලාභියා ඒ බව හෙළි නොකළ යුතුය. මූලික බුදුදහම අනුව තම මාර්ගඵල ලාභය අන්‍යයන්ට හෙළිකර අන්‍යයන්ද ඒ මඟ යැවීම මාර්ගඵල ලාභීන්ගේ පරම යුතුකමයි. ඒ බව ලෝහිච්ච සූත්‍රයේ පැහැදිලිව දැක්වෙයි.

ඉහත විස්තරය තුළින් යෝජනා කෙරෙන නිගමනය අතිශය පැහැදිලිය. ථෙරවාදී ආචාර්යවරුන් විසින් මුල් බුදුසමයෙන් ටිකකුත් ආචාර්ය මතවාද බහුතරයකුත් මිශ්‍ර කර අලුත් සෝවාන් මාර්ගයක් නිර්මාණය කළේය යන්න ඒ නිගමනයයි. අද වන තුරු මෙරට භාවනා මධ්‍යස්ථානයන්හි නිල වශයෙන් පිළිගැනෙනුයේ ථෙරවාදී න්‍යායයි. අද මෙරට බලපැවැත්වෙනුයේ ථෙරවාදී ව්‍යවහාරයයි.

මෙරට අවසන් රහතන් වහන්සේ වශයෙන් ථෙරවාදී පොත්වල දැක්වෙන මලියදේව මහරහතන්වහන්සේ අදින් දෙදහස් වසරකට එපිට වැඩ වාසය කළ බව ශාසන වංශ කතාවන් අනුව පෙනී යයි. මාර්ගඵල ලාභීන් බිහිකරන මාර්ගය දෙදහස් වසරක් තිස්සේ වසා දමනු ලැබීමට ථෙරවාදී න්‍යායයන් හේතුවූ බව ප්‍රකටව පෙනෙන්නට ඇත. තවදුරටත් ථෙරවාදී න්‍යාය කරපින්නාගෙන සිටියොත් ශාසන අන්තර්දානය ළඟදීම සිදුවනු ඇත. ඒ ගැන කථා දෙකක් නොමැත. එබැවින් සියලු බෞද්ධ භික්ෂූන්වහන්සේලා තනි බලවේගයක් ලෙස එක්වී මුල් බුදුසමය නැවත පිහිටුවනු පිණිස සම්මුතියට පැමිණිය යුතුය.



CS Scanned with CamScanner

# 03

## සෝවාන් වීමේ විවිධ ක්‍රම දහසකි

ජනවහරෙහි යෙදෙන සමහර වදන් ලේඛන සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙනුයේ කලාතුරකිනි. එනමුත් සමහර ග්‍රාම්‍ය වදන්වලට පැහැදිළි හා නිශ්චිත තේරුම් ඇත. කවුරුන් හෝ තවෙකකුගේ මොළය 'මඤ්ඤං' වී ගිය බව කියනු මා සමහර විට අසා ඇත. පාළි භාෂාව අනුව මඤ්ඤණය යනු වරදවා හඳුනා ගැනීමයි. නැතහොත් වැරදි වැටහීම් වෙත පැමිණීමයි. ඒ අනුව මොළය මඤ්ඤං වී ඇතැයි කියනුයේ වැරදි වැටහීම්වලට පැමිණ ඒ මත ක්‍රියා කරන්නට ගොස් පොට වරද්දාගත් විටකදීය. මා දැන් කියන්නට යන්නේ මොළය ටිකක් විතර මඤ්ඤං වෙන කතාවකි.

හැම දෙවියන්ටම පතුරු යන්න බණින අලුකුත්තේරු අසමජ්ජාති මිත්‍රයෙක් මට සිටියි. මා ඔහු හා සමාගමයට කැමති නැත. නමුත් ඔහු එල්ලි එල්ලී මා හා විවාදයට එයි. ලෝකපාලක දෙවියන් සිටී නම් ලෝකයේ මෙතරම් ස්වාභාවික විපත් ඇතිවූයේ කෙසේද යන්න ඔහු මගෙන් නිතර විමසයි. ශාසනාරක්ෂක දෙවියන් වැඩ සිටින්නේ නම් බුදුසසුන වනසන බලවේග නසා දැමීමට ඔවුන් ක්‍රියා කරන්නේ මන්දැයි ඔහු මගෙන් අසයි.

ඔහුට විරුද්ධව ආගම් පොලීසියට ගොස් පැමිණිලි කිරීමට මට විටෙක සිතේ. එහෙත්, ඔහු සමග තර්ක කර දිනන්නට බැරිබව හොඳාකාරව දන්නා බැවින් මම හෙමින් සීරුවේ ලිස්සා යමි. ඔය කියන අලුකුත්තේරු මිත්‍රයා



Scanned with CamScanner

පසුගිය සතියේ පත්තර පිටු කැල්ලක්ද රැගෙන මා හමුවට පැමිණියේය.

"මේ බලනවකො මෙයා කියන කතාව."

"මෙයා කිව්වෙ කවුද?"

"ස්ටීවන් හෝකිංස්."

ස්ටීවන් හෝකිංස් යනු ඇල්බට් අයින්ස්ටයින්ට තරගයක් දිය හැකි එකම භෞතික විද්‍යාඥයාය. ඔහු විසිවන සියවසේ ලොව පහළ වූ බුද්ධිමත්ම මිනිසා ලෙස බටහිර රටවල පිළිගැනීමට ලක්ව සිටියි.

"හෝකිංස් මොනවද කියන්නෙ?"

"එයා කියනවා දෙවියො කියල කෙනෙක් නැතෙයි කියල."

"හා. ඒ කොහොමද එහෙම කියන්නෙ?"

"එයා අපෙන් අහනවා ලෝකය නිර්මාණය කළේ දෙවියන් නම් ලෝකය නිර්මාණය කිරීමට පෙර දෙවියන් වැඩ සිටියේ කොහේද කියල?"

"මාර ප්‍රශ්නයක්නෙ ඒක. හැබෑට ලෝකෙ නිර්මාණය කරන්න කලින් දෙවියො වැඩ සිටියෙ කොහේද?"

මම මිත්‍රයාගෙන් ඇසීමි. එවිට ඔහුගේ මුහුණ රතුවිය. හේ ප්‍රකෝපකාරී ලෙස මා දෙස බැලීය.

"ඔය ප්‍රශ්නෙට උත්තරේ දන්නවනම් මම ඔහේගෙන් අහන්න එනවද? ඔහේල ලෝක පාලක දෙවියො ගැන කිය කිය ගහමරා ගන්න කලින් ඔය ප්‍රශ්නෙ විසඳගෙන ඉන්න එපායැ."

හේ පත්තර පිටුව මා දෙසට දමා ගසා යන්නට ගියේය. මම දුරකථන නාමාවලිය අතට ගෙන ආගම් පොලීසියේ අංකය සොයමින් වෙහෙසුණෙමි. ඒ අර කියන අසමජ්ජාති

මිත්‍රයාට එරෙහිව පැමිණිලි කිරීමට නොවේ. ස්ටීවන් හෝකිංස් නම් විද්‍යාඥයාට එරෙහිව වහාම විමර්ශනයක් ආරම්භ කරන මෙන් ඉල්ලා සිටිනු පිණිසය.

මා ඒ කතාව ලීවේ මෙතැන් සිට කියන්නට යන වැදගත් මාතෘකාවට ඍජු ප්‍රවේශයක් සපයනු පිණිසය. දැන් අපි මඤ්ඤණය නම් ක්‍රියාව වෙත යොමු වෙමු. මඤ්ඤණය යනු මනසට අයත් ක්‍රියාවකි. ඇස කන නාසය ආදී කොටගත් පංචේන්ද්‍රියයන් හරහා රූප ශබ්ද ආදී සංවේදයන් අප වෙත ළඟා වෙයි.

ඇස ඉන්ද්‍රියයකි. ඇස තුළ එක්තරා ඔපවත් ස්වභාවයක් ඇත. අභිධර්මයේදී චක්ෂු ප්‍රසාද රූපය යන නම ඊට යෙදෙයි. බාහිර රූපය ඇස කරා පැමිණ චක්ෂුප්‍රසාදය නම් ඔපයෙහි ගැටෙයි. ඇසෙහි පවත්නා ඔපයත් බාහිර රූපයත් ගැටුණු තැන්හි තවත් අපූරු දෙයක් වෙයි. එම ගැටීමේ ක්‍රියාව නිසා රූප විඤ්ඤාණය උපදියි.

විඤ්ඤාණය යනු 'දෙයක්' නොව ක්‍රියාවක ඵලයකි. ආර්ය මාර්ගයේ ගමන් ගන්නා බොහෝ දෙනෙක් මෙතැන්හිදී වරදවා ගනිති. මාගධී භාෂාවෙන් ජාන යනු දැන ගැනීමයි. ජානාති යනු දැන ගැනීම නම් ක්‍රියාවයි. විජාන යනු ඉන්ද්‍රිය ගෝචර වශයෙන් දැන ගැනීමයි. ඉන්ද්‍රිය ගෝචර වශයෙන් දැන ගැනීම යන ක්‍රියාවේ ප්‍රතිඵලය විඤ්ඤාණයයි.

අභිධර්මය නොදත් කෙනෙකුට මේ කියන දෙය නොවැටහෙන්නට ඉඩ ඇත. නමුත් එහි ඇත්තේ ඉතා සරල අර්ථයකි. අප යම් දෙයක් දකින්නේ නම් 'දැක්කා' යන ප්‍රතිඵලය 'රූප විඤ්ඤාණය' යි.

(අවශ්‍ය කෙනෙකුට දැන ගැනීම සඳහා මෙකී ක්‍රියාවලිය අභිධර්ම ක්‍රමය අනුව සම්පූර්ණයෙන් පහදා දීමටද හැකිය. සෝවාන් මාර්ග ඥානය උපදවා ගනු පිණිස ඒ විස්තර විභාග අත්‍යවශ්‍ය නොවන මුත් උසස් මාර්ගඵල ලැබීමේදී ඒ දැනුම අත්‍යවශ්‍ය වනු ඇත. මෙතෙක් සෝවාන් මාර්ගය



CS Scanned with CamScanner

උපදවා නොගත් පින්වතුන් මෙහි වරහන් තුළ ඇති කොටස අත්හැර ඉදිරියට කියවාගෙන යාම සුදුසුය. සෝවාන් ඵලයට පැමිණියේය යන හැඟීම ඇතිවූ පසු මෙතැන් සිට වරහන් තුළ ඇති කොටස කියවා තේරුම් ගැනීමට උත්සාහ කිරීම මැනවි.

ඇස නම් වූ ඉන්ද්‍රියයට බාහිර රූපය ස්පර්ශ වීමේ ක්‍රියාව ආරම්භය ලෙස සලකමු. චක්ෂු ප්‍රසාද රූපයෙහි බාහිර රූප සංඥාව ගැටීමෙන් එහි ඔපයෙහි වෙනසක් හටගනී. ඒ හා සමඟම චෛතසික ධර්ම පහක් එක පෙළට හටගනී. එම චෛතසික ධර්ම පහ වනුයේ ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, මනසිකාර යන ඒවාය. ඵස්ස යනු බාහිර රූප සඤ්ඤාව ප්‍රසාද රූපයේ ගැටීමේ ක්‍රියාවයි. එය ඉතා පැහැදිලි දෙයකි. මෙයාකාරයෙන් ඵස්සය හෙවත් අරමුණ ස්පර්ශ වීමත් සමඟ වේදනා හෙවත් වින්දනය සිදුවෙයි. වින්දනයෙහි සැප දුක් උපේක්ෂා යනුවෙන් ප්‍රභේද තුනක් වෙයි. ඒ හා සමඟම සඤ්ඤා හෙවත් හඳුනා ගැනීම සිදුවෙයි. මෙතැන්හි සඤ්ඤාව යනු චෛතසික ධර්මයකි.

බාහිර රූපය මගින් උපදවන රූප සඤ්ඤාව තවදුරටත් රූප්පනය හෙවත් වෙනස් වන බැවින් එය නාම ධර්මයක් නොවේ. බාහිර රූප සංඥාව ධර්මයන්ට පෙරටුව ගමන් කරන බැවින් රූප ධර්මයකි. රූප ධර්මයෝ නාම ධර්මයන්ට පෙරටුව ගමන් කරති. රූප්පනය හෙවත් වෙනසට ලක් වීම රූප ධර්මයන්ගේ ස්වභාවයයි. මා කරන මෙකී විග්‍රහය 'නාම රූප ව්‍යවස්ථාපන ඥාණය' නොලද කෙනෙකුට තේරුම් යාමට ඉඩක් නැත.

සඤ්ඤා නම් චෛතසික ධර්මය හා සමඟ 'චේතනා' නම් වූ අරමුණෙහි රසය විඳින චෛතසික ධර්මයක් පහළ වෙයි. චේතනා චෛතසික ධර්මය 'අභිසංස්කාර' යනුවෙන්ද හඳුන්වනු ලැබෙයි. චේතනා චෙතසික ධර්මය මතු විපාක උපදවයි. කර්ම රැස්කිරීම යනුවෙන් හඳුන්වනු ලබන්නේ



CS Scanned with CamScanner

චේතනාව හට ගැනීමේ සිද්ධියයි. 'අභිසංඛරෝති' යනුවෙන් එම ක්‍රියාව හඳුන්වා දී ඇත.

මෙයාකාරයෙන් ස්පර්ශය, වේදනා, සඤ්ඤා, චේතනා යන චෛතසික ධර්මවලට අමතරව ඵස්සය හේතුකොට ගෙන තවත් චෛතසික ධර්මයක් හටගනියි. එය මනසිකාර නම් වෙයි. මනසිකාරය යනු සිතා බැලීම යන ක්‍රියාවයි.

මෙතෙක් අප සලකා බැලුවේ රූප සංඥාව හේතුකොටගෙන ඉතා කුඩා කාල පරාසයකදී සිදුවන සිදුවීම් පෙළකි. රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන කරුණු පහටම අදාළව ඉහත කී කරුණු ආදේශ කර වටහා ගත යුතුය.)

රූප විඤ්ඤාණය පහළ වීමත් සමඟ අපේ මනසෙහි මතක ගබඩාව ඊට අයිති නම ගම ආදිය තෝරා දෙයි. එය රූප සංඥාව ඉපදීමයි. මඤ්ඤණය යනු එකී රූප සංඥාව ඇසුරු කරගෙන සංකල්ප මැවීමේ ක්‍රියාවලියයි. වටිනාකම් පැවරීමේ ක්‍රියාවලියයි. මේ සතාය. මේ පුද්ගලයාය. මේ ඉරිසියාකාරයෙකි. මේ කඩාකප්පල්කාරයෙකි ආදී තීරණවලට එළඹීම මඤ්ඤණය නම් ක්‍රියාවේ ප්‍රතිඵලයකි. ඉෂ්ඨ අනිෂ්ඨ අරමුණු තෝරමින් ඉෂ්ඨ අරමුණුවලට ඇලුම් කිරීමත් අනිෂ්ඨ අරමුණු පිළිකෙව් කිරීමත් යන ක්‍රියාව හටගනුයේ මඤ්ඤණය හේතුකොටගෙනයි.

මඤ්ඤණය හෙවත් වටිනාකම් පවරමින් හොඳ නරක සොයමින් ඉෂ්ඨ අනිෂ්ඨ අරමුණු තෝරමින් යන ක්‍රියාව රහත් වන තුරුම එක දිගට සිදුවෙයි. මඤ්ඤණය අවසන් වන්නේ අර්හත් මාර්ග චිත්තයෙන් අවිද්‍යා-මාන නම් වූ සංයෝජන ධර්ම දෙක නැසී යාමෙනි. මානය නැසුණොත් අවිද්‍යාවද අවිද්‍යාව නැසුනොත් මානයද නැසෙයි. අවිද්‍යා-මාන යන සංයෝජන ධර්ම දෙකෙන් කවර හෝ එකක් නැසූ කල්හි අර්හත්ඵලයට පැමිණීම සිදුවන බව බුද්ධක නිකායේ ඒකධම්ම පාළියේ සඳහන් වෙයි.



Scanned with CamScanner

මඤ්ඤණය අපට මෙතරම් වැදගත් මාතෘකාවක් වූයේ ඇයි? සියලු පෘථග්ජන සංකල්පවල මුල මඤ්ඤණයයි. තෘෂ්ණා, දෘෂ්ඨි, මාන යන සංයෝජන ධර්මවල උපත පිහිටියේද එහිය. දස සංයෝජනයන්ගේ උපත පිහිටියේ එහිය. චිත්තෝපක්ලේශ ධර්මයන්හි උපත පිහිටියේ එහිය. ගණනින් එක්දහස් පන්සීයක් වූ ක්ලේශයන්ගේ නිෂ්පාදනාගාරය වන්නේද එයයි.

අපි මනෝනිර්මිත සිරගෙවල්වල දුක්විඳින සිරකරුවෝ වෙමු. අපට අපගේ පවුල් සංස්ථාව ලොකුය. අපගේ රට ජාතිය අපට ලොකුය. අපි අනාරාධිතව මෙහි පැමිණියෙමු. අපි ආගන්තුකයන් ලෙස මෙහි පැමිණියෙමු. එනමුත් මවුකුසට පැමිණි දින ආරම්භ කළ මඤ්ඤණයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අපි ආගන්තුක වස්තූන් අපේ දේ බවට පත් කරගෙන සිටිමු. අපට ඒ දේ අත්හැර යාමට සිත් නොදෙන තරමට අපි එහි බැඳී සිටිමු. අපි උපන් දා පටන් අපගේ ශරීර කූඩු තුළ සිරකරුවන්ව සිටිමු.

යම් දිනක සියලු ආකාර මඤ්ඤණයන්ගෙන් නිදහස් වුවහොත් අප වටා නිර්මාණය කරගත් මානය නම් වැටකඩුළු බිඳී යනු ඇත. තෘෂ්ණාව නම් වූ යදම ලිහී යනු ඇත. ශරීර කූඩුව නම් සිර ගෙදරින් සදහටම නික්ම යාමට බලපත්‍රයක් හිමිවනු ඇත.

අපගේ ප්‍රධාන මාතෘකාව සෝවාන් මාර්ගයයි. මඤ්ඤණය නම් වූ උපමාතෘකාව සෝවාන් මාර්ගය ප්‍රගුණ කිරීමේදී අතිශය වැදගත් එකකි. තෘෂ්ණා, දෘෂ්ඨි හා මාන යන සංයෝජන ධර්මයන් තුන ගැන ආර්ය මාර්ගය ප්‍රගුණ කරන අය වැඩි වශයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. මන්දයත් සම්පූර්ණ ආර්ය මාර්ගයම තෘෂ්ණා දෘෂ්ඨි මාන බිඳ හෙළීමෙන් සපුරාගත යුතු බැවිනි. රූපරාග, අරූපරාග, උද්ධච්ච වැනි අප්‍රකට සංයෝජන ධර්ම ගැන සිත වෙහෙසවීමකින් තොරව සම්පූර්ණ ආර්ය මාර්ගය තරණය කළ හැකිය.



CS Scanned with CamScanner

දැන් අපි මඤ්ඤණය හා සක්කාය දිට්ඨිය අතර සබඳතාව වටහා ගනිමු. මඤ්ඤණය යනු අවිද්‍යාව යන මූලයෙන් පැන නැගී සක්කාය දිට්ඨියෙන් අවසන් වන්නා වූ දෙයකි.

අපි පෘථග්ජනභාවයේ සිට සෝවාන්ඵලය ඵලලාභියා දක්වා පැමිණීමේදී චිත්තස්වභාවය වෙනස් වී යන අයුරු විස්තරාත්මකව වටහා ගනිමු. සූත්‍ර ධර්මයන් අනුව සලකා බලන කල පෘථග්ජනයාගේ ලක්‍ෂණ කිහිපයකි.

01. අරියානං අදස්සාවීඃ ධර්ම ශ්‍රවණය නොකරන ලද

02. අරිය දම්මස්ස අකෝවිදෝඃ ආර්ය ධර්මයට අදක්‍ෂ

03. අරියධම්මේ අවිනීතෝඃ ආර්ය ධර්මයෙහි නොහික්මුණු

යන මෙකී ලක්‍ෂණ තුන පෘථග්ජනයා කෙරෙහි අඩු වැඩි වශයෙන් පිහිටා තිබීමට පුළුවන. පෘථග්ජනයෝ මිථ්‍යාදෘෂ්ටිගතව සිටිති. මිථ්‍යාදෘෂ්ටිය යනු වැරදි දැක්මයි.

සෝවාන් මාර්ගයට පිවිසීමෙන් පෘථග්ජනභාවය තාවකාලිකව අවසන් වෙයි. සෝවාන් මාර්ගයට පිවිසිය හැකි ආකාර දෙකකි. ඒවා සද්ධානුසාරී හා ධම්මානුසාරී මාර්ග වශයෙන් පෙර විස්තර කර දෙනු ලැබීය.

සෝවාන් මාර්ගය වැඩිය හැකි ක්‍රම දහසක් ඇති බව ශ්‍රී සද්ධර්ම ප්‍රදීපය නම් ග්‍රන්ථයෙහි සඳහන් වෙයි. සෝතාපන්න ඵලයට පැමිණිය හැකි අය හෙවත් ආකාර දහසක් ඇති බැවින් 'දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සෝවාන් ඵලය' ලෙස වර්ණනාවට පාත්‍ර වී ඇත.

සෝවාන් මාර්ගය සම්පූර්ණ කෙරෙන ආකාර හෙවත් ප්‍රතිපදාවන් ප්‍රධාන කොටම වර්ග හතරකට බෙදනු ලැබේ. සැපවත් වූ ශීඝ්‍ර ප්‍රතිපදාව සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා නම් වෙයි. සැපවත් වූ මන්දාගාමී ප්‍රතිපදාව සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා නම් වෙයි. දුක් සහගත වූ ශීඝ්‍ර ප්‍රතිපදාව දුක්ඛා



Scanned with CamScanner

පටිපදා ඛිප්පාභිඤ්ඤා නම් වෙයි. දුක්සහගත වූ මන්දගාමී ප්‍රතිපදාව දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා නම් වෙයි.

උපතිස්ස පරිබ්‍රාජකයා බණ පද කිහිපයක් අසා සෝවාන් ඵලයට පැමිණියේය. එය සැපවත් වූ ශීඝ්‍ර මාර්ගයකි. කාල සිටුපුත්‍රයාට සෝවාන් වීමට වාර ගණනක් බණ ඇසීමට සිදුවිය. එය සැපවත් වූ දීර්ඝ ප්‍රතිපදාවෙන් ලබා ගත් මාර්ගඵලයකි. දීඝනඛ පරිබ්‍රාජකයාට සෝවාන් වනු පිණිස කෙටිකලක් භාවනා කිරීමට සිදුවිය. එය දුක් සහිත ශීඝ්‍ර ප්‍රතිපදාවයි. කලක් තිස්සේ භාවනා පාඨ කියා සෝවාන් ඵලයට පැමිණි සහෝදරයන් දෙදෙනකු ගැන අට්ඨකථාවන්හි සඳහන් වෙයි. එය දුක් සහිත දීර්ඝ ප්‍රතිපදාවකි.

මාර්ගඵල වෙත පැමිණීම අපහසු බව යමකු කියන්නේ නම් එය ධර්මානුකූල ප්‍රකාශයක් නොවේ. හේතු සම්පත් බහුල පුද්ගලයා වඩා පහසුවෙන් මාර්ගඵල ලබයි. තීක්‍ෂණ ප්‍රාඥයා මන්ද ප්‍රාඥයාට වඩා පහසුවෙන් මාර්ගඵල ලබයි. නිසි ගුරු ඇසුර ඇතිව නිවැරදි මාර්ගය තෝරා ගත් තැනැත්තා තනිව අභ්‍යාස කරන තැනැත්තාට කලින් මාර්ගඵල ලබයි.

සංයුක්ත නිකායේ සච්චසඤ්ඤ වර්ගයට අයත් වස්සංවුත්ථ සූත්‍රයෙහි සෝවාන් ආදීවූ මාර්ගඵලයනට පැමිණීමට පහසු හෝ අපහසු බව මෙලෙස විස්තර කර දී ඇත.

01. සෝවාන් වීම ඉතා පහසුවෙන් කළ හැකි දෙයකි.

02. මෙලොව වෙසෙන කාලයේදී සකෘදාගාමී වීම ඊට වඩා අපහසුය.

03. මෙලොව වෙසෙන කාලයේදී අනාගාමී වීම ඊට වඩා අපහසුය.

04. මෙලොව වෙසෙන කාලයේදී රහත් වීම ඊටත් වඩා අපහසුය.



CS Scanned with CamScanner

ගුරු ඇසුර නොමැතිව සෝවාන් ඵලය ලැබූ කෙල්ලක ගැන බුද්ධක නිකායේ සඳහන් වෙයි. ගුරු ඇසුර නොමැතිව තනිව කර්මස්ථාන වඩා අර්හත්ඵලය ලැබ පිරිනිවන් පෑ සාල්හ නම් භික්ෂුවක් ගැන සූත්‍ර පිටකයේ දෙපළකම සඳහන් වෙයි. සෝවාන් වීමට ගුරු ඇසුර අත්‍යවශ්‍ය බව කීම එක්තරා 'ගරිල්ලා මාකටිං' උප්පරවැට්ටියකි. තමන් වටා සෙනඟ රැස්කරගෙන 'තනිවම පොරවීමට' කැමති යෝගීහු එවැනි ප්‍රකාශ නිතර නිතර ප්‍රසිද්ධ කරති.

දැන් අපි බිය සැක හැරගෙන සෝවාන් මාර්ගයේ ඉහළට ගමනාරම්භ කරමු. අප දැන් කල්‍යාණ මිත්‍ර සේවනය හා සද්ධර්ම ශ්‍රවණය යන පළමු සෝතාපන්න අංග සම්පූර්ණ කර ඇත. දැන් ආපසු හැරී බැලීම අනවශ්‍යය. මෙතැන් පටන් ඉදිරියට ඇත්තේ යෝනිසෝ මනසිකාරය හා ධර්මානුධර්ම ප්‍රතිපදාව යන ඉතිරි අංග දෙක වැඩීමයි.

අපට දැන් ආපසු හැරී මුලට යාමට කිසිදු අවශ්‍යතාවක් නැත. අපි යෝනිසෝ මනසිකාරය හෙවත් නුවණින් විමසා බැලීම ආරම්භ කරමු. අප නුවණින් විමසන්නේ කුමක්ද? පෙර කී මඤ්ඤණයන් ගැනය. වැරදි වැටහීම් හෙවත් මඤ්ඤණයන් එකිනෙක ලිහා දැමීම තුළින් සක්කාය දිට්ඨිය හා විචිකිච්ඡාව දුරු කිරීම අප විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයයි.

රූපාදී අරමුණුවල අනිත්‍ය ස්වභාවය දැන හැඳින ගැනීම සෝවාන් මාර්ගය වඩන එක් ක්‍රමයකි. එය අනිච්චානුපස්සනාව නම් වෙයි. එසේද නැත්නම් සංස්කාරයන්හි ඇතිවන නැතිවන ස්වභාවය සලකා බැලිය හැකිය. කැමති කෙනෙකුට සංස්කාරයන්හි ඇතිව නැතිවන ස්වාභවයන් දෙක වෙනුවට සංස්කාරයන්ගේ නැසීයාම පමණක් අරමුණු කරගත හැකිය.

මජ්ඣිම නිකායේ ඔක්කන්ති සංයුක්තයේ චක්ඛු වර්ගයට අයත් රූප සූත්‍රයෙහි මෙසේ දක්වා ඇත.



Scanned with CamScanner

"රූපය අනිත්‍යය. පෙරළෙනසුලුය. වෙනස් වනසුලුය. ශබ්දය අනිත්‍යය. පෙරළෙනසුලුය. වෙනස් වනසුලුය., ගන්ධය අනිත්‍යය. පෙරළෙනසුලුය. වෙනස් වනසුලුය., රස අනිත්‍යය. පෙරළෙනසුලුය. වෙනස් වනසුලුය., ස්පර්ශය අනිත්‍යය. පෙරළෙනසුලුය. වෙනස් වනසුලුය., ධර්මතාවන් අනිත්‍යය. පෙරළෙනසුලුය. වෙනස් වනසුලුය.

යමෙක් මේ ධර්මතාවයන් අදහයි නම් ඔහු සද්ධානුසාරියකු යයි කියනු ලැබෙයි. හේ ආර්ය මාර්ගයට පිවිසියේය. සත්පුරුෂ භූමියට බැස ගත්තේය. පෘථග්ජන භූමියෙන් ඉවත් වූයේය. යමක් කොට නිරයට, තිරිසන් යෝනියට, ප්‍රේත විෂයට යයිද? එබඳු කර්ම කිරීමට ඔහු නුසුදුස්සෙකි. හේ සෝවාන් ඵලය සාක්ෂාත් කරන තෙක් මිය නොයන්නෙකි.

යමෙක් මේ ධර්මතාවයන් ප්‍රඥාවෙන් යම් තාක් දුරට දනී නම් ඔහු සද්ධානුසාරියකු යයි කියනු ලැබෙයි. හේ ආර්ය මාර්ගයට පිවිසියේය. සත්පුරුෂ භූමියට බැස ගත්තේය. පෘථග්ජන භූමියෙන් ඉවත් වූයේය. යමක් කොට නිරයට, තිරිසන් යෝනියට, ප්‍රේත විෂයට යයිද? එබඳු කර්ම කිරීමට ඔහු නුසුදුස්සෙකි. හේ සෝවාන් ඵලය සාක්ෂාත් කරන තෙක් මිය නොයන්නෙකි.

යමෙක් මේ ධර්මතාවන් දන්නේ නම්, එසේ දකී නම් ඔහු සතර අපායෙහි කිසිදා නොවැටෙන නියත සම්බෝධිය කෙළවර කර ඇති සෝතාපන්නයෙකි."

රූප සූත්‍රය සෝවාන් මාර්ගය වැඩීම සම්බන්ධයෙන් අතිශය වැදගත් එකකි. සද්ධානුසාරියා හා ධම්මානුසාරියා අතර වෙනස එහි නිශ්චිතවම පෙන්වා දෙයි. සද්ධානුසාරියා විශ්වාසයෙන් ගමන ආරම්භ කර විශ්වාසය මුල් කර ගමන යයි. හේ විශ්වාසය වැඩිකරගනිමින් අවසානයේ සියලු සංස්කාරයන් ඇතිව නැතිවන්නේය යන අවසන් නිගමනයට පැමිණෙයි. එයින්ම ඔහුගේ සෝවාන් මාර්ගය සම්පූර්ණ වෙයි.



Scanned with CamScanner

ධම්මානුසාරියා ගමනාරම්භ කරනුයේ ගවේෂකයකු මෙනි. නැතිනම් පර්යේෂකයකු මෙනි. නැතිනම් විද්‍යාඥයකු මෙනි. හේ සංස්කායන්ගේ අනිත්‍ය ස්වභාවය පිළිබඳ පරීක්ෂණයක නිරත වෙයි. හේ සංස්කාරයන් නිරීක්ෂණයෙන් පරීක්ෂණය ආරම්භ කරයි. ඒ පරීක්ෂණය අවසානයේ සියලු සංස්කාරයන් ඉපිද නැසෙන බව හෙතෙම නිගමනය කරයි. එයින්ම සෝවාන් මාර්ගය සම්පූර්ණ වෙයි.

මා ඉහතින් විස්තර කළේ මූලික සූත්‍රවලට අනුකූලව සෝවාන් මාර්ගය වඩා ඵලයට පැමිණිය හැකි ක්‍රම කිහිපයකි. මූලික සූත්‍රවල සෝවාන් මාර්ගය වැඩිපුර විස්තර කර ඇත්තේ පෙර කී උදයව්‍යය ඥානය පසුබිම් කරගෙනය. උදයව්‍යඥානය ලැබීම සෝවාන් වීමට හොඳටම ප්‍රමාණවත්ය. එනමුත් පෙර විස්තර කර ඇති පරිදි සෝවාන් වීමේ වෙන් වෙන් ක්‍රම දහසකි. ඒ ක්‍රමවලින් සූත්‍ර පිටකයේ සඳහන් තවත් ක්‍රම කිහිපයක් මතුවට විස්තර කිරීමට බලාපොරොත්තු වෙමි. ඊට ප්‍රථම සෝතාපන්න ඵලය සම්බන්ධ තවත් වැදගත් කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරමි.

මතු උපදින ආත්මභාවයන් ගණන අනුව වර්ග තුනක සෝතාපන්නයෝ වෙති.

01. සත්තකත්තුපරම සෝතාපන්නයා මරණින් මතු සත්වරක් නැවත උපදියි.

02. කොලංකෝල සෝතාපන්නයා මරණින් මතු නැවත දෙතුන් වරක් උපදියි.

03. ඒකබීජී සෝතාපන්නයා මරණින් මතු නැවත උපදින්නේ එක් වරක් පමණි.

කොලංකොල සෝතාපන්නයා නැවත උපදින වාර ගණන ගැන ශාස්ත්‍රීය මත ගැටුමක් ඇත. විසුද්ධි මාර්ගයට අනුව කොලංකොල සෝතාපන්නයා යළි දෙවරක් හෝ තෙවරක් මෙලොව උපදියි. එම වාර ගණන තුනක් හෝ හතරක් බව විමුක්ති මාර්ග කර්තෘවරයා කියයි.



Scanned with CamScanner

දැන් මා සැරසෙනුයේ අපූරු ගණිත පාඩමක් ඉගැන්වීමටය. ඊට පෙර පුනරීක්ෂණ අභ්‍යාසයක යෙදෙමු. පෘථිවිය මතදී සෝතාපන්න ඵලයට පැමිණි අයකු මතු උපදිනුයේ කොහිද? ඊට පිළිතුර ඇත්තේ සභාගත සූත්‍රයෙහිය. සභාගත සූත්‍රය අනුව සෝතාපන්නයා මරණින් මතු දෙව්ලොව උපදියි. මරණින් මතු වහාම මිනිසත්බව ලද සෝතාපන්නයකු ගැන කිසිදු උදාහරණයක් සූත්‍ර පිටකයේ දක්වා නැත. එසේම සෝතාපන්නයන් මරණින් මතු තව්තිසා දෙව්ලොව ඉපදීමට වැඩි ඉඩක් ඇති බව විමාන වස්තු අට්ඨකථාව අනුව පෙනෙයි.

දෙව්ලොව දෙවියන්ගේ ආයුෂ මිනිසුන්ගේ ආයුෂවලට වඩා වැඩිය. භූමාටු දෙවියන්ට ආයුෂ නියමයක් නැත. චාතුර්මහාරාජික වැසියන්ගේ පරමායුෂ අවුරුදු අනූදහසකි. ඉන් ඉහළට පරමායුෂ හතර ගුණය දක්වා පස් වතාවක් වැඩි වෙයි.

දැන් අපි ගණිත පාඩම වෙත නැවත යොමු වෙමු. බුදුන් දවස සෝවාන් වූවන් මරණින් මතු දෙව්ලොව ඉපිද ඇති බව අපට පිළිගැනීමට සිදුවෙයි. ඒ තැනැත්තන් ආයුෂ ගෙවෙන ගෙවෙන හැටියට යළි මිනිස්ලොව ඉපදීම හෝ වෙනත් දිව්‍ය ලෝකවල උපත ලැබීම සාමාන්‍ය සිරිතයි. සම්බුද්ධ පරිනිර්වාණයේ සිට තවම අවුරුදු දෙදහස් හයසීයක් ඉක්ම ගොස් නැත. බුද්ධකාලයේ සෝවාන් වූ පිරිස ලක්ෂ ගණනකි. ඒ පිළිබඳ විස්තර විභාග මහා පරිනිබ්බාණ සූත්‍රයේ දැක්වෙන පරිදි මෙයාකාර වෙයි.

"නාදිකා ග්‍රාමයේ විසූ සාල්හ භික්ෂුව තනිව විදසුන් වඩා රහත් විය... එහි විසූ පනහකට අධික ගිහි පිරිසක් අනාගාමී වූහ. අනූවකට වැඩි පිරිසක් සකෘදාගාමී වූහ. පන්සීයකට වැඩි පිරිසක් සෝවාන් වූහ."



CS Scanned with CamScanner

නාදිකා ග්‍රාමය අප්‍රකට තැනකි. සාල්හ භික්ෂුව එහි සිට තනිව විදසුන් වැඩුවේ බුදුන්වහන්සේ නිතර එහි නොවැඩි බැවිනි. ඒ අනුව බුදුන්වහන්සේ වැඩ සිටි සැවත් නුවර, විසාලා නුවර, රජගහ නුවර, කිඹුල්වත් නුවර ආදී ප්‍රදේශවල සෝතාපන්නයන් දහදහස් ගණනක් සිටින්නට ඇති බව පෙනෙයි. ඒ මේ සියලු දෙනාම මරණින් මතු දෙව්ලොව උපත ලැබූ බවත් ප්‍රකටය. එයින් යම් අයකු දෙව්ලොව සිට නැවත මෙකල්හි මිනිසත්බව ලැබීමට විශාල ඉඩකඩක් ඇති බව පෙනෙයි.

මෙකල්හි මාර්ගඵල ලාභීන් නොසිටින්නේය යන තර්කය එයින්ම බිඳ වැටෙයි. එබඳු මාර්ගඵල ලාභීන් ඉදිරිපත්ව සද්ධර්මය නිරවුල් කර දෙනු ඇත යන්නද සැදැහැතියන් විසින් බලාපොරොත්තු විය හැකි දෙයකි.

මාර්ගඵල ලබනු පිණිස උත්සාහ දැරීමට කිසිවකු බිය විය යුතු නැත. ලැජ්ජා විය යුතු නැත. නමුත් අද කෙරෙනුයේ පුදුම සහගත දෙයකි. මාර්ගඵල ගැන ලියන විට ඒ ගැන උනන්දු කරන විට මේ මොන පිස්සුවක්ද යනුවෙන් ප්‍රශ්න කරන අය මා ඕනෑතරම් දැක ඇත. එවැනි අඳබාල පෘථග්ජනයන් නොසිටින්නට ආර්ය මාර්ගය ශීඝ්‍රයෙන් විවෘත කරන්නට හැකියාව තිබුණි. අවාසනාවකට මෙන් අප රටෙහි බෞද්ධ ආචාර්යවරුන්ගෙන් බහුතරයක් තවමත් සුව නින්දේ සැතපෙති.

මා සතු ධර්ම දැනුම කෙබඳුද යත් නූතන ථෙරවාදී න්‍යාය සබන් බුබුළක් පුපුරුවා හරින්නාක් මෙන් තර්ක කර බිඳ හෙළන්නට මට හැකිය. නමුත් එවැන්නක් කිරීමේ තදබල අවශ්‍යතාවක් මට නැත. මට සපුරා ගැනීමට අවශ්‍ය මුල්ම ඉලක්කය මුල් බුදුදහම නැවත පිහිටුවීමයි. දෙවැනි ඉලක්කය නම් රහතන්වහන්සේලාගේ යුගය නැවත බිහි කිරීමයි.



Scanned with CamScanner

තෙවැනි ඉලක්කය නම් වසර පන්දහසක් කල් බුදුදහම ආරක්ෂා කර දෙන වැඩපිළිවෙළක් මෙරටින් බිහිකිරීමයි. ඒ හැරුණු කොට කිසිදු පෞද්ගලික ඉලක්කයක් මට නැත.

බුදුසසුන කෙරෙහි ශ්‍රද්ධාවක් ඇති යම් කිසිවකු ඉදිරියට පැමිණ ශාසන අන්තර්දානය වළක්වන්නට ක්‍රියා කරනු ඇතැයි මම බලාරොත්තු වුණෙමි. අභාග්‍යයකට මෙන් එවන් කිසිවකු පේන තෙක් මානයක නොවීය. මම ඉවසා සිට බැරිම තැන තනිවම පාරට බැස ගමනාරම්භ කළෙමි.

මා ශාසන ශෝධන ක්‍රියාවලියකට තනිවම අතගසා සිටිනුයේ මෙතෙක් කිසිවකු ඊට ඉදිරිපත් නොවූ බැවිනි.

මා මෙතෙක් ආ මඟ නිරවුල්ය. ඉදිරි මඟ පැහැදිලිය. එබැවින් බිය වන්නට හේතුවක්ද නැත. පසුතැවිලි වන්නට හේතුවක්ද නැත. මේ ක්‍රියාදාමය අතරමගදී කඩා වැටුණහොත් දුක් වන්නට හේතුවක්ද නැත.



CS Scanned with CamScanner

# 04

# ලෝක විනාශයට පෙර සෝවාන් වන්න

මිනිසුන්ට හරි ඉක්මනින් ප්‍රශ්න අමතක වේ. ඒ සියලු ප්‍රශ්න එක රැයින් ලිහී යාම නිසා නොවේ. දිනපතාම අලුතින් ඇතිවන ප්‍රශ්න මගින් පරණ ප්‍රශ්න යටපත් කිරීම නිසාය. අලුත් ප්‍රශ්නවලින් පරණ ප්‍රශ්න යටපත් වන්නේ පත්තර ගොඩක පත්තර ගොඩ ගැසෙන්නාක් මෙනි. ආණ්ඩුවේ මුලාදෑනීන් දෙදෙනෙකුට නොමිලයේ කන්න අඳින්නට පින පෑදීම දැන් කවුරුත් කතාබහ කරන ප්‍රධාන මාතෘකාවයි.

සොරකම බලගතු පාප කර්මයකි. එහි මෙලොව වශයෙන්ද පරලෝ වශයෙන්ද දෙයාකාර විපාක ලැබෙයි. සොරකමෙන් මෙලෝ වශයෙන් ලැබෙන විපාක ප්‍රයෝග සම්පත්තිය ඇත්තකු විසින් වළක්වා ගැනීමට ඉඩ ඇත. එනමුත් ප්‍රයෝග සම්පත්තිය නොමැත්තා සොරකම සිදුවූ තැන හිටියත් සොරකු බවට පත් වෙයි. සොරකම් කෙරෙන තැන ගැවසීම පවා අති භයානක බව මහාධන සිටුපුත්‍රයාගේ කතාවෙන් පැහැදිලි වෙයි.

බුද්ධ කාලයෙහි රජගහනුවර මහාධන නම් සිටුවරයෙක් විසීය. මහාධන සිටුතුමාගේ පුත්‍රයා වස කම්මැලියෙකි. හේ කිසිදු අධ්‍යාපනයක් නොලැබ කිසිදු ශිල්ප ශාස්ත්‍රයක් නොහදාරා පියා විසින් දුක්මහන්සියෙන් හරිහම්බ කළ ධනය



CS Scanned with CamScanner

නිකරුණේ විය පැහැදම් කර වනසා දැමීය. සුරාවට සූදුවට ලොල්ව දිවි ගෙවූ ඔහු නොබෝ කලෙකින්ම දුගියකු බවට පත්ව සිඟමනට වැටුණේය. සිඟා කා ලද දෙයින් ජීවත් වූ සිටුපුත්‍රයා රජගහ නුවර පිහිටි අම්බලමක දිවි ගෙවීය.

එක්තරා දිනක සොරු පිරිසක් ඔහු වෙත පැමිණ හරි අපූරු යෝජනාවක් කළහ.

"පින්වත, නුඹ වැනි සවිසම්පන්න තරුණයකු සිඟමන් යැදීම තරුණකමට කරන නිගාවකි. තරුණ ජවයට කරන නිගාවකි. අපි පරම්පරාගත සොරු වෙමු. පින්වත අප සමඟ එනු මැනවි. අපි නුඹට සොරකම උගන්නන්නෙමු."

වෙනයම් කර්මාන්තාදියක් නොදත් මහා ධන සිටුපුත්‍රයා සොරුන්ගේ බස පිළිගෙන ඔවුන් සමඟ යන්නට ගියේය. එදින රාත්‍රිය එළඹුණු පසු සොරු තරුණ සිටුපුත්‍රයා සමග නිවසක් වෙත ගොස් ඔහු අතට මුගුරක් දී දොරකඩ මුරට තබා යමෙක් මෙතැනට ආවොත් එක් පහරකින් මරණයට පත් කරන්නැයි උපදෙස් දුන්හ. සොරු නිවස තුළට වහලෙන් බැස එහිවූ සියලු වටිනා දේ රැගෙන තරුණ සිටුපුත්‍රයාට නොදැනීම එතැනින් පිටත්ව ගියහ.

සොරුන් පළාගිය පසු ගෙදර උදවිය නැගිට ගෙදර බඩු අඩුවී ඇති බව දැන දොර හරින්ම මුගුරක් අතින් ගත් සිටුපුත්‍රයා දුටුවහ.

"එම්බා සොර තක්කඩිය, තා මෙලෙස අල්ලා ගත හැකි වීම දෛවෝපාගත සිද්ධියකි" යනුවෙන් කී නිවැසියෝ සිටුපුත්‍රයා අල්ලා ගස් බැඳ දඬු මුගුරුවලින් පහර දී රාජපුරුෂයන්ට භාර කළහ. රාජපුරුෂයෝ සුදුසු නියෝගයක් කරනු පිණිස සිටු පුත්‍රයා රජුට භාර කළහ. රජු ඔහු සොරා බව තීරණය කර මරණීය දණ්ඩනය පැමිණවීමට නගර පාලකයාට භාර කළේය. නගර පාලක තෙමේ සොරාගේ ගෙලෙහි රත්මල්මාලා පලඳවා වධක බෙර වයමින් ඔහු පෙරහරෙන් ගෙන ගොස් මරණ වධයට කැප කළේය.



CS Scanned with CamScanner

පෙර සඳහන් කළ කතා ප්‍රවෘත්තියෙන් අපට උගත හැකි පාඩම් බොහෝය. උපායෙහි දක්ෂ සොරු බොහෝ අවස්ථාවලදී වෙනත් කෙනෙකු වරදට හසු කර පළා යාමට දනිති. තරාතිරම කුමක් වුවද සොරුන් සමඟ සහවාසයෙන් විපතක්ම සිදු වෙයි. තවද කිසියම් ශිල්ප ශාස්ත්‍රයක් හරිහැටි නොදත් කෙනා සොරකමට යොමුවීම පෙර කාලයේ පටන් පැවති නැඹුරුවකි. එය අදටත් එසේමය.

අප මෙතෙක් කතාබහට ලක් කළ ප්‍රධාන මාතෘකාව සෝවාන් මාර්ගයයි. සෝවාන් මාර්ගය ඔස්සේ බොහෝ දුරක් පැමිණි අපි සෝවාන් ඵලය ගැන අභිරහස් ඉගැන්වීම් රැසක් මුල්වරට හඳුනාගත්තෙමු. මුල් බුදුසමයෙහි පමණක් ඇතුළත් වන එවැනි රහස් කිහිපයක් යළි අපි සිහිපත් කර ගනිමු.

01. සෝවාන් මාර්ගයෙහි සිටින්නකු වෙයි.

02. සෝවාන් මාර්ගයේ සිටින්නා ලෝක විනාශය නැවැත්වීමට සමත්වූවෙකි.

03. සෝතාපත්ති අංග හතර තිබීම සෝවාන් වීමට ප්‍රමාණවත්ය.

04. සෝවාන් වීමට භාවනා කළ යුතුමය යනුවෙන් නීතියක් නැත.

05. සෝතාපන්නයන් අතින් නොකෙරෙන වැරදි ඇත්තේ නවයක් පමණි.

06. සද්ධර්මය විද්‍යමාන කාලයේදී සෝවාන් ඵලයට පැමිණීමට අමුතු බාධාවක් ඇති නොවේ.

07. ගිහි බෞද්ධයන්ගේ පරම යුතුකම් අතර සෝවාන් ඵලයට පැමිණීමද වෙයි.

08. සෝවාන් ඵලයට පැමිණි සෑම කෙනෙක්ම තම තත්වය දැන සිටින්නේ යයි නියමයක් නැත.



Scanned with CamScanner

09. තමන්ගේ සෝවාන් ඵල ලාභය තමන්ටම පරීක්ෂා කරගත හැකිය.

10. සෝවාන් වූවකුට නොබියව සමාජය ඉදිරියේ ඒ බව ප්‍රකාශ කළ හැකිය.

මෙහි ඉහතින් සඳහන් කරන ලද කරුණු මුල් බුදුසමය තුළ ප්‍රකටව දැකිය හැකි වුවද පසුකාලීනව ථෙරවාදී න්‍යාය තුළින් ඒ සියල්ල යටපත් කර දමනු ලැබීය. එම යටපත් කර දැමීමේ ක්‍රියාව එක්වර සිදුවූවක් නොව, ටිකෙන් ටික කලින් කල ඇතිවූවක් බව ශාසන ඉතිහාසය පරීක්ෂා කර බැලීමේදී පෙනී යයි.

ථෙරවාදයට අඩිතාලම වැටුණේ දෙවැනි ධර්ම සංගායනාවෙනි. තෙවැනි ධර්ම සංගායනාවෙන් පසු ථෙරවාදයට නිල මට්ටමේ පිළිගැනීමක් ලැබුණි. මොග්ගලීපුත්ත මහරහතන් වහන්සේ විසින් දෙවැනි ධර්ම සංගායනාවේදී අන්තරාභවවාදය ප්‍රතික්ෂේප කිරීම තුළින් ථෙරවාදය වෙනම ගුරුකුලයක් ලෙස සංවිධානගත විය.

දෙවන පෑතිස් රජදවස පටන්ගත් ලක්දිව ථෙරවාදී සම්ප්‍රදාය මේ වන විට දෙතුන් වතාවක් විනාශයට ලක්ව යළි යළිත් බිහිවූවකි. එබැවින් මුල් ථෙරවාදයෙන් නූතන ථෙරවාදය බොහෝ දුරක් අපගමනය වී අවසන්ය. මුල් ථෙරවාදය පිරිසිදු බුදුදහමට ළංවූවකි. නූතන ථෙරවාදය පිරිසිදු බුදුදහමෙන්ද මුල් ථෙරවාදයෙන්ද ගව් ගණනක් දුරස් වූවකි. නූතන ථෙරවාදයත් මුල් බුදුසමයටත් එකට පැවැත්මක් නැත. නූතන ථෙරවාදයේ බලපෑමෙන් මුල් බුදුසමය පසුබැස ගොස් ඇත. නූතන ථෙරවාදයේ බලපෑම කෙතෙක්ද කියතොත් තමන් මාර්ගඵල ලද බව කියන අයකු අපායට නියම කිරීමට තරම් සමහර ථෙරවාදීහු ආධානග්‍රාහී වෙති.

අපි සෝවාන් මාර්ගයෙන් පටන්ගෙන සෝවාන් ඵලයෙන්ද අඩක් දක්වා විස්තර අධ්‍යයනය කර අවසන් කළෙමු. මෙතැනින් ඉදිරියට ඇති මාර්ගය වඩාත් ගාම්භීර



Scanned with CamScanner

හා අපූර්ව එකකි. මුල් බුදුසමයෙහි පමණක් දක්නට ඇති අධිබලැති විදර්ශනා භාවනා ක්‍රම රැසක් ඉදිරි මාර්ගය තුළ ඔබට හමුවනු ඇත.

සෝවාන් මාර්ගය වැඩීගොස් අවසානයේ සෝවාන් මාර්ග චිත්තය උපදින අයුරු කිහිප විටක්ම විස්තර කර පෙන්වූයෙමි. සෝවාන් මාර්ග චිත්තයෙන් සදහටම නැසීයන සංයෝජන බැම් තුනක් ඇති බව කීමි. ඒ සංයෝජන බැම් තුනෙන් හැමවිටම සක්කාය දිට්ඨිය හා විචිකිච්ඡාව ප්‍රධාන වෙයි. සීලබ්බත පරාමාසය තරමක් අඩුවෙන් විග්‍රහ කර ඇති සංයෝජන ධර්මයකි. ශීල පරාමාස හා ව්‍රත පරාමාස යන අල්ලා ගැනීම් දෙකෙන් සීලබ්බත පරාමාසය තැනෙන බව පෙර අවස්ථාවක විස්තර කළෙමි.

විවිධාකාර ව්‍රතයන්හි තදින් එල්ලුණු කෙනෙකුට සීලබ්බත පරාමාසය බිඳ හෙළීම අපහසු වනු ඇත. දෙව් මිනිස් සැප මතුවට විඳීමට බලාපොරොත්තු වන සසරෙහි තදින් ඇලුණු කෙනෙකුට සීලබ්බත පරාමාසය පහසුවෙන් බිඳ හෙළීම අපහසු වනු ඇත. ථෙරවාදීන්ට මාර්ගඵල ලැබීම දුෂ්කර වීමට එක් හේතුවක් වනුයේ ඔවුන් දෙව් මිනිස් සැප බලාපොරොත්තුවෙන් කල්ගත කිරීමයි.

සීලබ්බත පරාමාස යනු සිල් හා ව්‍රතයන්හි එල්බ ගැනීමයි. සීලබ්බත පරාමාසය නිසා සසරෙහි එල්ලී සිටීම සීලබ්බත උපාදාන නම් වෙයි. සීලබ්බත උපාදානය පැත්තෙන් ආරම්භ කර විදර්ශනාව වඩන අප්‍රකට භාවනා ක්‍රමයක් සූත්‍ර පිටකයේ ඇත. ඒ භාවනා ක්‍රමය වඩන අය ත්‍රිවිධ සංයෝජන නසා දිට්ඨිපත්ථ නම් සෝතාපන්නයන් බවට පත් වන බව ධර්මයෙහි සඳහන්ය.

අපි දැන් සීලබ්බත උපාදානය වළක්වන ඒ සුවිශේෂී භාවනාව වෙත යොමු වෙමු.

මේ භාවනා ක්‍රමය වැඩීමට පෙර සත්තාවාස හා විඤ්ඤාණස්ථිතීන් ගැන ප්‍රමාණවත් දැනුමක් ලබා ගත යුතු



CS Scanned with CamScanner

වෙයි. සත්තාවාසයන් යනු සැප කැමති සත්වයන් විසින් මතු උපත ලැබීමට බලාපොරොත්තු වන ස්ථානයන්ට කියන නමකි. එබඳු ස්ථානයන් කොටස් නවයකට බෙදා පහත පරිදි දක්වනු ලැබේ.

01. නානත්තකායී ඒකත්ත සංඥී
02. නානත්තකායී නානත්ත සංඥී
03. ඒකත්තකායී ඒකත්ත සංඥී
04. ඒකත්තකායී නානත්ත සංඥා
05. ආකාසානංචායතනය
06. විඤ්ඤාණංචායතනය
07. ආකිංචඤ්ඤායතනය
08. නේවසඤ්ඤානාසඤ්ඤායතනය
09. අසඤ්ඤසත්තය

එකී සත්තාවාසයන්ගෙන් හතක පමණක් විඤ්ඤාණය ප්‍රකටව දක්නට ඇත. අනෙක් ස්ථාන දෙකෙහි උපන් සත්වයන්ට හිතා බලා තීරණ ගැනීම ආදිය කළ නොහැකිය. විඤ්ඤාණස්ථිතීන් හත පහත දැක්වෙන පරිදි වෙයි.

01. නානත්තකායී ඒකත්ත සංඥී
02. නානත්තකායී නානත්ත සංඥී
03. ඒකත්තකායී ඒකත්ත සංඥී
04. ඒකත්තකායී නානත්ත සංඥී
05. ආකාසානංචායතනය
06. විඤ්ඤාණංචායතනය
07. ආකිංචඤ්ඤායතනය

මෙකී ස්ථානයන්හි පහත සඳහන් ස්වභාවයන් යෝගියා සැලකිල්ලට ගත යුතුය.

01. හට ගැනීම
02. චුතවීම
03. ආස්වාදය



CS Scanned with CamScanner

04. ආදීනවය
05. නිස්සරණය

දැන් අපි සත්තාවාස විභංගය විස්තරාත්මකව අවබෝධ කරගනිමු.

සත්තාවාසයන්හි විස්තර විභාග මෙසේය:

01. නානත්තකායී ඒකත්ත සංඥී: ප්‍රථමධ්‍යානයෙන් උපන් සත්වයන්ට වෙනස් ශරීරද සමාන සංඥාවන්ද ඇත. ප්‍රථම ධ්‍යානය හීන ලෙස වඩන ලද තැනැත්තා බ්‍රහ්ම පාරිශද්‍යයේද මධ්‍යම ලෙස වඩන ලද තැනැත්තා බ්‍රහ්ම පුරෝහිතයේද ප්‍රණීත ලෙස වඩන ලද තැනැත්තා මහා බ්‍රහ්මයේද උපත ලබයි.

02. නානත්තකායී නානත්ත සංඥී: මිනිසුන්ට දෙවියන්ට හා විමාන ප්‍රේතයන්ට වෙනස් ආකාර ශරීර හා වෙනස් ආකාර සංඥාවන් ඇත. එම ස්ථාන කාම භව නම් වෙයි. මිනිසුන් හා දෙවියන්ව උපදිනුයේ කාමාවචර කුසලයන්ගේ විපාක හේතුවෙනි. කළු හා සුදු විපාක දෙන කළු හා සුදු කර්මවලින් සැප හා දුක මිශ්‍රව ලබන විමාන ප්‍රේතයෝ උපදිති.

03. ඒකත්තකායී ඒකත්ත සංඥී: සුභකිණ්හයේ බ්‍රහ්මයන්ට සමාන ශරීර හා සමාන සංඥාවන් ඇත.

04. ඒකත්තකායී නානත්ත සංඥී: ආභස්සරයේ බ්‍රහ්මයන්ට සමාන ශරීර හා වෙනස් සංඥාවන් ඇත.

05. ආකාසානංචායතනය: ආසාකානංචායතන භූමියේ උපන් සත්වයෝ අරූපීව සිටිති.

06. විඤ්ඤාණංචායතනය: විඤ්ඤාණංචායතන භූමියේ උපන් සත්වයෝ අරූපීව සිටිති.

07. ආකිංචඤ්ඤායතනය: ආකිංචඤ්ඤායතනයේ උපන් සත්වයෝද අරූපීව සිටිති.



Scanned with CamScanner

08. නේවසඤ්ඤානාසඤ්ඤායතනයඃ නේවසඤ්ඤානා සඤ්ඤායතන භූමියේ උපන් සත්වයෝ අරූපීව හා සංඥාව ඇත හා නැත යන අතර සියුම් සංඥා සහිතව සිටිති.

09. අසඤ්ඤසත්තයඃ අසංඥතලයෙහි උපන් සත්වයෝ සංඥා වේදනා රහිතව රූපීව සිටිති.

දැන් අපි මෙකී නව ආකාර සත්තාවාසයන්හි හට ගැනීම දැන අවබෝධ කර ගනිමු.

01. නානත්තකායී ඒකත්ත සංඥීඃ ප්‍රථමධ්‍යාන භූමීන්හි උපදින සත්වයෝ වෙනස් ශරීරවලින් යුතුව සමාන සංඥා ඇතිව උපදිති. එලෙස උපත ලැබීමට ප්‍රථමධ්‍යානයට අදාළ රූපාවචර කුසල කර්මය හේතු වෙයි.

02. නානත්තකායී නානත්ත සංඥීඃ මිනිස්සු දෙවිවරු හා ප්‍රේත කොටස් කාමාවචර කර්ම විපාක ලෙස උත්පත්තිය ලබති. මිනිසුන්ට දෙවියන්ට හා ප්‍රේතයන්ට විවිධාකාර ශරීරද විවිධාකාර සංඥාවන්ද ඇත.

03. ඒකත්තකායී ඒකත්ත සංඥීඃ සුභකිණ්හයේ උපදිනුයේ තෘතීයධ්‍යානය මධ්‍යම ප්‍රමාණයට වඩන ලද පුද්ගලයින්ය. ඔවුහු සමාන ශරීර ඇතිව සමාන සංඥා ඇතිව උපදිති.

04. ඒකත්තකායී නානත්ත සංඥීඃ ද්විතීයධ්‍යානය ප්‍රණීත ලෙස වඩන ලද තැනැත්තා ආභස්සරයෙහි උපත ලබයි. ආභස්සරයේ බ්‍රහ්මයන්ගේ ශරීර සමානය. සංඥාව අසමානය.

05. ආකාසානංචායතනයඃ රූපාවචර සිවවන ධ්‍යානය ඉක්මවා පළමු අරූප සමවතට සමවදින අය මේ භූමියේ අරූපීව උපත ලබති.



Scanned with CamScanner

06. විඤ්ඤාණංචායතනය: දෙවන අරූප සමවතට සමවදින අය මේ භූමියේ උපත ලබති.

07. ආකිංචඤ්ඤායතනය: තෙවන අරූප සමවතට සමවදින අය මේ භූමියේ උපත ලබති.

08. නේවසඤ්ඤානාසඤ්ඤායතනය: සිව්වන අරූප සමවතට සමවදින අය මේ භූමියේ උපත ලබති.

09. අසඤ්ඤසත්තය: සතරවන රූපාවචර සමවැද සංඥාව සියලු දුකට මුලයයි සිතා සංඥාව වළකා සමාධිගත වන අබෞද්ධ යෝගීහු අසංඥතලයේ උපත ලබති. උපතිස්ස මහරහතන් වහන්සේ විසින් රචිත විමුක්ති මාර්ගයට අනුව අසංඥ සමාධිය බුදු පසේ බුදුන්ට හා බුද්ධ ශ්‍රාවකයන්ට විෂය නොවන අන්‍ය තීර්ථකයන්ට පමණක් අදාළ එකකි.

දැන් අපි එක් එක් සත්තාවාසයකින් චුතවීම ගැන සලකා බලමු.

01. නානත්තකායී ඒකත්ත සංඥී: ප්‍රථමධ්‍යාන භූමිවලින් පළමු වැන්න වන බ්‍රහ්ම පාරිශද්‍යයේ උපන් සත්වයන්ගේ පරමායුෂ කල්පයකින් තුනෙන් පංගුවකි. බ්‍රහ්ම පුරෝහිතයේ පරමායුෂ කල්ප බාගයකි. මහාබ්‍රහ්මයේ ආයුෂ කල්පයකි.

02. නානත්තකායී නානත්ත සංඥී: මිනිසුන්ට හා විනිපාත අසුර නිකායිකයන්ට ආයුෂ නියමයක් නැත. මිනිසුන්ගේ ආයුෂ අවුරුදු දහයේ සිට අසංඛ්‍යය දක්වා කලින් කල අඩු වැඩි වෙයි. ප්‍රේතයෝද තම ජනක කර්මයේ විපාක ගෙවෙන තුරු කාල නියමයක් නැතිව ජීවිත ගෙවති. චාතුර්මහාරාජිකයේ ආයුෂ ගණනින් අවුරුදු අනූදහසකි. එතැන් පටන් ඉහළට ඇති දිව්‍ය ලෝක පහේ උපන් අයගේ පරමායුෂ හතර ගුණයක් බැගින් වැඩි වෙයි.



Scanned with CamScanner

03. ඒකත්තකායී ඒකත්ත සංඥී: සුභකිණ්හයේ උපදින බ්‍රහ්මයන්ගේ පරමායුෂ කල්ප හැට හතරකි.

04. ඒකත්තකායී නානත්ත සංඥී: ආභස්සරයේ පරමායුෂ කල්ප අටකි.

05. ආකාසානංචායතනය: ආකාසානංචායතන තලයේ පරමායුෂ කල්ප විසිදහසකි.

06. විඤ්ඤාණංචායතනය: විඤ්ඤාණංචායතන තලයේ ආයුෂ කල්ප හතළිස් දහසකි.

07. ආකිංචඤ්ඤායතනය: ආකිංචඤ්ඤායතන තලයේ ආයුෂ කල්ප හැටදහසකි.

08. නේවසඤ්ඤානාසඤ්ඤායතනය: නේවසඤ්ඤා නාසඤ්ඤායතන තලයේ ආයුෂ කල්ප අසූහාරදහසකි.

09. අසඤ්ඤසත්තය: අසඤ්ඤසත්ත තලයේ ආයුෂ කල්ප පන්සීයකි.

දැන් අපි එක් එක් සත්තාවාසයන්හි ආස්වාදය ගැන සලකා බලමු.

01. නානත්තකායී ඒකත්ත සංඥී: මෙම වර්ගයේ සත්වයෝ රූපාවචර සුව විඳිති. කාමයෙන් වෙන්ව සිටිති. කබලිංකාහාර හෙවත් පිඬුකර ගන්නා ආහාර නොගනිති. පුරුෂ රූපකාරය පමණක් දරති. සියලු ආකාර කායික සම්භෝගයෙන් වැළකී සිටිති.

02. නානත්තකායී නානත්ත සංඥී: දෙවියෝ මිනිස්සු හා විමාන ප්‍රේතයෝ කම් සැප විඳිති. නානාවිධ ශරීර හා නානාවිධ නම් ගොත් දරති. දෙවියෝ හා මිනිස්සු කබලිංකාහාර ගනිති. විමාන ප්‍රේතයන්ට කබලිංකාහාර ගැනීමට සිදු වෙයි.

03. ඒකත්තකායී ඒකත්ත සංඥී: මෙම වර්ගයේ සත්වයෝ රූපාවචර සුව විඳිති. කාමයෙන් වෙන්ව සිටිති.



Scanned with CamScanner

කබලිංකාහාර හෙවත් පිඬුකර ගන්නා ආහාර නොගනිති. පුරුෂ රූපකාරය පමණක් දරති. සියලු ආකාර කායික සම්භෝගයෙන් වැළකී සිටිති.

04. ඒකත්තකායී නානත්ත සංඥී: මෙම වර්ගයේ සත්වයෝ රූපාවචර සුව විඳිති. කාමයෙන් වෙන්ව සිටිති. කබලිංකාහාර හෙවත් පිඬුකර ගන්නා ආහාර නොගනිති. පුරුෂ රූපකාරය පමණක් දරති. සියලු ආකාර කායික සම්භෝගයෙන් වැළකී සිටිති.

05. ආකාසානංචායතනය: මෙම වර්ගයේ සත්වයෝ සියලු රූපමය අරමුණු නොමැතිව පෙනුම, ගඳ සුවඳ දැනීම, ඇසීම, රස දැනීම හා ස්පර්ශය නොමැතිව සිත පමණක් සක්‍රීයව වෙසෙති. සියලු කම් සැපයන්ගෙන්ද සියලු රූපාවචර සැපයන්ගෙන්ද වැළකී සිටිති.

06. විඤ්ඤාණංචායතනය: මෙම වර්ගයේ සත්වයෝ සියලු රූපමය අරමුණු නොමැතිව පෙනුම, ගඳ සුවඳ දැනීම, ඇසීම, රස දැනීම හා ස්පර්ශය නොමැතිව සිත පමණක් සක්‍රීයව වෙසෙති. සියලු කම් සැපයන්ගෙන්ද සියලු රූපාවචර සැපයන්ගෙන්ද වැළකී සිටිති.

07. ආකිංචඤ්ඤායතනය: මෙම වර්ගයේ සත්වයෝ සියලු රූපමය අරමුණු නොමැතිව පෙනුම, ගඳ සුවඳ දැනීම, ඇසීම, රස දැනීම හා ස්පර්ශය නොමැතිව සිත පමණක් සක්‍රීයව වෙසෙති. සියලු කම් සැපයන්ගෙන්ද සියලු රූපාවචර සැපයන්ගෙන්ද වැළකී සිටිති.

08. නේවසඤ්ඤානාසඤ්ඤායතනය: මෙම වර්ගයේ සත්වයෝ සියලු රූපමය අරමුණු නොමැතිව පෙනුම, ගඳ සුවඳ දැනීම, ඇසීම, රස දැනීම හා ස්පර්ශය නොමැතිව සිත පමණක් සක්‍රීයව වෙසෙති. නමුත් ඔවුන්ගේ සංඥාව ඉතා තුනීය. සියලු කම් සැපයන්ගෙන්ද සියලු රූපාවචර සැපයන්ගෙන්ද වැළකී සිටිති.



Scanned with CamScanner

09. අසඤ්ඤසත්තයඃ මෙම වර්ගයේ සත්වයෝ රූපීව එහෙත්, සංඥාවෙන් තොරව වාසය කරති. ඔවුන්ට තමන් සිටින බවවත් නොදැනෙයි.

දැන් අපි සත්තාවාසයන්හි ආදීනව සලකා බලමු.

සෑම සත්තාවාසයකම උපත ලබන සත්වයෝ මරණින් මතු නිරයේ උපත ලැබීමේ අවදානමට ගොදුරුව සිටිති. අනාගාමී ඵලයට පැමිණ සුද්ධාවාසයන්හි උපන් සත්වයන් පමණක් ඒ ඉරණමට ගොදුරු නොවේ. තවද මිනිසුන්ගේ ආයුෂය කෙටිය. මිනිසුන්ට ජීවිත කාලය තුළ ජරාවට පත්වීම රෝග සෑදීම දඬුවම්වලට ලක්වීම ප්‍රියයන්ගේ වියෝව වැනි මහත් දුකට පත්වීමට හේතු වෙයි. දෙවියන් ලෙස උපත ලැබීමද එක්තරා අභාග්‍යයකි. දෙවියන්ගේ කාලය ශීඝ්‍රයෙන් ගෙවෙයි. ඔවුන් කෙළිදෙළෙන් ගත කිරීම නිසා පිනට ඇති ඉඩකඩ අඩුය. ශරීරය ජරාවට පත් නොවන නිසා අනිත්‍ය දුක්ඛ ආදී ලක්ෂණ තේරුම් යාම අඩුය. දෙවියන්ට ස්වොත්සාහයෙන් දියුණු වීමට නොහැකිය.

බ්‍රහ්මයන්ට කාමාවචර සැප නැත. ඔවුන්ගේ ජීවිත ඒකාකාරීය. අරූප ලෝකවාසීන්ට බුදුවරුන් දහසක් පහළ වූවද බණ ඇසීමට හැකියාව නැත. අසංඥ තලයේ වෙසෙන්නන්ටද ඒ උවදුර එලෙසම බලපායි. ඔවුන්ට වෙනකක් තබා තමන් ජීවත්ව සිටින බව වත් නොදැනෙයි.

බ්‍රහ්මයන්ගේ ආයුෂ දක්වා ඇත්තේ මහා කල්පවලිනි. මහාකල්පයක් තුළ අන්තඃකල්ප අසූවක් ඇත. අන්තඃකල්ප විස්සක් අසංඛ්‍ය කල්පයකි. එක් මහාකල්පයක් තුළ අසූවරක් ලොව නැසෙයි. ඒ ඒ වාරයන්හි ලෝකය නැසෙන විට බ්‍රහ්ම ලෝක කිහිපයක්ම විනාශ වෙයි. එතැනින් පහළ සියලු තලවල ජීවය වැනසී යයි. (රූපාවචර හා අරූපාවචර භූමීන්හි ආයු ප්‍රමාණ ගැන ථෙරවාදීන් අතර එකිනෙකට පරස්පර විරෝධී මතවාද ඇතත් එම කරුණු මෙම අවස්ථාවට අදාළ කර ගැනීම සුදුසු නැත.)



CS Scanned with CamScanner

එක් කල්පයක් තුළ මුලින්ම ලෝකය සත්වරක් ගින්නෙන් නැසෙයි. ලෝකය ගින්නෙන් නැසෙන කල ආභස්සරයෙන් යට සියලු තල වැනසී යයි. අටවැනි වතාවේ ලෝකය ජලයෙන් නැසෙයි. ලෝකය ජලයෙන් නැසෙන කල්හි සුභකිණ්හයෙන් යට සියල්ල වැනසෙයි. එතැන් සිට වාර ගණනාවක් යුද්ධයෙන් නැසෙයි. එය ශස්ත්‍ර අන්තඃකල්පය නම් වෙයි. ලෝකය හැට හතරවන වාරයේදී සුළඟෙන් නැසෙයි. එකල්හි වේහප්ඵලයෙන් යට සියල්ල වැනසී යයි.

නුදුරු අනාගතයේ ආයුධ වැස්සකින් ලෝකය වැනසෙන බවත් මුළු ලොවම දූමාරයකින් වැසී බොහෝකල් පවතින බවත් අභිංඥාලාභීන් කිහිප දෙනෙකුම මේ වන විට අනාවැකි පළ කර ඇත. එම අනතුර අන්තඃකල්ප විනාශය ලෙස හඳුනාගත හැකිය.

දැන් අපි සත්තාවාසයන්ගේ නිස්සරණය මෙයාකාරයෙන් තේරුම් ගනිමු.

සත්තාවාස හෙවත් සැප කැමති සත්වයන් උපදින ස්ථාන දැන අවබෝධ කරගන්නා තැනැත්තා ඒවායේ උපත ලැබීමෙන් තමන්ට නිත්‍ය ජීවනයක් නොමැති බව වටහා ගනියි. ඔහු සත්තාවාසයන්හි සිත නොඅලවයි. මෙයාකාරයට තේරුම් ගෙන සත්තාවාසයන් මම නොවේය. මාගේද නොවේය. ආත්මය නොවේය. සාරය පිණිස නොවේය. රැකවරණය පිණිස නොවේය යන අවබෝධයට පැමිණෙයි. මේ අවබෝධයෙන් සක්කාය දෘෂ්ඨිය දුරුවෙයි.

දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත, අනුවිචරිත, පත්ත පරියේසිත (දුටු, ඇසුණු, දැනුණු, දැනුවත් වූ, තර්ක කර නිගමනයට පැමිණි, පර්යේෂණාත්මකව සොයාගත්) යන ස්ථාන සයෙහි නිත්‍ය අනිත්‍යතාවය ගැන සැක නූපදියි. එයින් විචිකිච්ඡාව දුරුවෙයි. සත්තාවාසයන්ගේ ආදීනව දකින ඔහු සීලබ්බත උපාදානය හෙවත් සිල් හා ව්‍රත මගින් කරන අල්ලා ගැනීම්වලින් වළකියි. එයින්ම සීලබ්බත පරාමාසය දුරුවෙයි.



Scanned with CamScanner

දැන් ඔහු ත්‍රිවිධ සංයෝජන ධර්ම නසන ලද සෝතාපන්නයෙකි. දිට්ඨිපත්ත යන නම ලැබීමට ඔහුට දැන් සුදුසුකම ඇත.

මේ භාවනාව වැඩීමට කැමති අය පෙර සඳහන් විස්තරය කිහිප වරක් හොඳින් කියවා සංසාරය කෙරෙහි ඇල්ම දුරුවන ආකාරයට ඒ ඒ උත්පත්ති ස්ථානයන් ගැන කලකිරීම ඇතිකර ගත යුතුය. මෙය බුදුන් වහන්සේ විසින් සෝවාන් ඵලය පිණිස දේශනා කර ඇති වඩාත්ම සංකීර්ණ භාවනා අභ්‍යාසයයි.



CS Scanned with CamScanner

# 05

## දැන අපි ධර්ම යුද්ධයට පෙළ ගැසෙමු

ප සුගිය මාස කිහිපයක කාලය තුළම විසින් සෝවාන් මාර්ගය ඉතා දීර්ඝ ලෙස විස්තර කර දෙනු ලැබීය. සෝවාන් මාර්ගය විස්තර කර දීමේදී කිසිදු පැටලිල්ලක් ඇති නොවීය. කිසිදු නොතේරෙන දෙයක් අතරමග හමු නොවීය. අපි පළපුරුදු යාත්‍රිකයන් විලසින් සෝවාන් මාර්ගය අධ්‍යයනය කර අවසන් කළෙමු. සෝවාන් ඵලය ගැන මූලික සූත්‍රයන්හි ඇති ඉගැන්වීම් කජු කන්නාක් සේ සරලව විස්තර කර අවසන් කරනු ලැබීය.

සෝවාන් ඵලය ගැන කිසිදු ගැටලුවක් ඉතිරිව නැතැයි මම කල්පනා කරමි. සෝවාන් ඵලයේ සිට අර්හත්ඵලය දක්වා ඇති ඉගැන්වීම් ගැනත් මට කීමට ඇත්තේ ඔය කියන ටිකමය. ඒ සියලු දේ ගැටලුවක් ඉතිරි නොවන තෙක්ම පහදා දීමට මට හැකිය. මා මෙතෙක් මාර්ගඵල විස්තර කිරීමට භාවිත කළේ මූලික සූත්‍රවල ඇතුළත් ක්‍රමවේදයන් පමණි. මට අවශ්‍ය නම් ථෙරවාදී ක්‍රමයටද වජ්‍රයාන ක්‍රමයටද මාර්ගඵල ලබන ක්‍රම අඩුවක් නැතිව විස්තර කර පෙන්විය හැකිය.

මා දැන් කරනුයේ මට කළ හැකි දස්කම් ගැන පාරම්බෑමක් නොවේ. මට කීමට අවශ්‍ය වනුයේ ඊට වඩා වැදගත් පණිවුඩයකි. මා විසින් ධර්ම මාර්ගය නිරවුල් කර දී අවසන්ය. අප මෙතෙක් කල් තිවන වටා රවුම් ගසමින්



CS Scanned with CamScanner

නිකරුණේ කාලය කා දැමුවා නොවේද යන ප්‍රශ්නය ඔබ හදවතට තට්ටු කර විමසිය යුතුමය.

අද කාලයේ නිර්වාණගාමී ප්‍රතිපදාවට පිවිසෙන වැඩි දෙනෙක් බොරු වළවල් වල වැටී අතරමං වෙති. වැරදි මාර්ගෝපදේශකයකු තෝරා ගැනීමෙන් වන අන්තරාය සුළුපටු නොවේ. දක්‍ෂ මාර්ගෝපදේශකයා මාර්ගයේ මුල දනියි. මැද දනියි. අග දනියි. මුල සිට අගට දනියි. බොරු වළවල් ඇති තැන් දනියි. අන්තරායන් ඇති තැන් දනියි.

වැරදි මාර්ගෝපදේශකයකු තෝරා ගැනීම නිසා සිදුවන ඇබැද්දිය ගැන පහත දැක්වෙන කතා පුවත තුළින් අපට තේරුම් ගත හැකිය.

පෙරකල සමුද්‍ර තරණය ජීවිතයත් මරණයත් අතර සටනක් විය. මහා සමුද්‍රය තරණය කර දුරු රටවලට ගොස් වෙළහෙළඳාම් කිරීම බොහෝ වාසිදායක වූයෙන් සමුද්‍ර තරණයට යොමුවන්නන්ගේ අඩුවක් නම් නොවීය. එයාකාරයෙන් දුරු රටවලට ගොස් වෙළහෙළඳාම් කර ධනවත් වූ සමහරු සෙට්ඨි යන ගෞරව නාමය ලදහ. ජම්බුද්වීපයේ එක්තරා සමුද්‍රාසන්න නගරයක තීක්‍ෂණප්‍රාඥ නම් මගපෙන්වන්නෙක් විය. නැව් නැගී දුරු රටවල වෙළහෙළඳාම් යන පිරිසට නැකැත් තරු ඇසුරෙන් මග පෙන්වීම තීක්‍ෂණප්‍රාඥයාගේ කාර්යය විය.

තීක්‍ෂණප්‍රාඥයා වෙසෙන ඉසව්වේම මන්දප්‍රාඥ නම් වූ වාචාල පුරුෂයෙක් වාසය කළේය. සමුද්‍ර තරණය ඔය තරම් මහලොකු කජ්ජක් නොවේ. මටත් ඒ ගැන හොඳ දැනුමක් ඇතැයි කියමින් මන්දප්‍රාඥයා කෙළිදෙළින් කල් ගෙවීය. එක්තරා වෙළෙඳ පිරිසක් මන්ද ප්‍රාඥයාගේ වහසිබස් අසා නොතැන්හි පැහැදුණහ. "පින්වත, අපිද මහසමුදුර තරණය කර දුරු රටවල වෙළඳාම් කිරීමට කැමැත්තෙන් සිටිමු. අපට මාර්ගෝපදේශකයෙක් වන්නැ" යි ඔවුහු මන්දප්‍රාඥයාගෙන් ඉල්ලා සිටියහ.



CS Scanned with CamScanner

මන්දප්‍රාඥ තෙමේ සාමුද්‍රික තරණයෙන් ලැබෙන වාසි දැන යහපතැයි කියා දුරුරට යාමට කැමැත්ත පළ කළේය. මන්දප්‍රාඥයා එක්තරා විධියක කපටියෙකි. හේ තීක්ෂණප්‍රාඥයා නැව් නගින දවසේම සිය චාරිකාව ආරම්භ කිරීමට යොදාගත්තේය. හේ ගණනින් පන්සියයක් වූ වෙළෙඳ පිරිසක්ද රැගෙන තීක්ෂණප්‍රාඥයාගේ යාත්‍රාව පිටුපසින් ගමනාරම්භ කළේය.

හේ තීක්ෂණප්‍රාඥයා නෞකාව හරවන දිශාවටම තම යාත්‍රාව හරවන්නට උපදෙස් දෙමින් සුපුරුදු ලෙස වහසි බස් කියමින් චාරිකාවේ යෙදුණේය.

මෙයාකාරයෙන් දින ගණනාවක් සමුද්‍ර තරණයෙහි යෙදුණ දෙපිරිසම තම්බපණ්ණි දේශය ආසන්නයට පැමිණියහ. තම්බපණ්ණි දේශය අවට මුහුද රළුය. සෑම වරායක්ම අවට මුහුදේ දැවැන්ත කළුගල් විය. එදින රාත්‍රියේ දෙපිරිසම තම්බපණ්ණියේ ප්‍රදීපාගාරයක අටවා තිබූ කොප්පරා ලාම්පුව යන්තමින් දුටුවහ. "පින්වත අපි නිරුපද්‍රිතව ගොඩබිමට ළඟා වුණෙමු" යි කී තීක්ෂණප්‍රාඥ තෙමේ ප්‍රදීපාගාරයෙන් ඉවතට නෞකාව හරවා මන්නාරම් තොටට ගොඩබැස්සේය.

යන මඟ හමුවන බාධක කිසිවක් නොදත් මන්දප්‍රාඥ තෙමේ සිය අතවැසි පිරිසට මෙසේ කීය. "පින්වත, අපි දැන් ගොඩබිමට සමීපව සිටින්නෙමු. දැන් අර පේන ප්‍රදීපාලෝකය දෙසට නෞකාව හරවා යාත්‍රා කරමු." නෞකාවේ සිටි පිරිස ඒ කළුවර රාත්‍රියෙහි ප්‍රදීපාලෝකය දෙසට යාත්‍රාව හැරවූහ. එතැන් සිට හෝරාවක් පමණ යාත්‍රා කළ කල්හි නෞකාව ප්‍රදීපාගාරය පිහිටි ගල් පරයෙහි හැපී බිඳීගියේය. මන්දප්‍රාඥයාගෙන් උපදෙස් ගත් සියලු දෙන ඔහුත් සමඟ මහසයුර විසින් ගිල ගන්නා ලදී.

තීක්ෂණප්‍රාඥයාගෙන් උපදෙස් ලද පිරිස් ස්වකීය වෙළහෙළදාම් අවසානයේ නැවත ජම්බුද්වීපයට යහතින් ළඟාවූහ.



CS Scanned with CamScanner

ආර්ය මාර්ගය වඩන පිරිස් තීක්ෂණප්‍රාඥයා පිළිබඳ උපමාව ගරු කළ යුතුය. බුදුන් වහන්සේ ආර්ය මාර්ගය හෙළි කළ බැවින් ප්‍රදීපාගාරයක් බඳු වෙති. ධර්මයෙන් ලැබෙන ආලෝකය ප්‍රදීපාගාරයෙන් නික්මෙන ආලෝක ධාරාවට සමවෙයි. නැණවත් කර්මස්ථානාචාර්යවරයා තීක්ෂණප්‍රාඥ නම් යාත්‍රියාගෙන් අර්ථවත් වෙයි. සංසාරය සමුද්‍රයට සම වෙයි. මේ කතාවේ නිවන තොටුපොළකට සම කර ඇත. සංසාරය නම් වූ බියකරු සමුද්‍රය තරණය කරනු කැමති තැනැත්තා බුදුන්වහන්සේගේ ධර්මයේ ආලෝකයෙන් ඉතා ඉක්මනින් නිවන නම් ක්ෂේම භූමියට යාත්‍රා කළ යුතු වෙයි.

දැන් අපි නැවත අපගේ ප්‍රධාන මාතෘකාව වෙත යොමුවෙමු. සෝවාන්ඵලය ගැන තව කොතෙක් ලිවීමට ඇත්දැයි යමෙකු ඇසුවොත් මා දෙන පිළිතුර හරි පුදුම එකකි. සෝවාන්ඵලය ගැන මා ලියූ පොතපතෙහි ඇතුළත් කරුණුවලින් හතරෙන් පංගුවක්වත් මෙම ලිපිපෙළෙහි අඩංගු නැත. ඒ ගැන තව බොහෝ දේ ලිවීමට ඇත. විදර්ශනා ඥාන, පටිච්චසමුප්පාදය, චතුරාර්ය සත්‍යය, සප්ත විසුද්ධිය, ඵල සමාපත්ති යන මාතෘකා සෘජුවම සෝතාපන්න ඵලය සමග සබැඳෙයි. සෝවාන් ඵලය ගැන මා ලියද්දී සූත්‍ර පිටකය හෝ ආශ්‍රිත පොතපත කියවනුයේ කලාතුරකිනි. මා දැන් ඒ විෂය ගැන කෙතෙක් ලියා ඇද්දැයි කිවතොත් ඒ සියලු ඉගැන්වීම් මතකයෙන් කියවාගෙන ගොස් අවසන් කර දැමීමට වුව මට හැකිය.

සද්ධර්මය හොඳින් ඉගෙන සමථ විදර්ශනා භාවනා කරන විට හරි අපූරු දෙයක් සිදුවෙයි. ඔබ මුලින් සද්ධර්මය හදාරන්නේ එක් එක් මාතෘකා වශයෙනි. ඒ මාතෘකා වෙන් වෙන් වශයෙන් ඉගෙන නැවත නැවතත් ස්මරණය කරන කල්හි හරි අපූරු දෙයක් සිදුවෙයි. එක්තරා දිනෙක ඔබ නොදැනීම ඒ සියලු උගත් දෙය එකිනෙක හා බද්ධ වී තනි චිත්‍රයක් සෑදෙයි. ඒ තනි චිත්‍රය තුළ ඔබ උගත් සියලු ධර්ම කරුණු ඊට නියමිත තැන පිහිටයි. ඒ ක්‍රියාව



Scanned with CamScanner

පොඩි ඇත්තන්ගේ ජිග්සෝ ප්‍රහේලිකාවක් විසඳීම වැනි දෙයකි. ධර්ම කරුණු අතර අන්තර්සම්බන්ධය දුටු දින පටන් සද්ධර්මයෙහි නිරවද්‍යතාවය ගැන සැකයක් පැන නොනගියි. බුදුන්වහන්සේ ගැන අබමල් රේණුවක සැකයක් නූපදියි. ආර්ය සංඝයා වහන්සේ ගැන සැකයක් පැන නොනගියි.

මේ කියන තත්වයට පත්වීම අපහසු නොවේ. ඔබ විසින් කළ යුත්තේ නිවනට අනුරූප සද්ධර්මය හැකිතාක් කියවා ඉගෙන ගෙන සමථ විදර්ශනා භාවනා වඩමින් වරින් වර ධර්ම කරුණු විමසා බැලීමයි. මෙයාකාරයෙන් ධර්ම කරුණු විමසා බලන කල එක්තරා හොඳ මොහොතකදී ඔය කියන අවුල් ලිහීයාම සිදුවෙයි. අවුල් ලිහී ගිය තැන් පටන් ඔබටත් නොදැනීම තවත් අපූරු ප්‍රතික්‍රියාවක් ඇරඹෙයි. ඔබ ටිකෙන් ටික සංසාරයෙන් වෙන් වන්නට පටන් ගනියි. සමාජයේ වෙසෙන අන් අය කරන බොහෝ දේ ළාමක පෘථග්ජන ක්‍රියා බව ඔබට වැටහෙන්නට පටන් ගනියි. මේ කියන තත්වයට පත්වූ පසු ඔබ ලස්සන ලස්සන ඇඳුම් ආයිත්තම් සෙවීම නවතනු ඇත. ලස්සන යනු හුදෙක් සිතෙහි හටගන්නා මානසික තත්වයක් බව දන්නා ඔබ ඒ ගැන තවත් නොවෙහෙසෙනු ඇත. සංසාරයෙන් ඉවතට යමින් සිටින ඔබ කිසි දින පෘතග්ජනයන්ට අයත් ක්‍රියාවන් නොඉවසනු ඇත. උපන්දින සාද පැවැත්වීම නිලතල පසුපස හඹායාම, ඉඩකඩම්වලට ඇලුම් කිරීම ආදී ළාමක පෘථග්ජන ක්‍රියා කිරීමට තබා එවැනි දේ කෙරෙන තැනක සිටීමට පවා ඔබට නොරිසි වනු ඇත.

මා දැන් විස්තර කරන්නේ මාර්ගඵල ලාභයෙන් පසු ඔබ ලබන අත්දැකීම් පිළිබඳවය. ඔබ මාර්ගඵල ලාභියකු නම් ඔබට පහත දැක්වෙන ධර්මඥානයන් පහළ වී තිබිය යුතුමය.

01. උදයව්‍යය ඥානය

02. පටිච්ච සමුප්පාදය පිරිසිඳ අවබෝධකරගත් බව



Scanned with CamScanner

03. දුක්ඛ සත්‍යය පිරිසිඳ අවබෝධ කරගත් බව

04. අපගේ ජෛවීය ක්‍රියා පිටුපස කරන්නෙක් හෝ කරවන්නකු නොමැති බව

05. ආත්මයෙන් ආත්මය ගමන් කරන අවිනාශී පදාර්ථයක් නොමැති බව

06. සද්ධර්මයේ එන සංසාරික විමුක්තිය හැර වෙනත් විමුක්ති මාර්ගයක් නොමැති බව

07. තවත් කිසිවකුගේ උදව් නොමැතිව වුව සසර තරණයට තමන්ට හැකියාව ඇති බව

මෙකී කරුණු සූත්‍ර පිටකයේ එක් තැනක අනුපිළිවෙළකට දක්වා නොමැති නමුත් මුළු සූත්‍ර පිටකයම ප්‍රවේසමෙන් අධ්‍යයනය කරන කෙනෙකුට මේ කරුණු සියල්ලම සොයාගත හැකිය.

මේ තාක් මා විසින් මේ ලිපි පෙළෙහි දක්වන ලද ධර්ම කරුණු අතර, පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳ විස්තරයක් ඇතුළත් නොවීය. මම ඒ විස්තරය වුවමනාවෙන්ම පමා කළෙමි. මන්දයත් පටිච්ච සමුප්පාද ධර්මය නිරවුල්ව අවබෝධ කරනු පිණිස පළමු කොටම පාඨක මනස මූලික දැනුමෙන් පදම් කළ යුතු බැවිනි.

පටිච්ඡ සමුප්පාද ධර්මය මුල් බුදුදහමේ මධ්‍ය දේශනාව ලෙස පිළිගැනීමට ලක්ව ඇත. ගෞතම බුදුන්වහන්සේ විසින් දේශනා කළ පටිච්ඡ සමුප්පාද විවරණය විපස්සී බුදුන්වහන්සේගේ පටිච්ඡ සමුප්පාද විවරණය හා සර්වසම බව කියනු ලැබෙයි. පටිච්ඡ සමුප්පාදය අවිද්‍යාවෙන් පටන් ගන්නා ලෙසද නැතහොත් විඤ්ඤාණයෙන් පටන්ගන්නා ලෙසද එසේත් නැතහොත් තෘෂ්ණාවෙන් පටන් ගන්නා ලෙසද විවරණය කළ හැකිය. මුල් බුදුසමයෙහි පටිච්ඡ සමුප්පාද සූත්‍රයේ දැක්වෙන විස්තරයට වඩා පහසුවෙන් අවබෝධ වන විස්තරයක් මහා නිදාන සූත්‍රයේ ඇත. මහා



CS Scanned with CamScanner

නිදාන සූත්‍රයේ පටිච්ඡ සමුප්පාදව විවරණය කෙරෙනුයේ අන්තරාභවිකයකු නැතහොත් ගන්ධබ්බයකු මවුකුස පිළිසිඳ ගන්නා ආකාරය සැලකිල්ලට ගැනීමෙනි.

ථෙරවාදී ක්‍රමයට අනුව පටිච්ඡ සමුප්පාදය විවරණය කරන්නට යන තැනැත්තා අතරමග සිරවී මහත් අවුලකට වැටෙයි. එබැවින් ථෙරවාදී ආචාර්යවරු පටිච්ඡ සමුප්පාදය විස්තර කරන විට කිහිප තැනකින් ලිස්සා යති. තමන්ට පටිච්ඡ සමුප්පාදය නිරවුල්ව විස්තර කර දිය නොහැකි බව බුද්ධඝෝෂ පඬිතුමා විසින්ද පිළිගෙන ඇත.

මුල් බුදුසමය දෙදරා ගොස් මහායානය බිහිවීමට පටිච්ඡ සමුප්පාදය පිළිබඳ අවුල හේතුවූ බව මා කීවොත් බාගෙවිට ඔබ පුදුම වනු ඇත. මහායානය බිහිවන්නේ පටිච්ඡ සමුප්පාදය නිරවුල් කරන්නට යාමෙනි. නාගර්ජුණ පඬිවරයාට පවා පටිච්ඡ සමුප්පාද ධර්මය තේරුම්ගත නොහැකිව මූලමාධ්‍යමික කාරිකා නම් ග්‍රන්ථයක් නිර්මාණය කළේය. මුල් මහායානිකයෝ පටිච්ඡ සමුප්පාදය සම්මුති දේශනාවක් බව කියා එය අහක ලූහ. ඒ වෙනුවට නාගර්ජුනගේ සාපේක්ෂතාවාදය පිළිගනු ලැබීය.

පෙරකල හින්දු ලබ්ධික බමුණන් හා බෞද්ධ භික්ෂූන් අතර මුහුණට මුහුණ ලා විවාදයන් ඇතිවිය. ඒ විවාදයන්ට පදනම් වූ ප්‍රධාන ඉගැන්වීම් අතර පටිච්ඡ සමුප්පාදයද විය. "අවිජ්ජා පච්චයා - සංඛාරා, සංඛාර පච්චයා - විඤ්ඤාණං" යනුවෙන් පටිච්ඡ සමුප්පාද පාළිය අරම්භ වෙයි. ථෙරවාදීන්ට අනුව සංඛාර යනු කර්මයන්ය. විඤ්ඤාණය යනු සිතයි. පටිච්ඡ සමුප්පාදය අනුව සංඛාර නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධය වෙයි. එය ථෙරවාදී ක්‍රමයට කිසිසේත් පැහැදිලි කළ නොහැකිය. මන්දයත් කර්ම රැස් කිරීම නවතා දැමූ වහාම සිත අක්‍රීය වන බව කිසිසේත් ඔප්පු කළ නොහැකි බැවිනි.

මෙයාකාරයෙන් අවුලකට හා ශාසන භේදයකට තුඩුදුන් පටිච්ඡ සමුප්පාදය ඉතා මනෝඥ ලෙස විස්තර කර



CS Scanned with CamScanner

දුන් අවස්ථාවක් අපට මුණ ගැසෙයි. ඒ චීනයෙන් සොයාගත් විමුක්ති මග්ගො නම් ග්‍රන්ථයේ පිටපතකිනි. විමුක්ති මග්ගො හෙවත් විමුක්ති මාර්ගය රහතන්වහන්සේ කෙනෙකු විසින් රචිත මුල්ම ග්‍රන්ථයයි. විමුක්ති මාර්ගය ලියූ උපතිස්ස රහතන්වහන්සේ කුමන කාලයක කුමන දේශයක වැඩ සිටියේද යන්න අප්‍රසිද්ධය. එනමුත් විසුද්ධි මාර්ගය කරළියට පැමිණීමට පෙර ලක්දිව අභයගිරි පාර්ශ්විකයන් විසින් විමුක්ති මාර්ගය භාවිත කළ බවට පැහැදිලි සාක්ෂි ඇත.

උපතිස්ස මහරහතන් වහන්සේට පින්සිදුවන්නට අපට දැන් කිසිදු අවුලක් නොමැතිව පටිච්ඡ සමප්පාද ධර්මය අවබෝධ කර ගත හැකිය. යමෙක් පටිච්ඡ සමප්පාදය අවබෝධ කළොත් එයින්ම සෝවාන් ඵලයේ පිහිටන බව පිළි ගැනෙයි. දැන් අපි පටිච්ඡ සමුප්පාද ධර්මය අවබෝධ කරනු පිණිස විදසුන් වඩමු.

01. අවිජ්ජාඃ සත්වයා සසර බැඳ තබනුයේ අවිද්‍යාව නිසාය. අවිද්‍යාව යනු චතුරාර්ය සත්‍යය නොදන්නා කමයි. චතුරාර්ය සත්‍යය නොදත් යෝගියා දුක්ඛ සත්‍යය නොදනියි. දුක නොදන්නා කම නිසා දුකට හේතුව වන තෘෂ්ණාව ගැන නොදනියි. තෘෂ්ණාව ගැන නොදන්නා නිසා දුකෙන් මිදීමක් ගැන නොදනියි. දුකෙන් මිදීමක් ගැන නොදන්නා ඔහු දුකෙන් මිදෙන මාර්ගය අනුගමනය නොකරයි. මෙයාකාරයෙන් දුක්ඛ සමුදය නිරෝධ මාර්ග යන චතුරාර්ය සත්‍යය නොදත් කමින් සත්වයා තෘෂ්ණාව උපදවාගෙන දුක් සහගත සසර සසුරෙහි සැරිසරයි.

02. සංඛාරාඃ කාය සංඛාර, වචී සංඛාර, මනෝ සංඛාර වශයෙන් සංස්කාරයන් තුන් ආකාරය. පටිච්ච සමුප්පාදය අනුව සංස්කාරයන් යනු හේතුඵල වශයෙන් ඇතිවන එහා මෙහාවීම් සකස්වීම් ආදියයි. අවිද්‍යාව නිසා සත්වයා මවු කුසයට පැමිණීම් වශයෙන් ඇතිවන සකස්වීම් මෙහි සංස්කාර ලෙස අර්ථ දැක්වෙයි.



Scanned with CamScanner

03. විඤ්ඤාණ: සංස්කාර නිසා විඤ්ඤාණ හටගනී. මෙහි විඤ්ඤාණ යනු පෙර කී සකස් වීම් නිසා සුදුසු තත්වයට පැමිණි මවුකුසෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය බැස ගැනීමයි. ප්‍රතිසන්ධි විඤ්ඤාණය යනු හාපුරා කියා සත්වයා මවුකුස තුළට පැමිණ ලබන දැනුවත්වීමයි.

04. නාමරූප: පෙරකී ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඇසුරු කර නාම ධර්ම නම් වූ සිතුවිලි ක්‍රියාකාරිත්වයද රූප ධර්ම නම් වූ රූප කොට්ඨාසයන්ද පහළ වේ. විකසනය වේ.

05. සළායතන: මෙකී නාමරූප ඇසුරු කරගෙන මවුකුසේ සිටින සත්වයාගේ ඇස, කන නාසය ආදී ඉන්ද්‍රියයන් වර්ධනය වීම, විකසනය වීම ඇරඹෙයි.

06. ඵස්ස: මෙයාකාරයෙන් සළායතන වර්ධනය වීම නිසා මවුකුස සිටින සත්වයාට ස්පර්ශ ස්වභාවයෙන් සංවේදයනන් දැනෙයි.

07. වේදනා: පෙර කී ස්පර්ශය නිසා සැප, දුක්, උපේක්ෂා යන ත්‍රිවිධ වේදනා උපදී.

08. තෘෂ්ණා: පෙරකී වේදනාවන් සැප හෙවත් ඉෂ්ඨ ස්වරූපයේ වන කල්හි එය නැවත නැවත විඳීමේ තෘෂ්ණාවක් උපදී.

09. උපාදාන: මෙකී තෘෂ්ණාව නිසා කාම උපාදාන, දිට්ඨි උපාදාන, භව උපාදාන අවිජ්ජා උපාදාන යන සතර ආකාර ඇලීම් හටගනී.

10. භව: මෙකී ඇලීම් හෙවත් උපාදාන හේතුකොට සත්වයා භවයෙහි තවදුරටත් අල්ලාගෙන සිටියි. භවය යනු උත්පත්තිය ලබන මිනිස්ලෝක ආදී භවයන්ය.

11. ජාති: මෙකී භවයට සත්වයා බැඳීම මත ඔහු මවුකුස තුළ මෝරාගොස් උපත හෙවත් ජාතිය සිදුවේ.



Scanned with CamScanner

12. ජරා මරණ: උපත නිසා ජරා මරණාදී විපතට පත්වීමට සත්වයාට සිදුවෙයි.

අනුලෝම පටිච්ඡ සමුප්පාද භාවනාව වඩන යෝගියා මවුකුසේ පිළිසිඳගන්නා මිනිසකු හෝ තිරිසනකු එහි වර්ධනය වී මෙලොව එලිය දකින ආකාරය මෙයාකාරයෙන් මෙනෙහි කර අවබෝධ කර ගත යුතුය.

මෙකී හේතුඵල දාමය උපතිස්ස මහරහතන්වහන්සේ විසින් විස්තර කර ඇත්තේ එපරිද්දෙනි.

පටිච්ඡ සමුප්පාදය අනුලෝම ලෙස විදර්ශනා භාවනාවක් ලෙස ප්‍රගුණ කර එය ප්‍රතිලෝම ලෙසද ප්‍රගුණ කළ යුතුය. අනුලෝම පටිච්ඡ සමුප්පාදය හරිහැටි අවබෝධ කරගත හොත් ප්‍රතිලෝම පටිච්ඡ සමුප්පාදය ඉතා පහසුවෙන් වැටහේ. අපි දැන් ප්‍රතිලෝම පටිච්ඡ සමුප්පාදය අවබෝධ කිරීම සඳහා අභ්‍යාස කරමු.

01. අවිජ්ජා (අවිද්‍යාව) යනු චතුරාර්ය සත්‍යය නොදන්නා කමයි. චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත් යෝගියා දුක්ඛ සත්‍යය දනියි. දුකට හේතුව වන තෘෂ්ණාව ගැන දනියි. තෘෂ්ණාව ගැන දන්නා නිසා තෘෂ්ණාවෙන් මිදීමෙන් දුකෙන් මිදීම සිදුවන බව දනියි. දුකෙන් මිදීම ගැන දන්නා ඔහු දුකෙන් මිදෙන මාර්ගය අනුගමනය කරයි. එලෙස අනුගමනය කර අවිද්‍යාව මුලිනුපුටා දමයි. අවිද්‍යාව නැති තැන පෙර කී තෘෂ්ණාව පහළ නොවෙයි.

02. එමනිසා සංඛාරා හෙවත් මවුකුසට ඇතුළුවීමට දරන උත්සාහය ඇති නොවේ. අවිද්‍යාව අවසන් නිසා සත්වයා මවුකුසයට පැමිණීම් වශයෙන් ඇතිවන වෙනස්කම් ආරම්භ නොවේ.

03. සංස්කාර හෙවත් ගන්ධබ්බයා පැමිණීම සිදු නොවීම නිසා ප්‍රතිසන්ධි විඤ්ඤාණ විඤ්ඤාණය මවුකුස බැස ගැනීමක් සිදු නොවේ.



Scanned with CamScanner

04. පෙරකී ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඇසුරු කර නාම ධර්ම නම් වූ සිතුවිලි ක්‍රියාකාරිත්වයද රූප ධර්ම නම් වූ රූප කොට්ඨාසයන්ද පහළ වන බැවින් ප්‍රතිසන්ධි විඤ්ඤාණය බැස නොගත් තැන කළල රූපයක් විකසනය නොවේ.

05. එසේ නාමරූප ධර්ම හටගැනීමක් නොමැති තැන ඇස, කන, නාසය ආදී ඉන්ද්‍රියයන් වර්ධනය වීම විකසනය වීමක්ද නැත.

06. සළායතන වර්ධනය වීමක් නැති බැවින් ස්පර්ශ ස්වභාවයෙන් සංවේදයනන්ද නොදැනෙයි.

07. පෙර කී ස්පර්ශය නොමැති නිසා සැප දුක් උපේක්ෂා යන ත්‍රිවිධ වේදනා නූපදී.

08. වේදනා නොමැති තැන තෘෂ්ණාව නූපදී.

09. මෙකී තෘෂ්ණාව නැති නිසා කාම උපාදාන, දිට්ඨි උපාදාන, භව උපාදාන අවිජ්ජා උපාදාන යන සතර ආකාර ඇලීම් හට නොගනී.

10. මෙකී ඇලීම් හෙවත් උපාදාන නොමැතිකම හේතුකොට සත්වයා භවයෙහි තවදුරටත් අල්ලාගෙන සිටීමක්ද නැත. භවය යනු උත්පත්තිය ලබන මිනිස්ලෝක ආදී භවයන්ය.

11. මෙකී භවයට බැඳීම නැති බැවින් මවුකුස තුළ මෝරා ගොස් උපත හෙවත් ජාතිය සිදුවීමක්ද නැත.

12. උපතක් නැති තැන නිසා ජරා මරණාදී විපතට පත්වීමක්ද නොමැත.

ප්‍රතිලෝම පටිච්ච සමුප්පාදය මෙයාකාරයෙන් මෙනෙහිකර අවබෝධ කර ගත යුතුය.

යෝගියා තමන්ට පූර්ණ අවබෝධය ලැබෙන තුරු පහත සඳහන් පරිදි අභ්‍යාස කළ යුතුය.



Scanned with CamScanner

01. අවිජ්ජාව නිසා සංඛාර හටගනී ආදී ලෙස අනුලෝම පටිච්ච සමුප්පාදය මාතෘකා වශයෙන් මෙනෙහි කරන්න.

02. පෙර කී ලෙස අනුලෝම පටිච්ඡ සමුප්පාදය අවබෝධ කර ගැනීමට මානසික අභ්‍යාස කරන්න.

03. අවිජ්ජා නිරෝධයෙන් සංඛාර නිරෝධ වේ ආදී ලෙස ප්‍රතිලෝම පටිච්ඡ සමුප්පාදය මාතෘකා ලෙස මෙනෙහි කරන්න.

04. ඉහත සඳහන් ලෙස ප්‍රතිලෝම පටිච්ච සමුප්පාදය විස්තරාත්මකව අවබෝධ කර ගැනීමට උත්සාහ කරන්න.

උපතිස්ස මහරහතන්වහන්සේගේ පටිච්ඡ සමුප්පාද විවරණය මහා නිධාන සූත්‍රයෙහි එන විස්තරය හා හොඳින් ගැළපෙයි. විදේශීය ධර්ම ග්‍රන්ථ නොසලකා හැර පාළි අටුවා භාවිතයෙන් පමණක් පටිච්ඡ සමුප්පාදය කිසිසේත් තේරුම් කළ නොහැකිය.

ථෙරවාදී ක්‍රමයට සෝවාන් වෙන්නේ මෙහෙමයි.

මේ දිනවල මාගේ දුරකථන මාර්ග ඇවිරෙන තරමට විවිධාකාර ඇමතුම් ලැබෙමින් පවතියි. පසුගිය දිනක ලැබුණු එවැනි ඇමතුමකින් අමුතු චෝදනාවක් එල්ල විය.

"මහත්තය ලියන ලිපි පෙළ අපි නොවරදවාම කියවනවා. ඒත් ඇයි දැන් සිංහල ජාතිය අවදි කරන්න මොන මොනවත් ලියන්නෙ නැත්තෙ?"

"මොනව ලියන්න කියලද කියන්නෙ?"

"අර රෝහිනග්‍යා කට්ටිය ලංකාවෙ පදිංචි කරවන්න හදන එක ගැන ලියන්නකො. එතකොට තව ලියන්නකො අර අලුත් පිණ්ඩපාත ක්‍රමය ගැන. අඩු ගානෙ ඒක හරිද වැරදිද කියල ලියන්නකො."



CS Scanned with CamScanner

දුරකථන ඇමතුම ලබාදුන් තැනැත්තාගෙන් බේරෙන්නට බැරි තැන මම කොළයක් හා පෑනක් අතට ගත්තෙමි. රට ජාතිය ආගම වෙනුවෙන් කුමක් ලියන්නේදැයි කල්පනා කරමින් සිටින අතර තවත් අපූරු දුරකථන ඇමතුමක් ලැබුණි.

"මම කතා කරන්නෙ පාණදුරේ ඉඳගෙන. මම ගුරුවරියක්. මම මහත්තයා ලියපු බණ පොත් වැඩිහරියක් කියවල තියෙනවා. මම හැම ඉරිදාම නොවරදවා දිවයින පත්තරේ අරගෙන බුදුවරු සහ පිටසක්වළ බෝසත්වරු ලිපිය කියවනවා. මමත් හොඳට භාවනා කරන කෙනෙක්. මේ ළඟකදි ඉඳගෙන දෙවිවරු කොට්ඨාසයක් ඇවිත් මට දිගින් දිගටම අනතුරු ඇඟවීම් කරනවා."

"මොනවද ඒ අනතුරු ඇඟවීම්?"

"දෙවිවරු හොඳටම බයවෙලයි ඉන්නෙ. තව අවුරුදු පනහක් ඇතුළත සම්බුද්ධ ශාසනය අතුරුදන්වීමේ අනතුරක් තියෙනවා කියලයි දෙවිවරු කියන්නෙ. මහත්තයා ඇතුළත්ව හත්දෙනෙක්ම බුද්ධාගම බේරගන්න මේ ලෝකෙට ඇවිත් තියෙන බව දෙවිවරු කියනවා. ඒත් මාරයන්ගේ බලපෑම නිසා ඒ කවුරුත් එකිනෙකාගෙන් වෙන්වෙලා තනි ගමනක යනවා කියලයි දෙවිවරු කියන්නෙ. බුද්ධාගම බේරගන්න ආපු ඒ හත්දෙනා එකතු වුණොත් සියලු ප්‍රතිවාදී බලවේග යටපත් කරන්න පුළුවන් කියලයි දෙවිවරු කියන්නෙ."

ඔය කියන කතාව මා කල්තබාම අසා දැනුවත්ව සිටින එකකි. ඇය මෙන් මාද ඒ ගැන දැනුවත් වූයේ දේව නිකායන්ට අයත් වූවන්ගෙනි. එනමුත් මට හොඳාකාරව දැනෙන පරිදි මාර බලවේග මට වඩා බොහෝ බලවත්ය. අද රටෙහි බෞද්ධයෝ නොදැනුවත්කම නිසාම මාරයාගේ උගුල්වලට හසුව අන්ත අසරණව සිටිති. පෙරකී දුරකථන ඇමතුම දුන් ගුරුවරිය යස අගේට ඒ අන්තරාය විස්තර කළේ මෙසේය:



Scanned with CamScanner

"දෙවිවරු තවත් පුදුම දෙයක් කිව්වා. මාරයා එයාගෙ නියෝජිත පිරිසක් මේ ලෝකෙට එවලා භික්ෂු වේශයෙන් ශාසනයට ඇතුළත් කරලා තියෙනවලු. අද බුද්ධාගම කෑලි කෑලිවලට කඩන්නෙ මාරයාගෙ නියෝජිත පිරිසලු. ඒකෙ ප්‍රතිඵලය හැටියට අවුරුදු පනහකට මෙපිට බුද්ධ ශාසනය අතුරුදන් වෙන්න පුළුවන්ලු."

මිනිසකු තමන් උපන් රටට සේවය කිරීම ජාතිවාදයක් නොවේ. බුදුදහම රැකගන්නට ක්‍රියා කිරීම ආගම්වාදයක්ද නොවේ. එනමුත් සිංහලයකු තම ජාතියේ ආරක්ෂාව ගැන කතා කළොත් ජාතිවාදියකු ලෙස හංවඩු ගැසී සමාජයේ කොන්වෙයි. අන්‍ය ජාතීන් රටෙන් කෑල්ලක් ඉල්ලුවත් එය සුළු ජාතීන්ගේ අයිතියක් ලෙස හුවා දැක්වීම අද සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. එවන් වාතාවරණයක් තුළ බුදුදහමත් සිංහල ජාතියත් තව දශකයක් ඉදිරියට ආරක්ෂා වී තිබුණොත් එයද හාස්කමක් ලෙස සැලකිය හැකිය.

මම යළිත් සුපුරුදු මාතෘකාව ඔස්සේ ලිවීම අරඹමි. මා වඩාත් කැමති සෝවාන් මාර්ගය ගැන ලිවීමටයි. මට ඒ ගැන එක හුස්මට ලියාගෙන ලියාගෙන ලියාගෙන යා හැකිය. ආර්ය මාර්ගය ගැන ලිවීම ඒ තරමට සාමාන්‍ය දෙයකි. සමහරු මා ථෙරවාදය ගැන හරිහැටි නොදැන මූලික සූත්‍රවලින් පමණක් කරුණු තෝරා බේරා දෙන්නේ යැයි කල්පනා කරති. නැත. මා මුල් බුදුසමය වෙත යොමුවනුයේ ථෙරවාදය තුළ හොඳින් කිමිදී ඉන් ලබාගත් අත්දැකීම් සමුදායක්ද සමගය. ථෙරවාදී ගුරුවරුන් ඇසුරු කරමින් එක දිගට දින ගණන් භාවනා කළ අයුරු මට තවම අද මෙන් සිහිපත් වෙයි. මම සෝවාන් වීමට ඇති බලගතු ආශාව නිසාම ථෙරවාදී භාවනා ක්‍රම අවුරුදු හතක් එක දිගට වැඩුවෙමි. ඉන් පලක් නොලද බව මා කීවොත් එය ආර්ය මාර්ගයට කරන අසාධාරණයකි. ථෙරවාදී ක්‍රමයටද මාර්ගඵල ලද හැකිය. නමුත් එය දුෂ්කර හා දිගු මාවතකි.



CS Scanned with CamScanner

ථෙරවාදී ක්‍රමයට සෝවාන් වීමට කැමති අය නව මහා විදර්ශනා ඥාන වැඩීම නම් මාවත තෝරාගත යුතුය. ථෙරවාදී ඇදුරන්ට අනුව සෝවාන් වීමට වෙන විකල්ප මාවතක් නැත. අපි දැන් ථෙරවාදී ක්‍රමයට එක් එක් විදර්ශනා ඥාන උපදවමින් ඉදිරියට යමු.

දැන් ඔබ තෝරාගෙන ඇත්තේ ථෙරවාදී ක්‍රමයට සෝවාන් වෙන මාවතයි. මේ මාවතේ සැරිසැරීමට පෙර සංස්කාර යන වදනේ තේරුම වටහා ගත යුතුය. පංචස්කන්ධය යන්නේ විග්‍රහය හොඳින් දැන ගත යුතුය.

සකස්වීම් වෙනස්වීම් හා පිළියෙළවීම් සංස්කාර නම් වෙයි. වඩා පුළුල් අර්ථයෙන් ගතහොත් නිවන හැර අන් සියලු දෙය සංස්කාර ගණයට වැටෙයි. ථෙරවාදී ක්‍රමයට සෝවාන් වීමට කැමැති අය ඒ කාරිය ආරම්භ කළ යුත්තේද පවත්වාගෙන යා යුත්තේද ප්‍රතිඵලයට ළඟා විය යුත්තේද සංස්කාරයන් විදර්ශනාවට භාජනය කිරීමෙනි. නැතහොත් පංචස්කන්ධය විදර්ශනාවට භාජනය කිරීමෙනි.

දැන් අපි සංස්කාරයන් වෙත හැරෙමු. සංස්කාරයන් විදර්ශනාවට භාජනය කරන්නට පෙර අපේ ගමන් මග වඩාත් පහසු කර ගනිමු. සංස්කාරයන් විදර්ශනාවට භාජනය කිරීම කායානුපස්සනාවෙන් ඇරඹීම වඩාත් සුදුසුය. මහා සතිපට්ඨාන සූත්‍රයෙහි "ඉති අජ්ඣත්තිකවා බහිද්ධාවා කායේසු කායානුපස්සී විහරති" යනුවෙන් ධර්ම පාඨයක් වෙයි. මේ අනුව තමන්ගේ හෝ අනුන්ගේ යයි කියන්නාවූ ශරීර ස්වභාවයන් නිරීක්ෂණයෙන් කායානුපස්සනාව ඇරඹිය හැකිය.

දැන් සංස්කාර වෙත නැවත අවධානය යොමු කරමු. කය ගැන සැලකීමේදී සංස්කාරයන් තුන්වර්ගයක් ප්‍රකට වෙයි. කයේ සෙලවීම් සකස්වීම් ආදිය කාය සංස්කාර නම් වෙයි. වචනයට නැගීමට කරන උත්සාහය වචී සංස්කාර නම් වෙයි. සංඥා වේදනා දෙක මනෝ සංස්කාර නම් වෙයි.



Scanned with CamScanner

මෙයින් කාය සංස්කාර හෙවත් කයේ සෙලවීම් සකස්වීම් වඩා ප්‍රකට බැවින් අපි මුලින්ම ඒ ගැන අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වෙමු.

විදර්ශනා භාවනා කර්මස්ථානයක් තෝරාගෙන එය ප්‍රගුණ කරන යෝගියා මාර්ගඵල ලැබීමට කරන උත්සාහය තුළදී විදර්ශනා ඥාන නම් වූ සුවිශේෂී අවබෝධතා ඥාන ලබයි. මෙකී අවබෝධතා ඥාන ලැබීම නිවනට ටිකෙන් ටික කිට්ටු වීමකි. ථෙරවාදී ක්‍රමයට සෝවාන් වීමට කැමති පුද්ගලයා පළමුව ඝන සතර බිඳගැනීම යන විදර්ශනා අභ්‍යාසයෙන් සිය භාවනාව ආරම්භ කිරීම සුදුසුය.

ඝන සතර බිඳ දැමීමේ අභ්‍යාසය වසර දෙදහසකට වඩා පැරණි එකකි. එම අභ්‍යාසයෙන් සම්මර්ශන ඥානය නම් වූ ලෞකික ඥානයක් ලැබෙයි.

යෝගියා පළමුකොටම 'ඝන සතර' පිළිබඳ හොඳ අවබෝධයක් ලැබිය යුතුය. එම අවබෝධයට පැමිණීම ඝන සතර බිඳ දැමීම යනුවෙන් ව්‍යවහාර වෙයි. පෘථග්ජන සත්වයා ලෝක ස්වභාවය පිළිබඳ වැරදි වැටහීම්වල සිටින්නෙකි. එබඳු වැරදි වැටහීම්වලට එක් ප්‍රධාන හේතුවක් නම් අපගේ ආයතන හෙවත් සංවේදී ඉන්ද්‍රියන් විසින් රූප රාමු එක් කර චිත්‍රපට ජවනිකාවක් නිර්මාණය කරන්නා සේ ව්‍යාජ මවා පෙවීම් සිදු කිරීමයි. එබඳු ව්‍යාජ මවා පෙන්වීම් සතරකි.

01. සමූහ ඝනයඃ මෙලොව ඇති ලොකු සේ පෙනෙන සෑම දෙයක්ම කුඩා කුඩා දේවල හා හිස් ඉඩකඩෙහි එකතුවකි. සත්වයකු යනු කුඩා අංශු රැසක හා හිස් ඉඩකඩෙහි එකතුවකි. ගංගාවක් ලෙස ගලා බසින්නේ කුඩා කුඩා ජල බිඳිතිය. මෙලොව ඇති සෑම දෙයක්ම පරමාණු නම් වූ කුඩා අංශූන්ගේ ළංවීම නිසා තනි තනි රූපයන් ලෙස සැකසී ඇත. අපගේ ඉන්ද්‍රියයන් විසින් මවා පෙන්වන සත්වයන් පුද්ගලයන් සැබෑ ලෝකයේ නැත. මෙය අවබෝධයෙන් සමූහ ඝනය බිඳී යයි.



Scanned with CamScanner

සියලු දෙය කුඩා කුඩා අංශූ වලින් තැනී ඇත යන අවබෝධය ලැබෙයි.

02. සන්තති ඝනයඃ බොහෝ කලක් පවතින්නේ යයි පෙනෙන දෙයක් ඇත්තටම සියුම් වශයෙන් කාලයත් සමග වෙනස් වෙයි. එබැවින් එකම දෙය ලෙස කීමට නොහැකිය. මෙම කරුණ අවබෝධ කර ගැනීමෙන් සන්තති ඝනය බිඳී යයි.

03. කෘත්‍ය ඝනයඃ තනි ක්‍රියාවක් ලෙස පෙනෙන්නේ කුඩා කුඩා ක්‍රියාකාරකම් විශාල ගණනක එකතුවකි. උදාහරණ ලෙස අතක් එසවීම යනු කුඩා ක්‍රියාකාරකම් රාශියක එකමුතුවකි. එය අවබෝධයෙන් කෘත්‍ය ඝනය බිඳෙයි.

04. ආරම්මණ ඝනයඃ තනි අරමුණක් ලෙස පෙනුණද එක අරමුණක් තුළ සිතුවිලි ප්‍රවාහයක් ගලා යයි. විවිධාකාර සිතුවිලි ඒ අතර පහළ වෙයි. මෙය නොදැකීම ආරම්මණ ඝනයයි. මෙම කරුණ දැන ගැනීමෙන් ආරම්මණ ඝනය බිඳී යයි.

ඝන සතර බිඳ දැමීම කිහිප ආකාරයකටම කළ හැකිය. මෙහි ඉහත දක්වන ලද කරුණු කාරණා ගැන හොඳින් සලකා බැලීම පමණක් වුව ඝන සතර බිඳ ගැනීමට ප්‍රමාණවත් විය හැකිය. සෝවාන් මාර්ගය වැඩීමට කැමති යෝගියා ඝන සතර බිඳ ගැනීමත් සමඟ ඔහුට සම්මර්ශන ඥානය පහළ වෙයි. සම්මර්ශන ඥානය ලැබීමෙන් පසු යමක් ගැන සිහි නුවණින් සලකා බැලීමේ හැකියාව ලැබෙයි. සම්මර්ශන ඥානය ථෙරවාදී ආර්ය මාර්ගයේ මුලටම එන ඥානයයි. එනමුත් සම්මර්ශන ඥානය උසස් විදර්ශනා ඥානයක් හැටියට නොගැනෙයි. එය ලෞකික ප්‍රඥාවටම අයත් අවබෝධතා ඥානයකි.

සම්මර්ශන ඥානය ලද යෝගියා එතැන් සිට නාමරූප ව්‍යවස්ථාපන ඥානය වෙනුවෙන් අභ්‍යාස කළ යුතුය.



CS Scanned with CamScanner

නාමරූප ව්‍යවස්ථාපන ඥානය හෙවත් නාමරූප පරිච්ඡේද ඥානයද ලෞකික ඥානයකි. එනමුත් නාමරූප පරිච්ඡේද ඥානය විමුක්ති මාර්ගයේද විශුද්ධි මාර්ගයේද එන වැදගත් විදර්ශනා ඥානයකි. දැන් අපි නාම රූප ව්‍යස්ථාපන ඥානය ලැබීමට සැරසෙමු.

සත්වයා සැදුම් ලත් දේ නාම හා රූප ලෙස දෙකොට්ඨාසයකට බෙදිය හැකිය. ඒවා නාම ධර්ම හා රූප ධර්ම නම් වේ. නාමය විස්තර කිරීම වඩා දුෂ්කර බව විමුක්ති මාර්ගයේ සඳහන්ය. නාමය යන්නෙන් සිතුවිලි පරම්පරාව අදහස් වෙයි. නාමයට භෞතික පැවැත්මක් නොමැත. නාමය එක් රැස්වීමක් නොමැත. එනම් සිතුවිලි ප්‍රවාහය ගලා යාම මිසක එක්රැස්වීමක් නැත. නාමය වේගවත්ය. දැන ගැනීම, සලකා බැලීම, දැනුවත් වීම නාම ගණයටම අයත්ය.

රූපය - රූපයේ රැස්වීමක් ගොඩ ගැසීමක් ඇත. රූපයෙහි නාමයෙහි මෙන් වේගවත් වෙනස්වීමක් නැත. රූපය ඇවිදියි. හාන්සිවෙයි. හේත්තු වෙයි. නැවෙයි. දිග හැරෙයි. නාමය ඒ ක්‍රියා හඳුනා ගනී. රූපය අප්පුඩි ගසයි. නාමය අප්පුඩි ගසමියි දැන ගනියි. රූපය ගමන් කරන විට නාමය ගමන් කරමියි දැන ගනියි.

මෙයාකාරයෙන් විදර්ශනා භාවනා කරන යෝගියා නාම ධර්ම හා රූප ධර්ම අමිශ්‍රව පවතින බවත් නාමරූප ධර්ම පමණක්ම ඇති නමුත් පරමාර්ථ වශයෙන් සත්ව, පුද්ගල ආත්ම කියා දෙයක් නැති බවත් සත්ව පුද්ගල ආත්ම යනු පනවා ගැනීම් හෙවත් ප්‍රඥප්ති බවත් දැන අවබෝධ කර ගනී. මෙය නාමරූප පරිච්ඡේද ඥානය නමින් හඳුන්වනු ලබන අවබෝධයයි.

නාමරූප පරිච්ඡේද ඥානයෙන් ඉදිරියට ඇති ඥාන සැබෑම විදර්ශනා ඥාන ගණයට වැටෙයි. ලෝකෝත්තර පක්ෂයේ විදර්ශනා ඥානයන්හි මුල්ම එක උදයව්‍යය ඥානයයි.



CS Scanned with CamScanner

දැන් අපි උදයව්‍ය ඤාණය ලැබීමට අවශ්‍ය මූලික පසුබිම සකසා ගනිමු.

ඉපිද ජරාවට පත්වී නැසී යන ස්වභාවය අනිත්‍ය ලක්ෂණය නම් වෙයි. යමක් අනිත්‍ය නම් එය දුක් සහගත වෙයි. (යදනිච්චං තං දුක්ඛං) තවද යමක් දුක් වේ නම් එය අනාත්ම ස්වභාවය ගනී. (තං දුක්ඛං තදනත්තා)

උදයව්‍යය ඤාණය උපදවා ගැනීමට උත්සාහ කරන යෝගියා පංචස්කන්ධයෙහි ත්‍රිලක්ෂණ ස්වභාවය මෙනෙහි කරයි. මෙසේ කරද්දී උද්පාද, ස්ථිති, භංග යන ස්වභාවයන් තුනෙන් උත්පාද භංග යන දෙක වඩාත් හොඳින් ප්‍රකට වීම ඇරඹෙයි. මෙය උදයව්‍යය ඤාණයයි. උදයව්‍යය ඤාණය ලද යෝගියා සංස්කාර ධර්මයන් පෙණ හැළියක් ලෙස ඉපිදෙමින් බිඳෙන අයුරු අවබෝධ කරගත යුතු වෙයි. සකලවිධ වූ සංස්කාරයන්ගේ උදයව්‍යය ප්‍රත්‍යක්ෂ වන තුරු යෝගියා සිය අභ්‍යාසය කරගෙන යා යුතුය.

උදයව්‍යය ඤාණය සඳහා කළ හැකි මූලික අභ්‍යාස දෙකකි. ඉන් පළමුවැන්න වනුයේ පංචස්කන්ධය රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ ලෙස විග්‍රහ කර එක් එක් කොට්ඨාසයක් ඉපිද නැසෙන බව කල්පනා කර අවබෝධ කර ගැනීමයි. දෙවැනි අභ්‍යාසය වඩාත් පහසුය. එහිදී සංස්කාරයන් හෙවත් සංඛතයන්ගේ උදයව්‍යය ගැන විවෘත මනසින් යුතුව බලා සිටිනු ලැබෙයි. එහිදී යෝගියා කළ යුත්තේ සිතට අරමුණු වන ලෞකික දේහි ඉපිද නැසෙන ස්වභාවය ගැන සලකා බලමින් කාලය ගෙවීමයි. එක්තරා හොඳ මොහොතකදී ඔහුට සියලු සංස්කාර ධර්මයන් උතුරා යන කිරි හැළියක පෙණ මෙන් ඉපිද බිඳී යන ස්වභාවයක් පෙන්නුම් කරනු ඇත. මෙය සුපිරිසිදු උදයව්‍යය ඤාණයයි.

උදයව්‍යය ඤාණය ලෝකෝත්තර පක්ෂයට අයත් පළමු ඤාණයයි. මේ ඤාණය ලත් යෝගියාට නැවත නැවතත් ඊට



CS Scanned with CamScanner

සමවැදිය හැකිය. ඒ ඥානයට සමවැදුණු කල්හි සංස්කාරයන් ඉපිද නැසෙන ආකාරය ඔහුගේ සිතට ප්‍රකට වෙයි.

උදයව්‍යය ඥානය හොඳින් පුහුණු වූ පසු ලෝකෝත්තර පක්ෂයට අයත් දෙවන ඥානය වන භංගානුපස්සනා ඥානය ලැබීමට උත්සාහ කළ යුතුය. යෝගියා දැන් උදයව්‍යය ඥානයෙහි පරතෙරට පැමිණියෙකි. ඔහු සංස්කාරයන්ගේ ත්‍රිලක්ෂණය තවදුරටත් සලකා බලන කල්හි භංග ලක්ෂණයම වඩා හොඳින් ප්‍රකට වෙයි. මෙය භංගානුපස්සනා ඥානයයි. සංස්කාරයන්ගේ නැස්මට පමණක් සංවේදීව විදර්ශනා කිරීම වයලක්ඛණ විපස්සනා නම් වෙයි. උදයව්‍යය ඥානය හා භංනුපස්සනා ඥානය ගැන සූත්‍ර පිටකයේ පවා සඳහන් වෙයි. භංගානුදර්ශන ඥානය පහළවූ තැනැත්තාට එම ඥානයට සම වැදී කල්ගත කල හැකිය. එවිට සංස්කාර ධර්මයන්ගේ අභාවය පමණක් ඔහුට ප්‍රකට වෙයි.

භංගානුපස්සනා ඥානය ලද යෝගියා එතැන් සිට භයතුපට්ඨාන ඥානය වෙනුයෙන් අභ්‍යාස කළ යුතුය. සංස්කාරයන්ගේ භංගය දැක දැක තවදුරටත් විදර්ශනා කරන යෝගියා සංසාරය තවදුරටත් නොසිටිය යුතු බිය සහිත තැනක් බව වටහා ගනී. එය භයතුපට්ඨාන ඥානය නම් වෙයි. භයතුපට්ඨාන ඥානය ලද යෝගියා සංසාරයෙහි බිය මනාව වටහාගත් තැනැත්තෙකි. ඔහු සංසාරයට බිය වූවෙකි.

භයතුපට්ඨාන ඥානය ලද යෝගියා ආදීනවානුපස්සනා ඥානය සඳහා අභ්‍යාස කළ යුතුය.

යෝගියා තවදුරටත් සංස්කාරයන්ගේ ස්වභාවය දකිමින් විදසුන් වඩන කල්හි ඔහුට සංස්කාරයන්ගේ ආදීනව ප්‍රකට වෙයි. සංස්කාරයන් නිසාම සත්වයා විපතට වැටෙන අයුරු ඔහුට ප්‍රත්‍යක්ෂ වෙයි. එය ආදීනවානුදර්ශන ඥානය හෙවත් ආදීනවානුපස්සනා ඥානය නම් වෙයි.



Scanned with CamScanner

ආදීනවානුපස්සනා ඥානය ලද යෝගියා එතැන් සිට නිබ්බිදානුපස්සනා ඥානය වෙනුවෙන් අභ්‍යාස කළ යුතුය. තවදුරටත් සංස්කාරයන් ඉපිද නැසීම විමසීමට ලක් කරන යෝගියා සංස්කාරයන්හි නොඇලීමට පත්වෙයි. එය නිබ්බිදානුපස්සනා ඥානය නම් වෙයි.

නිබ්බිදානුපස්සනා ඥානය ලද යෝගියා මුංචිතුකම්‍යතා ඥානය වෙනුවෙන් අභ්‍යාස කළ යුතු වෙයි. තවදුරටත් සංස්කාරයන් ඉපිද නැසීම විදර්ශනාවට ලක් කරන යෝගියා සංසාරයෙන් මිදෙනු කැමති වෙයි. එය මුංචිතුකම්‍යතා ඥානය නම් වෙයි.

මුඤ්චිතුකම්‍යතා ඥානය ලද යෝගියා එතැන් සිට ප්‍රතිසංඛ්‍යානුපස්සනා ඥානය වෙනුවෙන් වෙහෙසිය යුතුය. තවදුරටත් විදර්ශනා වඩන ඔහු සංසාරයෙන් මිදෙනු කැමතිව ඊට අවශ්‍ය ක්‍රියාත්මක වීම්හි අනුපිළිවෙළ දකියි. එනම් සියලු සංස්කාර මෙම අවස්ථාව වන විට ශුන්‍ය බව වැටහෙයි. සියලු සංස්කාරයන් ශුන්‍යයයි පෙනී යන ඥානය පටිසංඛානුපස්සනා ඥානය හෙවත් ප්‍රතිසංඛ්‍යානුපස්සනා ඥානය නම් වෙයි.

ප්‍රතිසංඛ්‍යානුපස්සනා ඥානය ලද යෝගියා සංස්කාරෝපේක්ෂා ඥානය වෙනුවෙන් වෙහෙසිය යුතුය. සංස්කාරෝපේක්ෂා ඥානය ථෙරවාදී සෝවාන් මාර්ගයේ ඇති වැදගත්ම ඥානය ලෙස හැඳින්වීමේ වරදක් නැත. යෝගියා ඒ ඥානය ලබනු පිණිස සංස්කාරයන්ගේ ශුන්‍යතාව අරමුණු කර භාවනා කරයි. ඒ සඳහා ථෙරවාදී ක්‍රමයට නිර්දේශිත කර්මස්ථානය චතුස්කෝටික ශුන්‍යතා භාවනාව නම් වෙයි. චතුස්කෝටික ශුන්‍යතා භාවනාව මෙසේය.

01. මාගේ කියා ගත හැකි ආත්මයක් නොමැත්තේය.

02. අනුන්ගේ කියා ගත හැකි වූ ආත්මයක්ද නොමැත්තේය.

03. අනුන්ගේ කියා කිය හැකි කිසිවක් නොමැත්තේය.



Scanned with CamScanner

04. තමන්ගේ කියා කිය හැකි කිසිවක්ද නොමැත්තේය. මෙසේ නානා ආකාරවලින් යෝගියා ශුන්‍යතාව පිළිබඳ අවබෝධ කර ගැනීම මෙම අභ්‍යාසයන්හි අරමුණයි.

මෙයාකාරයෙන් ශුන්‍යතාව පිළිබඳ භාවනාව වඩන යෝගියා සියලු සංස්කාරයන් කෙරෙහි මැදහත් බව ඇති කෙරෙන සංස්කාරෝපේක්ෂා ඥානය ලබයි. සංස්කාරොපේක්ෂා ඥානය මෙතැන් සිට ඉදිරියට ඇති සියලු මාර්ගඵලයන්ට ඇති ප්‍රවේශ මාර්ගයයි. සංස්කාරෝපේක්ෂා ඥානය ලද යෝගියා ඊට නිතර සමවැදීම් වශයෙන් එය බහුල කර ප්‍රගුණ කළ යුතුය. ඔහුට කැමැති නම් මම අසවල් කාලයක් සංස්කාරෝපේක්ෂා ඥානයට සමවැදී සිටිමි යනුවෙන් අදිටන්කොට ඒ තාක් සංස්කාරයන් කෙරෙහි උපේක්ෂාවෙන් කල්ගත කළ හැකිය. අවශ්‍ය නම් මුළු දවසක් වුවද සංස්කාරෝපේක්ෂාවෙන් කල්ගත කළ හැකිය. ඒ තාක් ඔහුට කිසිදු දෙයක් ගැන ඇලීමක් ගැටීමක් ඇති නොවී උපේක්ෂාවෙන්ම කල්ගත කළ හැකිය.

සංස්කාරෝපේක්ෂා ඥානය ලද යෝගියා ආර්ය මාර්ගයේ වැදගත් කඩඉමක් පසුකළ අයෙකි. ථෙරවාදී ක්‍රමය අනුව සංස්කාරෝපේක්ෂා ඥානය පිරිහීමට ලක් නොවේ. මරණයෙන් පසු ඊළඟට උපදින ආත්ම භාවය දක්වා වුවද සංස්කාරෝපේක්ෂා ඥානය එලෙසම නොපිරිහී පවතින බවට විශ්වාසයක් ඇත.

මෙයාකාරයෙන් සංස්කාරෝපේක්ෂා ඥානය ලබා ගත් යෝගියා එයට නැවත නැවත සමවැදීම් වශයෙන් ප්‍රගුණ කර ඉන් අනතුරුව තමා ලද සංස්කාරෝපේක්ෂා ඥානයම විදර්ශනාවට ලක්කළ යුතුය. එකල්හි ඔහුට අනුලෝම ඥානය නම් වූ ඥානයක් උපදියි. අනුලෝම ඥානය එනමින් හැඳින්වෙනුයේ ආර්යමාර්ගයේ ඵලයට යොමුකරන බැවිනි. අනුලෝම ඥානය සංසාරයේ එකම එකවරක් ලැබෙන ඥානයකි. ඊට දෙවරක් පැමිණිය නොහැක්කේය. අනුලෝම



Scanned with CamScanner

ඥානයෙන් අනතුරුව ගෝත්‍රභූ නම් ඥානයක් උපදියි. ගෝත්‍රභූ ඥානය ලද යෝගියා පෘථග්ජන ගෝත්‍රය ඉක්මවාලන බැවින් එනමින් හැඳින්වෙයි.

පෙර සඳහන් කළ ගෝත්‍රභූ ඥානයෙන් අනතුරුව නිවන අරමුණු කරගනිමින් සෝවාන් මාර්ගඥානය නැතහොත් සෝවාන් මාර්ග චිත්තය නම් වූ සිතක් උපදියි. ථෙරවාදී විග්‍රහය අනුව යෝගියා සෝවාන් මාර්ගයට පිවිසෙනුයේ සෝවාන් මාර්ග චිත්තය ඇතිවන මොහොතේදීය.

සෝවාන් මාර්ගඥානයට වහා අනතුරුව එහි විපාක ලෙස සෝවාන් ඵල සිත වාර දෙකක් හෝ තුනක් (නැතහොත් හතරක්) ඉපිද නිරුද්ධ වෙයි. යෝගියා ප්‍රථම මාර්ගඵලය ලබනුයේ එලෙසය. සෝවාන් ඵල ලාභියා වෙන කිසි උත්සාහයක් නොදැරුවද තවත් සත්වරකට වඩා නූපදියි.

සෝවාන්ඵලයට අනතුරුව එළඹෙනුයේ භවාංග චිත්තයකි. ඉන් අනතුරුව තමන් ලද ඵලය ප්‍රත්‍යවේක්ෂණය (පසක් කර ගැනීම) පිණිස වූ පංචප්‍රත්‍යවේක්ෂණ ඥාන උපදියි. පංචප්‍රත්‍යවේක්ෂණ ඥාන මෙසේය.

01. තම මාර්ගය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය

02. තමන් ලද ඵලය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය

03. තමන් ප්‍රහීණ කළ කෙළෙස් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය

04. තමන්ට ඉතිරිව ඇති කෙළෙස් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය

05. තමන් මේ ධර්මය අරමුණු වශයෙන් අවබෝධ කරන ලදැයි වන ප්‍රත්‍යවේක්ෂණය

සෝවාන්, සකෘදාගාමී, අනාගාමී යන මාර්ගඵල තුනටම මෙයාකාර වූ ප්‍රත්‍යවේක්ෂණ පහ බැගින් වෙයි.

07. සුරාසොඬෙක් සෝවාන් වී මුළු රටම කැළඹෙයි.

දැන් සැලකිය යුතු තරම් පිරිසක් මූලික සූත්‍ර ඇසුරෙන් ආර්ය මාර්ගය වැඩීමට ඉදිරිපත්ව සිටිති. එය අපට සතුටට



CS Scanned with CamScanner

කරුණකි. සමහරු අපගේ උපදෙස් අනුව භාවනා කර සිය අත්දැකීම් නොමසුරුව හුවමාරු කර ගනිති. එයද පැසසිය යුතු කරුණකි. බුද්ධ කාලීන භාරතයේ කුරු රට විසූ ජනතාව එදිනෙදා ජීවිතයේ වැඩ කටයුතු අතර පවා භාවනා කර්මස්ථාන ගැන සාකච්ඡා කළ බව අට්ඨකතාවන්හි සඳහන්ය.

මා විසින් හෙළි කළ තොරතුරු අනුව අමිතාභය බුදුන් ඇතුළු පිටසක්වළ බෞද්ධයන් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමේ සාමාර්ථය ලද අයද කලාතුරකින් සිටිති. පිටසක්වළ බෞද්ධයන්ගෙන් දැන් දැන් ලැබෙන තොරතුරු හොඳ නැත. තවත් දශක කිහිපයක් ඉක්ම යන විට ලක්දිව සම්බුද්ධ ශාසනය අතුගෑවී යන අවදානමක් ඇති බව ඔවුහු එකාවන්ව කියා සිටිති. පිටසක්වළ බෞද්ධයන් නිතර නිතර මතක් කරන ඒ අනතුරු ඇඟීම් පහත දැක්වෙන පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

"දැන් එළඹ ඇත්තේ අතිශය තීරණාත්මක කාලයකි. සම්බුද්ධ ශාසනයේ කේන්ද්‍රස්ථානය වූ ශ්‍රී ලංකාවෙන් බුදුදහම අතුගෑවී යාමේ අන්තරායක් එළඹ ඇත. එයාකාරයෙන් බුදුදහම අතුගෑවී යාමට හේතුව නම් මාරදිව්‍යපුත්‍රයන් විසින් දිනෙන් දින අලුත් මුහුණුවරවලින් සද්ධර්මය අන්තර්දාන කිරීමේ සැලස්මවල් ක්‍රියාවට නැංවීමයි. බුද්ධ ශාසනය අන්තර්දාන වන්නේ ප්‍රධානකොටම අන්‍යාගමිකයන්ගේ වික්‍රමයන් නිසා නොව භික්ෂුවේශධාරී මාරපුත්‍රයන්ගේ ක්‍රියාවන් හේතුකොටගෙනය."

"දැන් මාරපුත්‍රයෝ භික්ෂුවේශධාරීව සමාජගතව සිටිති. මාරපුත්‍රයන්ගෙන් ශාසනය බේරාගැනීමේ අරමුණ පෙරදැරිව ලංකාද්වීපයේ මිනිසුන්ව උපන් දෙවිවරු සත්දෙනෙක් වෙති. මාරදිව්‍යපුත්‍රයන්ගේ බාධා කිරීම් නිසා ඔවුන්ටද සිය අරමුණට යාමට නොහැකිව ඇත. දිනෙන් දින වැඩි දියුණු වන මාරබලය පරාජය කිරීමට ඇත්තේ එකම එක ක්‍රමයකි.



Scanned with CamScanner

බුදුදහමට ලැදි පිරිස් සමථ භාවනාව හැකිතාක් දියුණු කළ යුතුය. සමථයෙන් ලැබෙන චිත්ත ශක්තියෙන් මාරබලවේග යටපත් කළ හැකිය."

සැබෑ බුද්ධපුත්‍රයන් වහන්සේලාගෙන් භික්ෂුවේශධාරී මාරපුත්‍රයන් හඳුනාගැනීම අපහසු නැත. යමෙකු බුද්ධ භාෂිතය සිය මතයට නොගැළපීම මත අවලංගු කරන්නට උත්සාහ දරන්නේ නම් ඔහු බුද්ධපුත්‍රයකු නොව මාරපුත්‍රයකුමය. අභිධර්ම පිටකය අවලංගු කර දැමීමේ උත්සාහයක් මේ දිනවල ක්‍රියාත්මක වෙයි. ආර්ය මාර්ගයේ යන්නවුන් අධෛර්යයට පත් කරන ක්‍රියාමාර්ගයන්ද මේ කාලසීමාව තුළ බහුලය. තමන් හැර වෙනත් විමුක්තිදායකයන් නොමැති බව කියන පිරිස්ද එන්න එන්නම වැඩිවන සෙයක් පෙනෙයි. මූලික සූත්‍රවල ඇතුළත් ධර්ම කරුණු අවලංගු කර දැමීමේ අයිතියක් කිසිවකුට නැත. යමෙකු එවන් උත්සාහයක නිරත වේ නම් අනිවාර්යයෙන්ම ඔහු භික්ෂුවේශධාරී මාරපුත්‍රයෙකි. ඔහුගේ අරමුණ වනුයේ මාරදිව්‍යපුත්‍රයාගේ පිරිස වැඩි කරනු පිණිස ශාසන අන්තර්ධානයට මග සැලසීමයි.

අප මෙතෙක් ප්‍රධාන මාතෘකාව ලෙස සෝවාන් මාර්ගය පිළිබඳ දීර්ඝ අධ්‍යයනයක් කරනු ලැබීය. අපි සෝවාන් මාර්ගය ගැනත් සෝවාන් ඵලය ගැනත් සාකච්ඡා කර හමාර කළෙමු. දැන් අපි ඊළඟ මාතෘකාවට යාමට පෙර සරල පුනරීක්ෂණ අභ්‍යාසයක යෙදෙමු. සෝවාන් මාර්ගය හරිම සරලය. එහි අනුයාත පියවර හතරක් පමණක් ඇත. ඒ පියවර හතර වනුයේ සත්පුරුෂ සේවනය, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝ මනසිකාරය හා ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යන සරල ක්‍රියාවන් හතරයි. ඒ ක්‍රියාවන්ට අවතීර්ණව මාර්ගඵලය කරා පැමිණෙමින් සිටින පුද්ගලයා සෝවාන් මාර්ගලාභියෙකි. සෝවාන් මාර්ගලාභීහු දෙදෙනකු වෙති. සද්ධානුසාරියා සද්ධාව වැඩිකරගන්නා මාවතේ ගමන් කරයි. ධම්මානුසාරියා ධර්මය ඉගෙන සැක දුරුකිරීමේ මාවතේ ගමන් කරයි.



Scanned with CamScanner

සද්ධානුසාරියාද ධම්මානුසාරියාද ඔවුනොවුන් පරයා යන වේගයෙන් සෝවාන් ඵලයට පැමිණෙයි.

සෝවාන් මාර්ගය වැඩී අවසානයේ ඇතිවන සෝතාපන්න මාර්ග චිත්තයෙන් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා හා සීලබ්බත පරාමාස යන සංසාර බැමි තුන ලිහී යයි. ඒ හා සමගම ඵළඹෙනුයේ සෝවාන් ඵලයයි.

යමෙකු සෝවාන් ඵලයට පැමිණි කල ඔහු කෙරෙහි සෝතාපන්න අංග හතර පිහිටයි. බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාව, ආර්ය සංඝරත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාව හා මුලින් මැදින් අගින් නොකැඩුණු පංච ශීල ප්‍රතිපදාව යන සෝතාපන්න අංග හතර සෝතාපන්න ඵල ලාභියා තුළ පිහිටයි. එසේම යමෙකු සෝතාපත්ති අංග හතර සමාදන් වුවහොත් ඔහුද සෝතාපන්නයකු යන නම ලැබීමේ සුදුස්සෙකි.

තමන් කෙරෙහි සෝතාපන්න අංග හතර ඇති බව සැකහැර ගත්තේ නම් තමන්ට තමන් සෝතාපන්නයකු බව නොබියව සමාජය ඉදිරියේ ප්‍රකාශ කළ හැකිය. සෝතාපන්න ඵලයට පැමිණීම ඉතා පහසුය. ඉදිරි මාර්ගඵල වෙත පැමිණීම අනුක්‍රමයෙන් අපහසු වෙයි.

සෝතාපන්න ඵලය හා බැඳුණු රස කතා රැසක් සූත්‍ර පිටකයේද අට්ඨකථාවන්හිද එයි. ශරකානි ශාක්‍යයාගේ කතාව එයින් වඩාත්ම රසවත් එකයි.

පෙරකල බෞද්ධ පිරිස් සිය ඥාතීන් මිය ගිය කල්හි බුදුන්වහන්සේ වෙත පැමිණ ඔවුන් යළි උපන් ආත්මභාවය විමසා බැලීමේ සිරිතක් විය. බීමත්ව කාණු පල්ලේ බුදියගෙන කොළේ ඉරාගත් ශරකානි ශාක්‍යයා සිය ආයුෂ අවසන මිය පරලොව ගියේය. ඔහුගේ ඊළඟ ජන්මය පිළිබඳ රසකතා ඇසීමට කැමති වූ ශාක්‍යයෝ බුදුන්වහන්සේ වෙත පැමිණ ඔහුගේ මරණය ගැන දැනුම් දුන්හ.



CS Scanned with CamScanner

"ශරකානි සෝවාන්ඵල ලාභියෙක්. එයා මරණින් මතු දෙව්ලොව උපන්නා."

බුදුන්වහන්සේගේ හෙළිදරව් කිරීමෙන් ශාක්‍ය ජනපදය කැලඹී ගියේය. සුරාසොඬකු වූ ශරකානි ශාක්‍යයා දෙව්ලොව ගිය කතාව ඔවුන් පිළිගත්තේම නැත. ඔවුහු එක්ව සාකච්ඡා කොට නැවත බුදුන් හමුවට පැමිණියහ. ඔවුන්ගේ එකම ඉල්ලීම වූයේ බේබද්දන්ට සෝවාන් සහතිකය ලබා නොදිය යුතු බවයි. එවේලෙහි බුදුහු මෙසේ ප්‍රකාශ කළහ.

"මා සෝතාපන්න ඵලව විනිශ්චය කරනුයේ සෝතාපන්න ඵල අංග හතරේ පැවැත්ම අනුවය. අර ජේන සල්ගස් පෙළ දෙස බලව්. ඒවාටද සෝතාපන්න අංග තිබුණේ නම් මම ඒවාද සෝවාන් වී ඇති බව කීමට පසුබට නොවෙමි. අජීවී සල්ගස් ගැන කතාව එසේනම් මිනිසුන් ගැන තව කවර කතාද?"

ශරකානි ශාක්‍යයා සෝවාන් ඵලයට පැමිණි පසුවද මත්පැන් පානය කළේද යන බැරෑරුම් ප්‍රශ්නයට පිළිතුරක් ලබා නොදී මෙතැනින් ඉදිරියට යාම නුසුදුසුය. සංයුක්ත නිකායේ ශරකානි සූත්‍රය, දුතිය ශරකානි සූත්‍රය හා සාලෙය්‍යක සූත්‍රය යන සූත්‍ර ධර්මයන් තුනෙහිම ශරකානි ශාක්‍යයාගේ කතාපුවතේ විවිධ කොටස් ඇතුළත්ය. ශරකානි ශාක්‍යයා සිය ජීවිතයේ අවසන් කාලයේදී මත්පැනෙන් වැළකී සිටි බව දුතිය ශරකාන සූත්‍රයේ සඳහන්ය.

බේබද්දෙකුට වුව සෝවාන් වීමේ තහනමක් නැත. එනමුත් තමන් සෝවාන් වී සිටින බව දැනටමත් මත්පැන් පානය කරන අයකු ප්‍රකාශ කරන්නේ නම් එය නොමඟ යවනසුලු හා ධර්ම විරෝධී ප්‍රකාශයකි. මන්දයත් මුලින් මැදින් අගින් නොකඩන ශීල ප්‍රතිපදාවක් ඔහුට නැති බැවිනි. සප්ත විසුද්ධි ක්‍රමයට අනුව ශීල විසුද්ධිය මුලට එයි. ශීල විසුද්ධියෙන් තොර චිත්ත විසුද්ධියක් නොමැත. එසේම ශීල සමාධි ප්‍රඥා යන ගුණස්කන්ධයන් තුනෙන් ශීලය ප්‍රමුඛ වෙයි.



CS Scanned with CamScanner

ශීලයෙන් තොර සමාධියකින් ප්‍රඥාවක් ලද නොහැකිය. ආර්ය මාර්ගය තරණයට කැමති පිරිස් පළමු පියවර ලෙස ශීලයෙන් පිරිසිදු විය යුතුය. මාර්ගඵල සඳහා උත්සාහ කළ යුත්තේ ඉන් පසුවය. බීජ වපුරන්නට පෙර බිම සැකසිය යුතුවාක් සේම ආර්ය මාර්ගය තරණය කිරීමට පෙර ශීලාදී ප්‍රතිපත්තීන් වෙත පැමිණිය යුතුය. අද භාවනා කරන බොහෝ දෙනෙකුට ප්‍රතිඵල නැත්තේ ඔවුන් ශීලාදී ප්‍රතිපත්තීන් ගරු නොකරන බැවිනි.

සෝවාන් ඵලය ගැන කතා කරන විට මහානාම ශාක්‍යයා අමතක කළ නොහැකිය. මහානාම රජු සුද්ධෝදන රජුගේ සමීපතම ඥාතියෙකි. මහානාම බුදුබණ අසා සෝවාන් වූවෙකි. එහෙත්, ඔහු තද කේන්තිකාරයෙකි. තමන්ට කුලප්පු වූ අසකු හෝ කුලප්පු වූ මිනිසෙකු දුටු කල හැඟීම් පාලනය කරගත නොහැකි වන බව මහානාම බුදුන්වහන්සේට කීය.

කොසොල් රජුගේ පුත්‍රයකු වන විඩූඩභ ශාක්‍ය ජනපදය ආක්‍රමණය කර මහා ජන සංහාරයක් කිරීමේ පසු මහානාම ශාක්‍යයාට රජය කරගෙන යාමට කීය. මහානම එයින් මහත් කෝපයට හා ලැජ්ජාවට පත්වූයේය. හේ සියදිවි නසා ගන්නට සිතාගෙන කොණ්ඩය කකුලෙහි පටලවාගෙන දියෙහි ගිලුණේය. මහානාමගේ පින් බලයෙන් නාගලෝකය කම්පා විය. නාලොව රජු මහානාම මුදවාගෙන පොළොව පත්ලට රැගෙන ගොස් ඇති පදම් සත්කාර සංග්‍රහ කර කැමති කලක් එහි නැවතින්නැයි ඉල්ලා සිටියේය. යළි මෙලොවට පැමිණීමට නොකැමැති වූ මහානාම නාගලෝකයේම වාසය කළේය. නාගලෝකයේ වසර දොළහක් ජීවත් වූ මහානාම ආයුෂ අවසානයේ මියගොස් දෙව්ලොව උපත ලද්දේය.

අනාථ පිණ්ඩික සිටුතුමාට කාල නම් පුත්‍රයෙක් සිටියේය. කාල සිටුපුත්‍රයා ධර්මයට ලැදියාවක් නොදැක්වූ අයෙකි. ඔහු බණ අසන්නට යවනු පිණිස සන්තෝසම් දීමට පියාට සිදු විය. අවසානයේ ඔහු බණ අසා සෝවාන් ඵලයට පැමිණියේය.



Scanned with CamScanner

සෝතාපන්න ඵලයට පැමිණීම ඉතා සරල ප්‍රතිඵලයක්ය යන්න මේ හැම කතාවක්ම පිටුපස දිවෙන මූලික හරයයි. බුද්ධ කාලයේ ජීවත්ව සිටි නූගතුන් හා පොඩිදරුවන් පවා සෝවාන් වූ හැටි අට්ඨකථාවන්හි සවිස්තරව දැක්වෙයි. එනමුත් අවාසනාවකට මෙන් අප රට බහුතර බෞද්ධ පිරිස තවම සෝවාන් වීමට සූදානම් නැත. ඔවුන්ට සෝවාන් වීමට වත් ඉස්පාසුවක් නැත. සෝවාන් ඵලය ලබා ගැනීම පහසු බව කීවොත් විවිධාකාර තර්ක විතර්ක කියා මගහැර යති.

ශාසන අන්තර්දානය පිළිබඳව අප විසින් මතක තබා ගත යුතු අතිශය වැදගත් කරුණක් වෙයි. ශාසනය අන්තර්දාන වන දිනය තීරණය වනුයේ අවසන් සෝතාපන්නයා මෙලොව හැර යාමෙනි. මෙලොව මාර්ගඵල ලාභීන්ගෙන් හිස් වන විටම ශාසන අන්තර්ධානය ආරම්භ වනු ඇත. බුද්ධ ශාසනය තව බොහෝකලක් පවතිනු දැකීමට කැමති පිරිස් වේ නම් මාර්ගඵල ලාභය පිණිස අනලස්ව සමථ විදර්ශනා භාවනා වැඩිය යුතුය.

සෝතාපත්ති ඵල සමාපත්තිය තරමක විවාදයට බඳුන්වූ මාතෘකාවකි. සෝතාපත්ති ඵල සමාපත්තිය යන නාමය සූත්‍ර පිටකයේ සඳහන් වනුයේ එකම එක තැනක පමණි. ඒ සම්බුද්ධ පරිනිර්වාණයෙන් සියවසකට පසු ලියැවුණු පටිසම්භිදාමග්ගප්ප කරණයෙහිය. පටිසම්භිදාමග්ගප්ප-කරණය එහි නාමයද අන්තර්ගතයට අනුව අභිධර්ම ග්‍රන්ථයකි. ඒ කොයිහැටි වෙතත් පටිසම්භිධාමග්ගප්ප-කරණය සූත්‍ර පිටකයේ කොටසක් ලෙස දිගටම සලකනු ලැබීය. පටිසම්භිධාමග්ගප්ප කරණයෙහි 'සෝතාපත්ති ඵල සමාපත්තිය දත යුතුය' යනුවෙන් යෙදුමක් ඇත. බුද්ධකාලීන භාරතීය සමාජයේ සිටි සෝතාපත්ති ඵලලාභීන්ගෙන් ඉඳහිට කෙනෙකුවත් ඵල සමාපත්තියට සමවැදුණු බවට එයින් ඉඟි කෙරෙයි.



Scanned with CamScanner

සෝතාපත්ති ඵල සමාපත්තියට සමවැදීමේ දක්ෂකම ඇති අය ගැන සූත්‍ර පිටකයේ එකම එක උදාහරණයක් පමණක් ඇත. ඒ දක්ෂකම පෑවේ සිරිමා නම් ගණිකාවයි. සිරිමා ගණිකාව සෝතාපන්න ඵලයට පැමිණි තැනැත්තියකි. ඕ මරණින් මතු දිව්‍යාංගනාවක් බවට පත්ව තමන් ඵල සමාපත්තියට සමවැදීමේ හැකියාව ලබා ලබා ගෙන සිටි බව හෙළිදරව් කළාය. සිරිමාව සෝවාන් වීම පිළිබඳ කතා ප්‍රවෘත්තිය ඉතා දීර්ඝ එකකි. එය අන්තර්ගතව ඇත්තේ විමාන වස්තුවෙහිය.

ඵල සමාපත්තිය හා අනිමිත්ත අනිමිත්ත චේතො විමුක්තිය යන යෙදුම් සමානාර්ථයෙහි යෙදෙයි. නිවනෙහි අනිමිත්ත, සුඤ්ඤත, අසංඛත යන ගුණ පවතියි. අනිමිත්ත යනු නිමිති රහිත බවයි. සුඤ්ඤත යනු හිස් බවයි. අසංඛත යනු සංස්කාරයන්ගෙන් නොසෑදුණු බවයි. නිවනේ එක් ගුණයක් වන නිමිති රහිත බවට සිත යොමුකර සමාධිගත වීම අනිමිත්ත සමාධියයි. අනිමිත්ත සමාධිය මාර්ගඵල ලාභීන්ට පමණක් විෂය වන එකක් බවද එය චතුර්ථධ්‍යානය දක්වාම ඉහළ නැංවිය හැකි බවද මූලික සූත්‍රයන්හි සඳහන්ය.

සාමාන්‍යයෙන් සිත සමාධිගත කරනුයේ ප්‍රතිවිරුද්ධ ධර්ම මැඬ පැවැත්වීම භාවනා නිමිත්තට නැවත නැවතත් සිත යොමුකිරීම යන ක්‍රියාකාරකම් දෙක මගිනි. ඊට ප්‍රතිවිරුද්ධ ධර්ම මැඩ පැවැත්වීමේ ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලැබෙයි. අනිමිත්ත සමාධියට සමවදිනුයේ ප්‍රතිවිරුද්ධ ධර්ම මැඬපැවැත්වීමේ ක්‍රමයට වෙනස් ක්‍රමවේදයන් තුළිනි.

සෝවාන් ආදී වූ මාර්ගඵල සතරටම අදාළව පවත්නා මාර්ගඵල සමාපත්තීන් අනිමිත්ත සමාධියෙහි ආකාරයන් කිහිපයකි. අරූප ධ්‍යානයකට සමවැදී එතැනින් අනිමිත්ත සමාධියට සමවැදීමේ ක්‍රමයක්ද සූත්‍ර පිටකයේ දැක්වෙයි. සෑම මාර්ගඵලයකටම අදාළව ඵල සමාපත්තියක් ඇති බව විසුද්ධි මාර්ගයේ දැක්වෙයි. විසුද්ධිමාර්ගය අනුව සෑම මාර්ගඵලලාභියකුටම තමන් ලද ඵලයට අදාළව සමාපත්තියට



Scanned with CamScanner

සමවැදිය හැකි අතර ඊට ඉහළින් ඇති ඵලයේ සමාපත්තියට සමවැදීමට හැකියාව නැත. කෙසේ නමුත් විසුද්ධිමාරයෙන් නියෝජනය කරන්නේ ක්‍රිස්තුවර්ෂ පස්වන සියවසේ පමණ මහාවිහාරිකයන් දරන ලද මතයයි.

ඊට හාත්පසින්ම වෙනස් මතයක් අභයගිරිවාසීන් දරා ඇත. අභයගිරිවාසීන්ට අනුව තමන් ලද ඵල සමාපත්තිය හැකිතාක් තීව්‍ර කිරීම, ලද ඵලයේ සමාපත්තියට සම නොවැදීමට අදිටන් කිරීම සහ අනිමිත්ත ධාතුව මත සිත එකඟ කිරීම යන ක්‍රියාවලිය තුළින් ඊළඟ මාර්ගඵලයට අදාළ සමාපත්තියට සමවැදීමට හැකියාව ඇත. ඒ මතය විසුද්ධිමාර්ග කතුවරයාගේ නිර්දය විවේචනයට ලක්ව ඇතත් මූලික සූත්‍ර අනුව කිසිදු මාර්ගඵලයක් නොලද අයකුට වුව අනුක්‍රමයෙන් සමාධිය ගැඹුරු කරමින් නිරෝධ සමාපත්තියට සමවැදිය හැකි බව පැහැදිලිය. ඒ අනුව විසුද්ධිමාර්ග කතුවරයා මූලික බුදුදහමේ විශාරදයකු නොවන බව පෙනෙයි.

විමුක්ති මාර්ගයෙහි අනිමිත්ත චේතෝවුමික්තියට සමවැදීම සඳහා සරල අභ්‍යාස විධියක් යෝජනා කර ඇත. එම අභ්‍යාස විදිය මෙසේය:

01. සංස්කාරයන්ගේ අනිත්‍ය ස්වභාවය සිතට අරමුණු කරගන්න.

02. සංස්කාරයන් නැතහොත් අරමුණු සිතෙන් ස්පර්ශ නොකර සිටීමට උත්සාහ කරන්න.

03. සංස්කාරයන්ගේ දුක්ඛ ලක්ෂණය මුල් කර ගනිමින් දුකට පෙරළෙන්නා වූ සංස්කාරයන් නොමෙනෙහි කර සිටින්න.

04. ආත්ම ස්වභාවයක් නැති සංස්කාරයන් නොමෙනෙහි කරමින් සිටින්න.

05. සංස්කාරයන් මම නොවේය. මාගේ නොවේය යන දැනුම ඇතිව සිටින්න.



CS Scanned with CamScanner

06. කාම රූප අරූප යන භව තුනෙහිම ඇල්ම රහිතව වෙසෙන්න.

07. විඤ්ඤාණස්ථිති සතෙහිද සත්තාවාසයන් නවයෙහිද ගති (උත්පත්ති) පහේද ඇල්ම දුරු කර සිටින්න.

නිරය තිරිසන් යෝනිය ප්‍රේත යෝනිය මනුෂ්‍ය ගතිය දේව ගතිය යන උත්පත්ති ස්ථාන පහ පංච ගතිය නම් වේ. විඤ්ඤාණස්ථිතීන් යනු විඤ්ඤාණය ප්‍රකටව පවත්නා ස්ථාන සතයි. සත්තාවාසයන් යනු සත්වයන් වාසය කරන සැප සහිත ස්ථාන නවයකි.

මෙයාකාරයෙන් සිත සියලු සංස්කාරයන්හි නොඇලී තබාගෙන සිටින කල කිසිදු අරමුණක් මත සිත නොඇලෙන උපශාන්ත සමාධියක් එළඹෙයි. ඒ සමාධිය හැකිතාක් ප්‍රගුණ කරන්න. මෙම තත්වය අනිමිත්ත චේතො විමුක්තියයි.

විසුද්ධි මාර්ගයෙහිද ඵල සමාපත්තිය ගැන විස්තර කර ඇත. දැන් අපි විසුද්ධි මාර්ගයෙහි ඵල සමාපත්ති විස්තරය වෙත හැරෙමු.

විසුද්ධි මාර්ගයේ කියවෙන පරිදි ආර්ය ඵලයෙහි නිරෝධයෙහි අර්පණාව පිහිටමින් සිදුකරන සමාපත්තිය ඵල සමාපත්තියයි. සියලුම ආර්යයෝ ඵල සමාපත්තියට සමවදින බව විසුද්ධි මාර්ග කතුවරයා කියතත් එම කරුණ සූත්‍ර පිටකයේ හා අභිධර්මයේ එන ඉගැන්වීම් සමඟ නොපෑහෙයි. ඉහළ මාර්ගඵලයන්හි සිටින අය පහළ ඵලවලට සම නොවදින බවත් පහළ ඵලයන්හි සිටි අය ඉහළ ඵලයන්හි සමාපත්තියට සම නොවදින බවත් විසුද්ධිමාර්ග කතුවරයා කියයි. මාර්ගඵල ලාභීන් තමන් ලද ඵලයට අනුරූප සමාපත්තියට පමණක් සමවදින බව විසුද්ධිමාර්ගයෙහි දැක්වෙයි. දැන් අපි විසුද්ධිමාර්ගයේ එන ක්‍රමයට ඵල සමාපත්තියට සමවදින ආකාරය ප්‍රවේසමෙන් අධ්‍යයනය කරමු.



Scanned with CamScanner

ඵල සමාපත්තියට සමවැදීම සඳහා කරුණු දෙකක් මුල් වෙයි. (හේතු වෙයි) නානා අරමුණු නොමෙනෙහි කිරීම හා නිවන පමණක් අරමුණු කර ගැනීම එම කරුණු දෙකයි.

ඵල සමාපත්තියට කරුණු දෙකක් ප්‍රත්‍ය වෙයි. නානා අරමුණු නොමෙනෙහි කිරීම, නිවන පමණක් අරමුණු කර ගැනීම හා ඵල සමාපත්තියට සමවැදීමේ ක්‍රමය ඵල සමාපත්තිය රඳා පැවතීමට ප්‍රත්‍ය වෙයි.

ඵල සමාපත්තියට සමවැදීමට කැමති මාර්ගඵල ලාභියා හුදෙකලාව විවේකීව සංස්කාරයන්ගේ ඉපදීම හා නැස්ම හෙවත් උදයව්‍යය බැලීම කළ යුතුය.

යෝගියා මෙලෙස අභ්‍යාස කරන කල්හි සංස්කාරයන් අරමුණු කොට ගෝත්‍රභූ නම් ඥානය ඉපිද අනතුරුව නිවන අරමුණු කරමින් ඵල සමාපත්තිය උපදියි. සෝවාන් ඵලලාභියා ඵල සමාපත්තියට සමවැදීම් ක්‍රමයෙන් සකෘදාගාමීඵලයට පැමිණෙයි යනාදී විග්‍රහයක් අභයගිරිවාසීන් විසින් පිළිගෙන ඇතත් එය න්‍යායවිරෝධී බව විසුද්ධි මාර්ග කතුවරයා පවසයි. මන්ද යත් ඵල සමාපත්තියට පරිකර්ම කරන අවස්ථාවේ ඵලය මිසක මාර්ගය නූපදින බැවිනි.

ඵල සමාපත්තියේ පැවැත්ම පිණිස කරුණු තුනක් ඉවහල් වෙයි. (ප්‍රත්‍ය වෙයි.) සියලු නිමිති නොමෙනෙහි කිරීම, අනිමිත්ත ධාතුව හෙවත් නිවන අරමුණු කර ගැනීම, සමාපත්තියට සමවැදීමට පෙර කාලය පිරිසිඳ ගැනීම එම ප්‍රත්‍ය තුනයි. අසවල් වේලාවට (නැතහොත් අසවල් වේලාවකින්) සමාපත්තියෙන් නැගී සිටිමි යනුවෙන් සමාපත්තියට සමවැදීමට පෙර අදිටන් කර ගැනීම අවශ්‍ය වෙයි.

ඵල සමාපත්තියෙන් නැගී සිටීම පිණිස කරුණු දෙකක් ප්‍රත්‍ය වෙයි. නානා නිමිති මෙනෙහි කිරීම හා නිවන අරමුණු නොකිරීම ඒ කරුණු දෙකයි. මෙහි නානා නිමිති යනු රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ යන දේය. මෙයාකාරයෙන්



Scanned with CamScanner

කිසියම් නිමිත්තක් භවාංග චිත්තයට අරමුණු වූ කල්හි එය මෙනෙහි කිරීමෙන් ඵල සමාපත්තියෙන් නැගී සිටීම සිදුවෙයි.

කෙසේ නමුත් ප්‍රායෝගිකව අනිමිත්ත චේතෝවිමුක්තියට එළඹීම සඳහා මෙතරම් දීර්ඝ මාවතක් අනුගමනය කළ යුතු නැත යන්න ප්‍රායෝගික අත්දැකීම් ඇසුරෙන් පෙන්වා දිය හැකිය.

කය නිසල කර සියලු නිමිති නොමෙනෙහි කිරීම තුළින් සිත සමාධිමත් කරගෙන අනිමිත්ත චේතොවිමුක්තියට එළඹීමට හැකිය. එය පියවරෙන් පියවර කළ යුතු දෙයක් නොවන අතර නිරායාසයෙන් මනසෙහි ඇතිවන තත්වයකි. මහායෝගී මිලාරෙපා පෙන්වා දී ඇති පරිදි අනිමිත්ත චේතොවිමුක්තියට පැමිණීම භාවනා නොකර භාවනා කිරීමකි. මන්දයත් කිසිදු අභ්‍යාසයක් නොකර කිසිදු අරමුණක් නොගෙන සිත එහි මූලික ස්වරූපයේ රැඳෙන්නට හැරීම තුළින් මෙකී ඵල සමාපත්තියට පහසුවෙන් එළඹීමට හැකි බැවිනි. මාර්ගඵල ලාභීන්ගෙන් සැලකිය යුතු පිරිසකට සුළු උත්සාහයක් දරා මාර්ගඵල සමාපත්තියට එළඹිය හැකිය.



CS Scanned with CamScanner

CS Scanned with CamScanner

ඉරිදා දිවයින පුවත්පතේ පළවූ ආන්දෝලනාත්මක භාවනා ලිපි පෙළ



භාවනාව සහ මාර්ගඵල
පිළිබඳ නිවැරදි විස්තර ඇතුළත් අත්පොත

# සම්මා සමාධි

නීතිඥ නිලන්ත හෙට්ටිගේ


සුසර ප්‍රකාශකයෝ
LG.180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
Tele : 0112 430721 Fax : 0112 334597
E-mail : susarapub@gmail.com
Printed & Compiled by: Susara Printers, No:338/A, Gonahena, Kadawatha.
www.susarapublication.lk www.facebook.com/susarapublications Rs. 200.00



RS. 200.00
Samanala 467
00029766-1
Samma Samadhi
12/19
BB120
Scanned with CamScanner